# 2

# සංවර්ධන සහයෝගීතාවය සඳහා විදේශ ආධාර ව්‍යාපෘති

## 2.1 යටිතල පහසුකම් සංවර්ධනය



### මහාමාර්ග හා පාලම්


## 2.1.1. මහාමාර්ග සහ පාලම්

ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්‍රමයේ ප්‍රධාන තැන හිමිවනුයේ මාර්ග ප්‍රවාහනයයි. සියළුම පොදු ප්‍රවාහන මාධ්‍යයන් යටතේ කරනු ලබන මගී සැතපුම් වලින් 85% ක දායකත්වයක් ලබා දෙනුයේ මාර්ග ඔස්සේ ප්‍රවාහනය කිරීමටය. පසුගිය වසර කිහිපය තුල වාහන සංඛ්‍යාවෙහි සැළකියයුතු වැඩිවීමක් සිදුවී ඇත. යතුරුපැදි, කුඩා බස්රථ, ලොරි හා ඉඩම් වාහන ආනයනයෙහි සැළකිය යුතු වර්ධනයක් වාර්තා වී ඇත. කොළඹ නගරය තුල ඇතැම් මාර්ගයන්හි මෙන්ම, කොළඹ නගරයට තදාසන්න උප නගර වල හා ප්‍රධාන නගරයන්හි අධික වාහන සංඛ්‍යාවක් ධාවනය වේ. "A", "B", "C", "D" සහ "E" වශයෙන් මාර්ග වර්ගීකරණය කර ඇත. "A" පන්තියේ මාර්ග, අගනුවර හා පරිපාලන දිස්ත්‍රික්කයන්හි ප්‍රධාන නගර සමඟ සම්බන්ධ කෙරෙන මාර්ග වේ. "B" පන්තියේ මාර්ග ප්‍රධාන නගර හා එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයන්හි ප්‍රධාන නගර සමඟ සම්බන්ධ වන මාර්ගය වන අතර එම මාර්ග "A" පන්තියේ ප්‍රධාන මාර්ග පද්ධතිය හා සම්බන්ධ කෙරෙන මාර්ග වේ. "C" පන්තියේ මාර්ග කෘෂිකාර්මික හා ප්‍රාදේශීය මාර්ග වැනි කුඩා මංමාවත් වේ. "D" පන්තියේ මාර්ග බොරළු සහිත ඒවා වේ. "E" පන්තියේ මාර්ග, ධාවනයට නුසුදුසු එහෙත් ජීප් රථ පමණක් ධාවනය කළ හැකි මාර්ග වේ. ශ්‍රී ලංකාවේ සමස්ථ මාර්ග පද්ධතියට කි. මී. 108,000 ක් අයත් වේ. එයින් ජාතික මාර්ග පද්ධතියට "A" සහ "B" පන්තියේ මාර්ග, මීටර් 11,650 ක් හා පාලම් 3,700 ක් අයත් එම මාර්ග, මාර්ග සංවර්ධන අධිකාරිය යටතට අයත්වේ. "C", "D" සහ "E" පන්තියේ පළාත්බද මාර්ග කිලෝ මීටර් 16,530 ක් හා ප්‍රාදේශීය සභා යටතට ගැනෙන කිලෝ මීටර් 64,000 ක මාර්ග ප්‍රාදේශීය අධිකාරීන් යටතේ වේ.

(අ) ප්‍රධාන නගරයන්හි මෙන්ම නාගරික ප්‍රදේශයන්හි මාර්ග දෙපස උග්‍ර සංවර්ධන කටයුතු හේතුවෙන් ධාරිතාව අඩුවීම (ආ) ගුණාත්මක භාවයෙන් හීන ධාවන විලාශය (ඇ) දුර්වල මෙන්ම පටු පාලම් සහ දුර්වල පිවිසුම් හා සමමිතික නොවූ පාලම් (ඈ) ගංගා සහ වෙනත් ජල ධාරා හරහා දිවෙන පාලම් පාරු මගින් සම්බන්ධිත පහත් මට්ටමේ මාර්ග, මාර්ග පද්ධතියේ විශාල අඩුපාඩු වශයෙන් හඳුන්වා දිය හැක.

පසුගිය වසර කිහිපය තුල රටේ සංවර්ධනයත් සමඟ ඇතිවූ ආර්ථික ක්‍රියාකාරකම් හේතුකොට ගෙන භාණ්ඩ මෙන්ම මගී ප්‍රවාහනය සඳහා දැඩි ඉල්ලුමක් පවතී. මාර්ග ජාලයේ පවතින තත්වය හා ප්‍රමිතීන් සීඝ්‍රයෙන් ඉහල යන ඉල්ලුම සපුරාලීමට යෝග්‍ය නොවේ. මාර්ග පද්ධතියේ පවතින දුර්වලතා රටේ ප්‍රගමනය කෙරෙහි පවතින විශාලතම බාධකය වශයෙන් හඳුනාගෙන ඇත. මහ කොළඹ ප්‍රදේශයේ ප්‍රවාහන තදබදය අවම කිරීම මෙන්ම පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රධාන නගර අතර බාධා රහිත සීඝ්‍ර ප්‍රවාහන පද්ධතියක් ඇති කිරීම මගින් ආර්ථික වර්ධනය හා සංවර්ධන අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීමෙහිලා බෙහෙවින් ඉවහල් වේ. ජනගහනයෙන් 72% ක් පමණ ග්‍රාමීය ප්‍රදේශ වල වෙසෙන බැවින් ඔවුන්ගේ ආර්ථික සහ සමාජ තත්වයන් වර්ධනය කර ගැනීමෙහිලා හොඳ මාර්ග පද්ධතියක් අවශ්‍ය වේ. මාර්ග යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සමානාත්මක ප්‍රාදේශීය වර්ධනයට දායක වනු ඇත. මාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම රජය හඳුනාගෙන ඇති අතර රජය මගින් ඒ සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් ලබාදී ඇත.

# දැනට ක්‍රියාත්මක වන සහ නව ව්‍යාපෘති - 2007



# දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය



දක්ෂිණ අධිවේගී මාර්ගය, යෝජිත අධිවේගී මාර්ග ජාලය අතුරින් දීර්ඝතම අධිවේගී මාර්ගය වන අතර එය ප්‍රවේශයන් සීමා කර ඇති ප්‍රථම අධිවේගී මාර්ගය ද වේ. කොළඹ සිට දකුණු ප්‍රදේශය දක්වා ඉදි කෙරෙන මං තීරු හතරකින් යුතු මෙම අධිවේගී මාර්ගය තුලින් දකුණුලක ප්‍රදේශයේ ආර්ථික හා සමාජීයිය සංවර්ධනයට ඉවහල් වන කර්මාන්ත හා සේවා, එනම් ධීවර, කෘෂි සහ සංචාරක යන කර්මාන්ත දිරිගැන්වෙන අතර අන්තර් කලාපීය ගමනාගමන ප්‍රවර්ධනය තුළින් දකුණු පළාතේ අනාගත දියුණුවට මහගු දායකත්වයක් ලබාදෙයි.

කොළඹ - මාතර මහා මාර්ගයේ දැනට පවතින මාර්ග තදබදය අඩු කිරීමටත්, අධිවේගී මාර්ගයේ හුවමාරු ස්ථාන 11 ක් ආශ්‍රිතව පිහිටි නගරයන් ආර්ථික මධ්‍යස්ථාන වශයෙන් සංවර්ධනය කිරීමටත්, ප්‍රදේශයේ ඉඩම් හා දේපළවල වටිනාකම ඉහළ නැංවීමට මෙන්ම දකුණු ප්‍රදේශයට ගමනාගමනය සඳහා ගතවන කාලය අවම කර ගැනීමටත් මෙම අභිනව අධිවේගී මාර්ගය පිටුවහලක් වේ. මාර්ග ආරක්ෂාව පිළිබඳ සංකල්ප ද, මෙම අධිවේගී මාර්ගය ඉදි කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී සැලකිල්ලට ගෙන ඇත.



ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2003 ජනවාරි මස ආරම්භ කරන ලද අතර අධිවේගී මාර්ගය 2010 දී වාහන ගමනා ගමනය සඳහා විවෘත කිරීමට අපේක්ෂා කෙරේ.

අධිවේගී මාර්ගයේ කොට්ටාව සිට කුරුඳුගහහැතැක්ම දක්වා වන මාර්ග කොටස ඉදිකිරීමද ඇතුලුව, මාතර සිට කොට්ටාව දක්වා වූ මුළු මාර්ගයේම මාර්ගය භාවිතා කිරීම වෙනුවෙන් වූ ගාස්තු අය කිරීම සඳහා අවශ්‍ය ටොල් (Toll) පද්ධතිය ස්ථාපනය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය සඳහා මූල්‍ය අනුග්‍රහය ජපන් රජය විසින් දරණ අතර කුරුඳුගහහැතැක්ම සිට මාතර (ගොඩගම) දක්වා වන මාර්ග කොටස ඉදිකිරීම ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය අනුග්‍රහය මත සිදු කෙරේ.

## මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - කොළඹ පිටත වට රවුම් මාර්ගය

දැනට කොළඹ නගරයේ පවතින අධික රථවාහන තදබදයට පිළියමක් ලෙස සහ අනකුත් ප්‍රදේශ සමග සම්බන්ධතාව වැඩි දියුණු කිරීම මෙන්ම ආර්ථික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම අරමුණු කරගත් මෙම ව්‍යාපෘතිය මගින්, යෝජිත අධිවේගී මාර්ගයත් සහ තවත් ප්‍රධාන මාර්ග හතක් සම්බන්ධ කෙරෙමින්, කොළඹ පිටත වට රවුම් මාර්ගයක් ඉදි කෙරේ.

සීමිත ප්‍රවේශයක් ඇති මෙම අධිවේගී මාර්ගය මුල් අවස්ථාවේදී මං තීරු 4 කින් යුක්ත වන අතර එය පසු කාලීනව මං තීරු 6 ක් දක්වා පුළුල් කළ හැකිය. බාහිර පුද්ගලයන් හා සතුන් පැමිණීම වැළැක්වීම සඳහා අධිවේගී මාර්ගය දෙපස වැටකින් ආවරණය කර ඇති අතර, අවශ්‍ය ස්ථානයන්හි සේවා මාර්ග වලින් ද, අනිකුත් අධිවේගී මාර්ග සහ මහා මාර්ග සම්බන්ධ කිරීමට භුවමාරු සන්ධිස්ථාන සහ උමං හා ගුවන් මාර්ග සහිතවද මෙම මාර්ගය ඉදි කෙරේ. කොට්ටාවේදී දක්ෂිණ අධිවේගී මාර්ගය ද, කෙරවළපිටියේදී කොළඹ - කටුනායක අධිවේගී මාර්ග ද, සම්බන්ධවන පරිදි මෙම මාර්ගය ඉදිකරනු ලැබේ.

කොට්ටාව සිට කඩුවෙල දක්වා වූ මාර්ග කොටසෙහි සවිස්තරාත්මක සැලසුම් 2005 වසරේදී නිම කරනු ලැබූ අතර, කඩුවෙල සිට කඩවත දක්වා වූ මාර්ග කොටසෙහි සවිස්තරාත්මක සැලසුම් ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (JICA) විසින් පිළියෙල කරන අතර, ඊට සමගාමීව ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී.

කොට්ටාව සිට කඩුවෙල දක්වා වන කිලෝ මීටර 12 ක මාර්ග කොටස ඉදිකිරීම වෙනුවෙන් ඩොලර් මිලියන 186 ක ණය මුදලක් මේ වන විටත් ජපන් රජය විසින් ලබා දී ඇති අතර කඩුවෙල සිට කඩවත දක්වා වන මාර්ග කොටස සඳහා අවශ්‍ය වන අරමුදල් 2008 වසරේදී ලබා දීමට නියමිතය. කඩවත සිට කෙරවලපිටිය දක්වා වන මාර්ග කොටස ශ්‍රී ලංකා රජයේ අරමුදල් උපයෝගී කර ගනිමින් නිම කිරීමට අපේක්ෂිතය.

කොට්ටාව සිට කඩුවෙල දක්වා වන මාර්ග කොටසේ ඉදිකිරීම් කටයුතු 2007 වසර අවසානයට පෙර ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින අතර කොට්ටාව සිට කඩවත දක්වා වන මාර්ග කොටස 2010 වසරේදී නිම කිරීමට අපේක්ෂිතය.

## මාර්ග ආංශික ආධාර ව්‍යාපෘතිය

මාර්ග ආංශික ආධාර ව්‍යාපෘතිය මගින් ජාතික මෙන්ම පළාත්බද මාර්ග ජාලයේ දීර්ඝකාලීනව අතපසු වී ඇති නඩත්තු අවශ්‍යතා රැසකට විසඳුම් ලබා දෙයි. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ මාර්ග උපයෝගී කරගන්නන් මෙන්ම සමස්ථයක් වශයෙන් ශ්‍රී ලාංකීය ජනතාවගේම අවශ්‍යතා සපුරාලන කාර්යක්ෂම මෙන්ම තිරසාර මාර්ග පද්ධතියක් ලබා දීම තුළින් ප්‍රවාහන වියදම් අවම කිරීමය. මාර්ග පද්ධතිය අඛණ්ඩවම නඩත්තු කිරීම, වාහන මෙහෙයුම් පිරිවැය අවම කිරීමට සහ මගී ආරක්ෂාව වැඩි දියුණු කිරීමට හේතු වේ.

මාර්ග වැඩි දියුණු කිරීම තුළින් ප්‍රවාහන කළමනාකරණය පාරිසරික ගැටළු හා නොසන්සුන් ස්වභාවය යනාදියට ද විසඳුම් ලැබේ. මෙම ව්‍යාපෘතිය යටතේ මතු දැක්වෙන

මාර්ගවල පවතින ව්‍යුහය සීමිතව පුළුල් කොට දැනට පවතින පදික වේදිකා ශක්තිමත් කිරීම තුළින් ජාතික මාර්ග වැඩි දියුණු කෙරෙනු ඇත.





| මාර්ගය | දුර (කි.මී.) |
|---|---|
| ඉංගිරිය- රත්නපුර | 34 |
| නිට්ටඹුව- මහනුවර | 75 |
| හාලිඇල - බණ්ඩාරවෙල | 22 |
| බණ්ඩාරවෙල- වැලිමඩ | 20 |
| ගාල්ල - දෙනියාය - අකුරැස්ස | 68 |
| දෙනගම- මුලටියන හා හක්මන - තලහන්දුව | 23 |
| මැදවච්චිය- පූනෑව සහ මැදවච්චිය- උතුරු මැද පළාත් මායිම | 23 |
| වැල්ලවාය - සියඹලාන්ඬුව | 70 |
| සියඹලාණ්ඩුව - අම්පාර, අම්පාර - කාරතිව් | 78 |
| මරදන්කඩවල- ජයන්තිපුර | 60 |
| ජයන්තිපුර - තිරුක්කොණ්ඩෙය්මඩු | 68 |
| පාදෙනිය- පුත්තලම | 62 |

තව ද ඌව, දක්ෂිණ, හා උතුරු මැද පළාත් ප්‍රාදේශීය සභා 9 ක මාර්ග කිලෝ මීටර් 160 ක් සහ කුඩා පාලම් ද මෙම ව්‍යාපෘතිය යටතේ වැඩි දියුණු කරනු ලැබේ. පළාත්බද මාර්ග වල තවත් කිලෝ මීටර් 450 ක් වන ප්‍රමාණයක මූලික ඉංජිනේරු නිර්මාණ හා ශක්‍යතා අධ්‍යයන කටයුතු කරනු ලැබේ.

## මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය අනුග්‍රහය මත ක්‍රියාත්මක වන මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ කිලෝ මීටර් 274 ක පමණ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමටත්, පාලම් 42 ක් නැවත සකස් කිරීම / ශක්තිමත් කිරීම / පුළුල් කිරීමටත් බලාපොරොත්තුවේ. අතිරේක වැඩ කොටස්ද සමඟින් ආසියානු සංවර්ධන බැංකුව අනුමත කල සැලසුම් ඉක්මවා යමින් ව්‍යාපෘතිය අවසන් වන විට කිලෝ මීටර් 311.4 මහාමාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමටත්, පාලම් 77 ක් නැවත ඉදිකිරීමට හා පුළුල් කිරීමටත් අපේක්ෂිතය.

කටුගස්තොට - කුරුණෑගල (A-10) මාර්ගය හැර මෙම ව්‍යාපෘතිය යටතේ සම්පූර්ණ කිරීමට ඉලක්ක ගත සියලුම මාර්ගවල සංවර්ධන කටයුතු ව්‍යාපෘතිය අවසන් වීමට නියමිත 2008 වර්ෂය අගදී නිමා කිරීමට බලාපොරොත්තු වේ.



**ව්‍යාපෘතිය යටතේ නිමකර ඇති පැල්මඩුල්ල- මාදම්පේ මාර්ගය**

ඇ. එ. ජ. ඩොලර් මිලියන 27 ක මූල්‍යාධාර මත මෙම ව්‍යාපෘතිය යටතේම ගම්පොළ - නාවලපිටිය මාර්ගය හා රම්බොඩ උමං මාර්ගය ඇතුළුව ගම්පොළ - නුවරඑළිය මාර්ගයේ වැඩ මේ වන විට අවසන්කර ඇත.

## මඩකලපු – ත්‍රිකුණාමලය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ මඩකලපුව ත්‍රිකුණාමලය මාර්ගයේ කින්නියා තොටුපල හරහා මීටර් 400 ක දිගකින් යුත් පාලමක් ඉදිකරනු ඇත. මීට අමතරව පිවිසුම් මාර්ග දෙකක් වන කිලෝ මීටර් 18 ක දිගකින් යුත් මඩකලපුව ත්‍රිකුණාමල මාර්ගයේ උප්පාරු සිට හතර වන සැතපුම් කණුව දක්වා සහ තම්පලාකාමම් - කින්නියා මාර්ගයේ කිලෝ මීටර් 15.6 ක් වැඩි දියුණු කෙරෙනු ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල සෞදි රියාල් මිලියන 40 ක (දළ වශයෙන් රුපියල් මිලියන 1100 ) ක (ඇ. ඩො. මිලියන 11 ක) සහනදායි ණය ආධාරයක් ලබාදී ඇත.

මඩකලපු - ත්‍රිකුණාමලය නගර සම්බන්ධ කිරීම සඳහා ප්‍රධාන බාධකයක්ව පැවතියේ කොට්ටියාර් මුහුදු බොක්කේ පවතින කින්යා තොටුපලයි. මෙම තොටුපල දිගින් මීටර් 550 වන අතර දැනට තොටුපල හරහා ඇති එකම ප්‍රවාහන මාධ්‍ය වනුයේ යාන්ත්‍රික බෝට්ටු සේවයයි. මුහුදු බොක්ක අවට පිවිසුම් ගම් හතරක වෙසෙන 60,000 ක පමණ පිරිසකට කින්නියා තොටුපල සේවය සලයසි. එසේම 6000 ක පමණ පිරිසක් සහ වාහන 200 ක් පමණ දිනපතා මෙම බෝට්ටු සේවය භාවිතා කරනු ලබයි.




ඉදිකිරීම් කටයුතු කරමින් පවතින තම්පලාකාමම් කින්නියා මාර්ගය

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම තුලින් නැගෙනහිර පළාතේ ප්‍රදේශවාසීන්ට ඉමහත් සෙතක් සැලසෙන අතර දැනට ව්‍යාපෘතියෙන් සියයට 30 ක පමණ වැඩ කටයුතු සම්පූර්ණ කර ඇත. මෙම ව්‍යාපෘතිය 2009 වන විට සම්පූර්ණයෙන් නිම කිරීමට අපේක්ෂිතය.



ඉදිකිරීම් කටයුතු කරමින් පවතින කින්නියා පාලම

## බලංගොඩ බණ්ඩාරවෙල මාර්ගය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ බෙරගල හරහා කිලෝ මීටර් 57 කින් යුත් බලංගොඩ බණ්ඩාරවෙල මාර්ගය වැඩි දියුණු කිරීමයි. මෙම ව්‍යාපෘතියට කිලෝ මීටර් 40 කින් යුත් කොළඹ රත්නපුර වැල්ලවාය මඩකලපු මාර්ගයේ බලංගොඩ බෙරගල මාර්ගය සහ කිලෝ මීටර් 17 කින් යුත් බෙරගල - හාලිඇල මාර්ගය ඇතුලත්වේ. මෙම ව්‍යාපෘතිය 2005 පෙබරවාරි මස ආරම්භ වූ අතර 2008 මාර්තු අවසන් කිරීමට නියමිතය. ව්‍යාපෘතිය සඳහා කොරියානු රජය ඇමෙරිකානු ඩොලර් මිලියන 17.6 ක සහණදායි ණය ආධාරයක් ලබාදී ඇති අතර මුළු ව්‍යාපෘතියේ 70% ක් පමණ දැනට නිම කර ඇත.



ඉසිකිරීම් කටයුතු නිම වෙමින් පවතින බලන්ගොඩ බණ්ඩාරවෙල මාර්ගය

## අරුගම්බේ පාලම

නැගෙනහිර වෙරළෙහි පිහිටි අරුගම්බේ නව පාලම ශත වර්ෂයක පැවැත්ම සඳහා නිර්මාණය කර ඇති අතර සුනාමියෙන් විනාශ වූ පැරණි පාලම වෙනුවට ඉදි කෙරෙන්නෙකි. ඇමෙරිකා එක්සත් ජනපද රජය ස්වකීය සුනාමි සහන හා පුනරුත්ථාපන වැඩසටහන යටතේ ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ එක්සත් ජනපද නියෝජ්‍යායතනය (USAID) මඟින් මෙම ව්‍යාපෘතිය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 11 ක ප්‍රදාන ලබා දෙයි. ඇමෙරිකා එක්සත් ජනපදයෙහි බහුලව දක්නට ලැබෙන නමුත් ශ්‍රී ලංකාවෙහි මෙතෙක් හඳුන්වා දී නැති වානේ බාල්ක සහ කොන්ක්‍රීට් පැනල භාවිතයෙන් පාලම නිර්මාණය කර ඇත. දැනුම සහ තාක්ෂණය ලබා දීම ඉදි කිරීම් ක්‍රියාවලියෙහි එක් කොටසක් වන අතර රජය මෙන්ම දේශීය කොන්ත්‍රාත් කරුවන්ද පිරිවැය කාර්යක්ෂම නිර්මාණ පිළිබඳව දැන ගැනීමට උනන්දුවක් දක්වා ඇත. පැරණි පාලමට සමාන්තරව ඉදි කෙරෙන මෙය මීටර් 160 ක පාලමකින් ද මීටර් 25 ක පාලමකින් සහ ප්‍රවේශ මාර්ගයන්ගෙන් සමන්විත වේ. ශත වර්ෂයක ජීව කාලයක් සහිත නිර්මාණ සැලැස්ම කෙටි ඉදි කිරීම් කාලයක් ද ඉදි කිරීමේදී ඇති වන බාධකන්ට ඔරොත්තුදීමේ හැකිවෙන් ද යුක්ත වන අතර උසස් තත්වයේ අංගෝපාංගයන්ගෙන් යුතු අඩු නඩත්තු පිරිවැයක් අවශ්‍ය වන සහ ආරක්ෂිත පදික වේදිකා වැනි පරිශීලක හිතකාමි ලෙස නිර්මාණය කර ඇත. ඔක්තෝබර් 1 වන විට සිරස් ආධාරක කුළුණු සවි කර ඇති අතර 2008 මාර්තු වන විට ව්‍යාපෘතිය නිම කිරීමට නියමිතයි.



අරුගම්බේ නව පාලම නිම කිරීමෙන් පසු

## මනම්පිටිය නව පාලම

මහවැලි ගඟ හරහා නව පාලමක් මනම්පිටියේදී ඉදිකිරීම සඳහා ඇ. ඩොලර් මිලියන 10 ක ප්‍රදානයක් ජපාන රජය විසින් ලබා දී ඇත.

වර්ෂ 1992 දී ඉදි කරන ලද පැරණි පාලම, දුම්රිය හා මහා මාර්ගය සඳහා පොදුවේ භාවිතා වන බැවින් දුම්රියක් පාලම පසු කරන අවස්ථාවේදී මහා මාර්ගයේ දැඩි රථ වාහන තදබදයක්

ඇති කරයි. නව පාලම ඉදි කිරීමෙන් නැගෙනහිර පළාතට ලඟාවීම සඳහා ඇති ප්‍රධාන ප්‍රවේශ මාර්ගය වන A - 11 මාර්ගයේ මනා රථ වාහන ගමනාගමනයක් සහතික කරන අතර පොළොන්නරුව සහ මඩකළපුව දිස්ත්‍රික්ක හා ඒ අවට වාසය කරන පවුල් 904,000 ආසන්න ප්‍රමාණයකට සෘජුවම ප්‍රතිලාභ සැලසේ. මෙම පාලම මීටර් 302 ක දිගකින් යුක්ත වන අතර පළල මීටර් 10.4 ක් වේ.

පාලමේ ඉදිකිරීම් කටයුතු දැනටමත් අවසන් කර ඇති අතර 2007 ඔක්තෝම්බර් මාසයේ අවසානය වන විට වාහන ගමනාගමනය සඳහා විවෘත කිරීමට අපේක්ෂිතය.



මනම්පිටිය නව පාලම

## මන්නාරම නව පාලම සහ වෙරළබඩ සපත්තු පාලම ඉදි කිරීම

මන්නාරම දූපත සහ ප්‍රධාන ගොඩබිම යා කෙරෙමින් ඉදි කිරීමට යෝජිත මන්නාරම නව පාලම සහ ර්ට සම්බන්ධ වෙරළබඩ සපත්තු පාලම වැඩි දියුණු කිරීම සඳහා ජපාන රජය විසින් ඇ. ඩොලර් මිලියන 16 පමණ (ජපන් යෙන් මිලියන 1,836) ක ප්‍රදානයක් ලබා දී ඇත.

මන්නාරම් දූපත හා සම්බන්ධ කෙරෙමින් දැනට පවතින පාලම හා ර්ට සම්බන්ධ වෙරළබඩ සපත්තු පාලම 1930 වර්ෂයේදී පමණ ඉදිකරන ලද්දක් වන අතර එය මං තීරු එකකින් සමන්විත පටු මාර්ගයක් වන බැවින් වාහන ගමනාගමනය එක් ධාවන තීරුවකට සීමා වී ඇති මෙය මන්නාරම් දූපතට ප්‍රවේශ විය හැකි එකම ගොඩබිම් මාර්ගය වේ. නව පාලම මීටර් 157 ක දිගකින් හා පළල මීටර් 10 කින් යුක්ත වන අතර මැදවච්චිය, මන්නාරම - තලෙයිමන්නාරම (A 4) මාර්ගයේ කිලෝ මීටර් 3 ක පමණ දිග වෙරළබඩ සපත්තු පාලම මීටර් 11 ක පළලකින් යුක්තව වැඩි දියුණු කිරීමට අපේක්ෂිතය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් මන්නරම් දූපතේ වාසය කරන 40,000 පමණ වන ජනතාවට සෘජුවම සෙත සැලසෙන අතර අඩු වියදමකින් විධිමත් ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමට අවස්ථාව

ලැබීම හේතුවෙන් වෙළඳපොළ පිවිසුම් අවස්ථාද වැඩි දියුණු වේ.

යෝජිත මන්නාරම පාලම

## නුගේගොඩ මංසන්ධියේ පියාසර පාලම , වැලිකඩ ශ්‍රී ජයවර්ධනපුර - කොල්ලුපිටිය මාර්ගය හා නාවල - රාජගිරිය මාර්ගයේ සංඥාගත මංසන්ධිය ඉදිකිරීම සහ කොළඹ නුවර පාරේ කිරිබත්ගොඩ සිට කඩවත දක්වා මාර්ගය වැඩිදියුණු කිරීම - ඇ. ඩො. මිලියන 10 (ප්‍රදාන)

චීන රජය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආධාර ප්‍රදාන සපයයි. කොළඹ හා තදාසන්න ප්‍රදේශවල හඳුනාගත් මාර්ග සංඥාගත මංසන්ධීන්හි ඇති වන වාහන ගමනාගමන ප්‍රමාදයන් අවම කිරීමට සහ වාහන තදබදය හා රිය අනතුරු අඩුකිරීමටත් මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය උප ව්‍යාපෘති තුනකින් සමන්විත වේ. (අ) නුගේගොඩ මංසන්ධියේ හයිලෙවල් පාරේ පියාසර පාලම ඉදිකිරීම (ආ) ශ්‍රී ජයවර්ධනපුර - කොල්ලුපිටිය මාර්ගයේ සහ නාවල රාජගිරිය මාර්ගයේ සංඥාගත මංසන්ධිය ඉදිකිරීම (ඇ) කොළඹ නුවර පාරේ කිරිබත්ගොඩ සිට කඩවත දක්වා මාර්ගය වැඩිදියුණු කිරීම.

නුගේගොඩ මංසන්ධිය, හයිලෙවල් පාරේ ප්‍රධාන මාර්ග අවහිරතාවයක් වන අතර එම මංසන්ධිය හරහා දිනකට වාහන 75000 - 100000 ක් පමණ ධාවනය කෙරේ. නුගේගොඩ මංසන්ධියේ ඉදිකිරීමට යෝජිත පියාසර පාලම ධාවන තීරු 4 කින් සමන්විත වන අතර, එමගින් ධාවන තීරු දෙකක ද්විත්ව ධාවන මාර්ගයක් තැනීමට කටයුතු කරන අතර එමගින් වාහන ගමනාගමනය පහසු වනු ඇත. ශ්‍රී ජයවර්ධනපුර - කොල්ලුපිටිය මාර්ගයේ සහ නාවල - රාජගිරිය මාර්ගයේ විශාල වාහන තදබදයක් ඇති මන්සන්ධිය වනුයේ වැලිකඩ මංසන්ධිය වන අතර, දිනකට මෙම මංසන්ධිය ඔස්සේ වාහන 71,400 ක් පමණ ධාවනය වේ. යෝජිත සංඥාගත මංසන්ධිය වාහන තදබදය අඩුකිරීම සඳහා උපකාර වනු ඇත. කිරිබත්ගොඩ සිට කඩවත මංසන්ධිය දක්වා සාමාන්‍යයෙන් දිනකට වාහන 72,000 ක් පමණ ධාවනය වන අතර, මෙම මාර්ගය පටුවීම හේතුවෙන් විශාල වාහන තදබදයක් ඇතිවේ. යෝජිත ව්‍යාපෘතිය මගින් කිරිබත්ගොඩ සිට කඩවත දක්වා දිවෙන කිලෝ මීටර 2.5 ක පමණ වන මෙම මාර්ගය ධාවන තීරු 2 ක් සහිත ද්විත්ව ධාවන මාර්ගයක් ඉදිකර වඩාත් පුළුල් කරනු ඇත. මෙම ව්‍යාපෘතිය 2010 දී නිම කිරීමට අපේක්ෂිතය.

## මාතර මහානාම පාලම ඉදි කිරීමේ ව්‍යාපෘතිය

මාතර මහනාම පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු කිරිමට හා එහි නව මං තිරු ඉදිකිරිමේ කටයුතු කිරිමට කොරියානු රජය විසින් ඇමෙරිකානු ඩොලර් මිලියන 7 ක ප්‍රදාණයක් ලබා දී ඇත. මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ මාතර මහනාම පාලමේ පවත්නා මං තිරු හතර ප්‍රතිසංස්කරණය කිරිම හා අලුතින් මං තිරු දෙකක් ඉදි කිරිම මගින් එහි ප්‍රවාහන පහසුකම් දියුණු කිරිමයි. මෙම ව්‍යාපෘතිය 2005 ආරම්භ කල අතර 2007 දී නිම කිරීමට අපේක්ෂිතය. නව මං තිරු ඉදි කිරිමේ කටයුතුවලින් සියයට 90 ක පමන වැඩ නිම කල ඇති අතර පවතින මං තිරු වැඩි දියුණු කිරිමේ කටයුතු දැනට සිදු කරමින් පවති.



ඉදි කෙරෙමින් පවතින මාතර මහානාම පාලම

# යටිතල පහසුකම් සංවර්ධනය



## විදුලිබල හා බලශක්ති

## 2.1.2. විදුලිබල හා බලශක්ති

2006 වර්ෂ අවසානයේ ශ්‍රී ලාංකීය සමස්ත ගෘහස්ථකයින්ගෙන් සියයට 74 ක් එනම් දළ වශයෙන් මිලියන 3.5 ක් පමණ සංඛ්‍යාවක් ජාතික විදුලි බල පද්ධතියට (ජාලයට) සම්බන්ධ කර ඇත. මධ්‍යම කාලීන කාර්ය රාමුවක් තුළ ජාතික බල ශක්ති ජාලකය සහ ජාලකයෙන් පරිබාහිර සැපයුම් තත්වයන් වැඩි දියුණු කිරීම තුළින් 2010 වන විට ගෘහස්ථකයින්ගෙන් සියයට 86 ක් හා 2016 වන විට ගෘහස්ථකයින්ගෙන් සියයට 95 දක්වා ජාතික විදුලි පද්ධතියට සම්බන්ධ කිරීමට අපේක්ෂා කෙරේ.


විදුලි බල අංශයේ මෙහෙයුම් කටයුතු දැනට සිදු කෙරෙමින් පවතින්නේ විවිධ සීමා කාරකයන් මධ්‍යයේය. ඒවා නම් විදුලිබල සැපයුමෙහි ගුණාත්මකභාවය, විශ්වාසනීයත්වය සහ සීමිත ධාරිතාව, ඉහළ යන බොරතෙල් මිල නිසා සිදුවන බලශක්ති ජනනයෙහි අධික පිරිවැයයි.

ජල ශක්ති ප්‍රතිජනනය මගින් ජනනය කළ හැකි බල ශක්ති ප්‍රමාණය 1995 දී සියයට 94 සිට 2005 වන විට සියයට 39 දක්වා පහළ බැස ඇති අතර 2016 වන විට මෙය තව දුරටත් සියයට 26 දක්වා පහත බැසීම අපේක්ෂා කරන හෙයින් වෙනත් විකල්ප ප්‍රභවයන්ගෙන් බල ශක්ති උත්පාදනය සඳහා ආයෝජනයන් කිරීම අවශ්‍යාව ඇත. 2005 වසරේ ලංකා විදුලි බල මණ්ඩලයේ සම්ප්‍රෙෂණ හා බෙදා හැරීම් ජාලයේ ක්ෂයවීම මුළු බල ශක්ති උත්පාදනයේ සියයට 17 ක් පමණ වන බව ගණන් බලා ඇත. බල ශක්ති බෙදා හැරීම් ජාලය අඛණ්ඩව වැඩි දියුණු කිරීම හා යල් පැනපු පාලක හා ආරක්ෂක පද්ධති වැඩි දියුණු කිරීම විදුලි සැපයීමේ විශ්වාසනීයත්වය හා ගුණාත්මකතාවය සහතික වීමෙහිලා අතිශයින් වැදගත් වන්නේය. තවද, ග්‍රාමීය ප්‍රදේශයන්ට විදුලිය ලබාදීමේ කඩිනම් වැඩ සටහන හා වාණිජ අංශයේ හා නිවාස සංවර්ධනය පුළුල් වීම හේතුවෙන් වර්ධනය වූ ඉල්ලුම සපුරාලීමට විදුලි බල අංශයේ බෙදා හැරීමේ හා සම්ප්‍රේෂණ ජාල සඳහා ඒ හා සරිලන ආයෝජනයක් සිදු කළ යුතු වේ.

මෙම තත්ත්වය යටතේ, නව ජාලක උපමධ්‍යස්ථාන ඉදිකිරීමට, පවතින ජාලක උපමධ්‍යස්ථාන උත්ශ්‍රේණිගත කිරීමට, බෙදාහැරීමේ ජාලය වැඩිදියුණු කිරීමට මෙන්ම ජාලකයෙන් පරිබාහිර බලශක්ති සේවා ප්‍රවර්ධන කිරීම අරමයා ව්‍යාපෘති සැලසුම් කෙරේ. 2015 වන විට ජාතික බලශක්ති ජාලකයට සියයට දහයක් සම්ප්‍රදායානුකුල නොවන ප්‍රතිජනනය කලහැකි බලශක්ති ප්‍රභවයන්ගෙන් සැපයීමට හා මෙගා වොට් 900 ක් බැගින් විදුලිබල උතපාදන ධාරිතාව ඇති ගල්අඟුරු බලාගාර 03 ක් ඉදිකිරීමට ද ඉලක්ක කර ඇත.

දැනට ක්‍රියාත්මක වෙමින් පවතින විදේශාධාර මගින් මුල්‍යනය වන බලශක්ති ප්‍රමාණයේ සම්ප්‍රේශණ පුළුල් කිරීමේ ව්‍යාපෘති කිහිපයක් හා ඉදිරි මුල්‍යනය සඳහා හඳුනාගෙන ඇති ව්‍යාපෘති මෙහි පහත දක්වා ඇත.

# විදුලි බල අංශයේ නව සංවර්ධන කාර්යයන්



## පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය

රටේ විදුලි බලය සඳහා වර්ධනය වෙමින් පවතින ඉල්ලුම ආර්ථිකයට අවම වැය භාරයක් වන පිරිවැය මත සපුරාලීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. ඒකක ධාරිතාවය මෙගා වොට් 300 බැගින් වන අදියර 3 කින් ඉදි කෙරෙන බලාගාරයේ අවසන් ධාරිතාවය මෙගා වොට් 900 ක් වේ. යෝජිත ගල් අඟුරු බලාගාරයේ පළමු අදියර ක්‍රියාත්මක කිරීම සඳහා ඇ. ඩො. මිලියන 455 ක ණය ආධාරයක් චීන රජය විසින් චීන අපනයන ආනයන බැංකුව හරහා ලබා දෙන ලදී. ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ පුත්තලම නොරොච්චෝලය මෙගා වොට් 300 ක ධාරිතාවයකින් යුත් ගල් අඟුරු බලාගාරයක් ස්ථාපනය කිරීම. වාහක පටිය සහිත කිලෝ මීටර් 1.2 ක දිගකින් යුත් ගල් අගුරු බැමේ ජැටියකි. වොට් 220 කින් යුතු කිලෝ මීටර් 115 ක විදුලි සම්ප්‍රේශන රැහැන් නොරොච්චෝලේ සිට වෙයන්ගොඩ දක්වා ඇතිකිරීම. කිලෝ වොට් 300 ක විදුලි බලය උත්පාදනය කිරීමට අවශ්‍ය සියලුම අතිරේක උපකරණ පද්ධති හා අනෙකුත් යටිතල පහසුකම් ඇතුලත් ගල් අගුරු අංගනයක් ඉදි කිරීම අදියර 1 ට අයත් වේ.

චීන එක්සිම් බැංකුව දැනටමත් ඇ. ඩො. මිලියන 136.5 ක මුදලක් ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා චීන කොන්ත්‍රාත්කරු වෙත ලබාදි ඇති අතර ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2007 අගෝස්තු 6 දින ආරම්භ කෙරුණි. එසේම මෙම ව්‍යාපෘතියේ දෙවන හා තුන්වන අදියර චීන ආධාර මත 2009 දී ආරම්භ කිරීමට අපේක්ෂා කරන අතර ඒ සඳහා ඇස්තමේන්තුගත වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන 400 කි. මෙම ව්‍යාපෘතියේ පළමුවන අදියර 2010 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂිත අතර අදියර දෙක හා තුනෙහි කටයුතු 2013 දි නිම කිරීමට අපේක්ෂිතය.



යෝජිත පුත්තලම ගල් අඟුරු බලාගාරය

## ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය

ලංකාවේ විදුලි බල උත්පාදනයට ගි. වො. පැය 409 ක වාර්ෂික විදුලි ජනනයක් එක්කරමින් තලවකැලේදී කොත්මලේ ඔය හරස් කොට එහි ජලය කිලෝ මීටර් 12.5 ක දිග හැරවුම් උමගක් ඔස්සේ රැගෙන

ගොස් විදුලිය ජනනය සඳහා, පුන්ඩළු සහ කොත්මලේ ඔය පහළට වන්නට කිලෝ මීටරයක් පමණ දුරින් මෙගා වොට් 150 ක ධාරිතාවයකින් යුතුව ඉදිකෙරෙන ජල විදුලි බලාගාරයක් වෙත යොමු කෙරේ.





හැරවුම් උමගයේ ඉදිකිරීම් කටයුතු

ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික සහ සමාජයීය තත්වය වැඩි දියුණු කරීමට මෙම ව්‍යාපෘතියෙන් මනා පිටුවහලක් ලැබෙන අතර යෝජිත ජලාශයේ හු දර්ශනය තුලින් ඇතිවන අලංකාරය සංචාරකයන්ගේ පැමිණීම වර්ධනය වීමට හේතු කාරක වනු ඇත. ප්‍රදේශයේ තානායම් සහ අනෙකුත් පහසුකම් භාවිතා කිරීමට දේශීය මෙන්ම විදේශීය සංචාරකයින් පෙළඹීම හේතුවෙන් ව්‍යාපාරික ප්‍රජාවට ද මෙමගින් මහත් ප්‍රතිලාභ අත්වේ. මෙම ව්‍යාපෘතිය මගින් තලවකැලේ ප්‍රදේශය හා ඒ අවට ප්‍රදේශයන්ට විදුලි බල, සන්නිවේදන, ජල සම්පාදන සහ කැලි කසල බැහැර කිරීමේ පහසුකම් සැපයීම හේතුවෙන් ප්‍රදේශයේ සංවර්ධනයට ද මහඟු දායකත්වයක් මෙමගින් සැළසේ.

ව්‍යාපෘතියේ වැඩ කටයුතු සඳහා ජපන් රජය විසින් ඇ. ඩො. මිලියන 285 ක පමණ ණය අධාරයක් (යෙන් බිලියන 33) ලබා දී ඇත. ව්‍යාපෘතිය යටතේ අවතැන් වූවන් වෙනුවෙන් නිවාස ඇතුළු අනෙකුත් පොදු පහසුකම් සහ ප්‍රදේශයේ ප්‍රවේශ මාර්ගයන් ඉදිකිරීමේ කටයුතු දැනට සිදු කරමින් පවතින අතර, එම කටයුතු 2008 වසරේදී නිම කිරීමට බලාපොරොත්තු වේ. ජලාශය හා විදුලි උත්පාදනය සඳහා ජලය රැගෙන යන උමං මාර්ගය ඉදි කිරීමේ කටයුතු ද මේ වන විට ආරම්භ කර ඇති අතර මෙම ජල විදුල බලාගාරය මගින් උපදවන විදුලි බලය ජාතික විදුලි බල පද්ධතියට 2011 දී පමණ එක් කිරීමට අපේක්ෂිතය.



තලවකැලේ - තවලම්තැන්න මාර්ගය



අවතැන් වූවන් සඳහා නිවාස

## විදුලි බල අංශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

රටේ විදුලිය සැපයීමේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඇ. එ. ජ. ඩොලර් මිලියන 70 ක මුදලක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාදී ඇත. මෙම අරමුදල් විදුලිය සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ පද්ධතිය පුළුල් කිරීම, ප්‍රතිසංවිධානය කිරීම හා පුනරුත්ථාපනය කිරීම සහ ග්‍රාමීය විදුලිබල පද්ධතිය පුළුල් කිරීම සඳහා වෙන්කර ඇත.



**අම්බලන්ගොඩ ග්‍රිඩ විදුලි උප පොලේ ඉදිකිරීම් කටයුතු**

මෙම මූල්‍යාධාර මත ඉදිවන ග්‍රාමීය විදුලි යොජනා ක්‍රම 700 ක් හා ග්‍රාමීය විදුලි දිගුකිරීම් 1725 ක් අතුරින් පිළිවෙලින් යෝජනා ක්‍රම 565 ක හා දිගුකිරීම් 1487 ක ඉදිකිරීම් වැඩ දැනටමත් නිමාකර ඇත. දැනට පවතින කිලෝ වොට් 33 ධාරිතාවයකින් යුත් කිලෝ මීටර් 385 ක් දිග බෙදාහැරීමේ මාර්ග හා කිලෝ මීටර් 135 ක් දිග කිලෝ වොට් 33 ධාරිතාවයෙන් යුත් සීඝ්‍රගාමී විදුලි මාර්ග මෙම ව්‍යාපෘතිය යටතේ ශක්තිමත් කරනු ඇත. තවද මාතර, ගාල්ල, ගම්පහ, පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික් වල කර්මාන්ත සහ ග්‍රාමීය ප්‍රදේශ වල විදුලි බල සැපයුම වඩාත් ශක්තිමත් කිරීම සඳහා කිලෝ වොට් 132 විදුලි බල සම්ප්‍රේෂණ මාර්ග සහ ග්‍රිඩ විදුලිය උප පොලවල් ඉදිකරනු ලබේ. ග්‍රාමීය ප්‍රදේශ වලට විදුලිය සැපයීමේ උපාංගය යටතේ ගම් 820 ක ජීවත් වන 150,000 ක් පමණ වූ පාරිභෝගික ජනතාවක් මෙමඟින් ප්‍රතිලාභ ලබනු ඇත.

## මහකොළඹ විදුලි උපපොළ ව්‍යාපෘතිය

ජර්මන් රජය විසින් 2001 වර්ෂයේදී මහකොළඹ විදුලි උපපොළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යූරෝ මිලියන 42 ක් ලබා දෙන ලදී. 2004 වසරේදී නිමවූ මෙම ව්‍යාපෘතිය මගින් 2x31.5 MVA ධාරිතාවයෙන් යුතු නව උපපොළ හතරක් මරදාන, හැවුලොක් ටවුන්, දෙහිවල සහ ශ්‍රී ජයවර්ධනපුර යන ස්ථානයන්හිදී ඉදිකරන ලද අතර අධි බලැති භූගත විදුලි රැහැන් ජාලයක් ස්ථාපනය කරන ලදී. තවද මෙම නව විදුලි උපපොළ හතර දැනට ලංකා විදුලි බල මණ්ඩලය සතු කොලොන්නාව සහ පන්නිපිටිය විදුලි උපපොළ සමග සම්බන්ධ කිරීමද සිදු කරන ලදී. මෙම නව විදුලි උපපොළ ස්ථාපනය කිරීමෙන් පසු කළුබෝවිල සහ ශ්‍රී ජයවර්ධනපුර යන ප්‍රධාන රෝහල් ඇතුළුව කොළඹ ප්‍රධාන පළාත්වලට විශ්වාසදායී විදුලි බල සැපයීම සැලකිය යුතු ප්‍රමාණයකින් වර්ධනය වී ඇත.

# යටිතල පහසුකම් සංවර්ධනය



## වරාය සංවර්ධනය


## 2.1.3 වරාය සංවර්ධන

### හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ සංවර්ධන වැඩ සටහන් අතුරින් ප්‍රමුඛතම ව්‍යාපෘතියක් ලෙස හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජය විසින් ඉහල ප්‍රමුඛත්වයක් ලබා දී ඇත. මූලික වශයෙන්, සේවා හා කාර්මික වරායක් ලෙස සංවර්ධනය කර, පසුව එය ප්‍රති නැව්ගත කිරීමේ වරායක් ලෙස සංවර්ධනය කිරීමටත් මෙම ව්‍යාපෘතිය මගින් සැලසුම් කර ඇත.

මෙම ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ සිදු කරනු ලබන ඉදි කිරීම් කටයුතු නම් (අ) 1,00,000 DWT ධාරිතාවයකින් යුත් බහාලුම් නෞකා නැංගුරම් ලෑම සඳහා මීටර 600 ක දිගින් යුත් පොදු අවශ්‍යතා සඳහා වන නැංගුරම් ලෑමේ මැදිරි 02ක් (ආ) මිටර් 310 ක දිගින් යුත් 1,00,000 DWT ධාරිතාවයක් තෙල් පර්යන්ත 01 (ඇ) නැගෙනහිර දියකඩනය (දිග මීටර් 315) බටහිර දියකඩනය (දිග මීටර් 950) (ඈ) පිවිසුම් මාර්ගය (කි. මී. 1 ක් දිග කිලෝ මීටර් 210 ක් පළල මීටර 16 ගැඹුර)

මෙම ව්‍යාපෘතිය සඳහා මුළු වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන 360 ක් වේ. මෙයින් ඇමෙරිකානු ඩොලර් මිලියන 307 ක් ගැනුම්කරුවන්ගේ ණය පහසුකම් යටතේ චීනයේ එක්සිම් බැංකුවෙන් ලබා ගැනිමට අදාළ සාකච්ඡා සාර්ථකව අවසන් කළ අතර ණය ගිවිසුම 2007 ඔක්තෝම්බර් මස 30 දින අත්සන් කරන ලදී. ඉතිරි ඇ. ඩො. මිලියන 53 ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දරනු ඇත.



හම්බන්තොට වරාය සඳහා යෝජිත ප්‍රදේශය

### කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය

කොළඹ වරාය දකුණු ආසියානු කලාපයේ පිහිටි ස්වභාවික ප්‍රති අපනයන ප්‍රධාන වරාය වේ. ඉන්දියානු උප මහද්වීප ප්‍රති අපනයන වෙළඳ පොළට තරඟයක් දීමට හැකිවන පරිදි මෙහෙයුම් ධාරිතාවය වැඩි දියුණු

කිරීමේ අරමුණින් කොළඹ වරායේ පහසුකම් වැඩි දියුණු කිරීමට ඇ.එ.ජ. ඩොලර් මිලියන 300 ක ණය මුදලක් ලබා ගැනීමට ආසියානු සංවර්ධන බැංකුව හා ගිවිසගෙන ඇත. බහාලුම් අංගන 03 කට ප්‍රමාණවත් දියකඩනයක් ඉදිකිරීම, කොළඹ වරාය ගැඹුරු කිරීම, නව නාවුක මෙහෙයුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම, සමුද්‍රීය තෙල් නල ප්‍රතිස්ථාපනය කිරීම, නාවික ගමනාගමනයට අවශ්‍ය උපකරණ සැපයීම සහ වෙරළ උපාංග ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට ඇතුලත්වේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු කොළඹ වරාය සතු බහාලුම් මෙහෙයවීමේ ධාරිතාව බහාලුම් ඒකක (TEU) මිලියන 5.7 ක් දක්වා 2010 වර්ෂය වන විට ඉහළ නැංවීමටද, එම ප්‍රමාණය 2015 දී මිලියන 8.1 ක් දක්වා තවදුරටත් වැඩිකර ගැනීමට බලාපොරොත්තුවේ. මෙම ඉදිකිරීම් නිසා දැනට කොළඹ වරාය සතු ඉන්දීය උප මහද්වීපික ප්‍රති අපනයන වෙළඳ පොළ කොටස වර්ෂ 2011 වන විට 30% දක්වා වර්ධනය වෙතැයි අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ නව නොබෝ දිනකින් ආරම්භ කිරීමට නියමිතය.




**යෝජිත කොළඹ වරාය සංවර්ධනය**

## ගාළු වරාය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

ජපාන රජය විසින් ඇ. ඩො. මිලියන 135 ක පමණ ණය ආධාරයක් ගාළු වරාය සංවර්ධනය සඳහා ලබා දී ඇත. විශාල නැව් වරායේ නවතා තැබීමට අවශ්‍ය කරන නිශ්චලතාවය ආරක්ෂා කිරීම සඳහා ඉදිවෙන පිටත දිය කඩනයත්, අනාගතයේදී ඇතිවන ඉල්ලුම සපුරා ගැනීමට සහ දැනට කොළඹ වරාය මගින් මෙහෙයවනු ලබන තොග බන්ධන නැව් බඩු ගාළු වරාය වෙත පැවරීම සඳහා අවශ්‍ය වන්නා වූ විවිධ කාර්ය පහසුකම් සහිත නව පර්යන්තයක් ඉදිකිරීමෙන් ගාළු වරාය ප්‍රාදේශීය වරායක තත්වයට සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ.



**ගාලු වරායේ යෝජිත සැලැස්ම**

වරායේ නැව් රැඳී සිටින කාලය අඩු කිරීම සඳහාත්, නැංගුරම් ලැමේ අනුපාතික ප්‍රමාණය අඩුකර ගැනීම සඳහාත්, විශාල නැව් සඳහා සේවා සැපයීම සඳහා විවිධ කාර්ය පහසුකම් සහිත මෙම නව පර්යන්තය උපකාරී වේ. තවද, දැනට ක්‍රියාවට නංවා ඇති දක්ෂිණ සංවර්ධන සැලසුමේ කටයුතු පහසු කිරීමට මෙම ව්‍යාපෘතිය උපකාරී වනු ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් වසරකට නැව් බඩු හැසිරවීමේ ධාරිතාව මෙට්‍රික් ටොන් 3.3 දක්වා වැඩි කර ගත හැකිය.

ගාලු වරාය ප්‍රාදේශීය වරායක් වශයෙන් සංවර්ධනය කිරීමෙන්, පිරිවැයට සරිලන ප්‍රවාහන ප්‍රභවයන් ඇති වන බැවින් දකුණු ප්‍රදේශයේ තරඟකාරී වෙළඳපොළ ආර්ථිකයක් ඇති කිරීමට මෙම ව්‍යාපෘතිය ඉවහල් වේ. තවද, ගාල්ල, මාතර, රත්නපුර සහ කළුතර යන දිස්ත්‍රික්කවල කලාපීය අසමානතාවන් අඩු කර ගනිමින් සංවර්ධනය කිරීමට උපකාර වන ප්‍රධාන බලවේගයක් ලෙස ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය සුවිශේෂ කාර්ය භාරයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු වේ.

ව්‍යාපෘතියේ මූලික කටයුතු ජපන් විශේෂඥයින් විසින් සිදුකරමින් පවතින අතර වරායේ ඉදිකිරීම් කටයුතු 2008 වර්ෂයේ මුල් භාගයේදී ආරම්භ කිරීමට අපේක්ෂිතය.

# යටිතල පහසුකම් සංවර්ධනය



## ජල සම්පාදනය හා සනීපාරක්ෂාව

## 2.1.4. ජල සම්පාදනය හා සනීපාරක්ෂාව

මිනිසාගේ මූලික අවශ්‍යතාවයක් වන සෞඛ්‍යාරක්ෂිත පානීය ජලසම්පාදනය, තිරසාර ආර්ථික හා සමාජ සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමෙහිලා ඇති සුවිශේෂී වැදගත්කම පිළිඹිබු කරමින් සහශ්‍ර සංවර්ධන ඉලක්ක වලින් අඩකට අධික ප්‍රමාණයකට සමීප සමබන්ධතාවයක් දක්වයි. එම නිසා ශ්‍රී ලංකා රජය දරණ ප්‍රයත්නයන් අතර සුවිශේෂී අංගයක් වනුයේ සෞඛ්‍යාරක්ෂිත පානීය ජලසම්පාදනය හා සනීපාරක්ෂාව සඳහා පිවිසීමට ඇති හැකියා දියුණු කිරීමයි. තිරසාර සෞඛ්‍ය, ජීවිතයේ භෞතිකමය ගුණාත්මක භාවය, ඵලදායිතාවය හා මිනිසාගේ උදාරශීලීභාවය වැනි සහශ්‍ර සංවර්ධන ඉලක්ක, ප්‍රජාවන්ට ඵලදායි හා ප්‍රමාණවත් ජලසම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් නොමැතිව සාක්ෂාත් කරගත නොහැකි බැව් මැනවින් පිළිගෙන ඇත. සෞඛ්‍ය ආරක්ෂිත පානීය ජල සැපයුම් සඳහා අතිවිශාල වියදමක් දරන්නට සිදුවන නමුත්, සමාජ සංවර්ධනයෙහි ලා එහි ඇති වැදගත් කම සළකමින් රජය විශාල වැයභාරයක් දරමින් ජනතාවට ඉතාමත් සහනදායි මිළට ජලය සපයනු ලබයි.

අංශමය ඉලක්ක අනුව 2025 වර්ෂය වන විට සියයට 100 ක ජලසම්පාදන ප්‍රමාණයක් ආවරණය කිරීමට ශ්‍රී ලංකා රජය වගකීමකින් බැඳී සිටී. මෙකී ප්‍රයත්නයන් කෙරෙහි, විවිධ සංවර්ධන පාර්ශවිකකරුවන් සහයෝගය දක්වන ජල අංශයේ විශාල ව්‍යාපෘති මගින් ප්‍රමාණවත් ලෙස සහයෝගයක් ලැබේ. පානීය ජල සැපයුමට අමතරව වාණිජ හා කාර්මික ක්‍රියාදාමයන් ඉලක්ක කරගනිමින් නව ජලසම්පාදන හා සනිපාරක්ෂක යෝජනා ක්‍රම ස්ථාපිත කිරීම හා පවතින යෝජනා ක්‍රම වැඩිදියුණ කිරීම තුලින් රජයේ ඉලක්ක සැළකියයුතු මට්ටමකින් සාක්ෂාත් කරගැනීමෙහිලා මෙම ව්‍යාපෘති මහත් පිටුවහලක් වේ.

### කළු ගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය

කළු ගඟ ජල සම්පාදන ව්‍යාපෘතියේ පළමුවන පියවරේ පළමු අදියර යටතේ හොරණ, කඳන හි ඉදිකරන ලද දිනකට ජලය ඝණ මීටර් 60,000 (ගැලුම් මිලියන 13.2) ක් සැපයිය හැකි ජල පවිත්‍රාගාරය මගින් හොරණ, බණ්ඩාරගම, පානදුර හා මොරටුව යන ප්‍රධාන නගර සහ ඒ අවට ප්‍රදේශවල ජීවත් වන ලක්ෂ 5 ක් පමණ ජනතාවට සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය 2006 ඔක්තෝම්බර් සිට ලබා දී ඇත. මෙම ව්‍යාපෘතිය ජපන් රජය විසින් ඇ. ඩො. මිලියන 95 ක මූල්‍ය පහසුකම් සපයන ලද අතර එම වනාපෘතියේ තව දුරටත් ඉතිරි වූ අරමුදල් යොදවමින් දැනට ආරම්භ කර ඇති අතිරේක වැඩ කොටස් ද 2008 අගෝස්තු මාසය වන විට අවසන් කිරීමට නියමිතව ඇත. මෙම ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා ජලය ලබා ගන්නා ස්ථානයන්, ජල පවිත්‍රාගාර හා ජල කුළුණ ඇතුළුව අනෙකුත් පහසුකම් ඉදිකරනු ලබන අතර ඉලක්කගත ප්‍රජාවට ජලය සැපයීම උදෙසා ජල සැපයුම් හා බෙදා හැරීමේ නල මාර්ග ද අතුරනු ලැබේ.




ව්‍යාපෘති බල ප්‍රදේශය

තවද, මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර 2008 වර්ෂයේ ආරම්භ කිරීම සඳහා ද අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීමට ජපන් රජය එකඟ වී ඇත. දෙවන අදියර යටතේ කඳන ප්‍රදේශයේ ජල පවිත්‍රාගාරයක් ද මොරටුව හා පිළියන්දල යන ප්‍රදේශයන්හි භූගත ජල ටැංකි හා ජල පොම්පාගාර ද ඉදි කරනු ලබයි.

මෙයට අමතරව බණ්ඩාරගම සිට පිළියන්දල දක්වා ජලය රැගෙන යාමට කිලෝ මීටර් 14.5 ක ප්‍රධාන නල මාර්ගයක් සහ බණ්ඩාරගම, පිළියන්දල, කැස්බෑව, පානදුර නැගෙනහිර සහ මොරටුව අවට ප්‍රදේශවලට ජලය සැපයීම සඳහා කිලෝ මීටර් 320 ක ජලය බෙදාහැරීමේ නල මාර්ග ද එළීමට නියමිතය.



ජල පවිත්‍රාගාරය

## මහනුවර ජල සම්පාදන හා මහනුවර නගරයේ අපජලය බැහැර කිරීමේ ව්‍යාපෘතිය

ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) විසින් 1998 හා 1999 කාල සීමාව තුළ සිදු කරන ලද ශක්‍යතා අධ්‍යයනයක ප්‍රතිඵල පාදක කොට ගෙන මහනුවර ප්‍රදේශයේ පානීය ජල සැපයුම් තත්වය ඉහළ නැංවීම මෙන්ම සනීපාරක්ෂක පහසුකම් නංවා ලීම සඳහා ජපන් රජය විසින් මූල්‍යාධාර ලබා දී ඇත.



ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ දිනකට ජලය ඝණ මීටර් 115,500 ක ධාරිතාවයකින් යුතු නව ජල කුළුණක්ද, දිනකට ජලය ඝණ මීටර් 36,500 ක් සැපයිය හැකි ජල පවිත්‍රාගාරයක් ද, සේවා ජලාශ 4 ක්, පොම්පාගාර 3 ක්, සේවක නිල නිවාස, කිලෝ මීටර් 28 ක් දිගින් යුතු ප්‍රධාන සැපයුම් නල මාර්ගයක් සහ කිලෝ මීටර් 15 ක් දිගැති බෙදාහැරීමේ නල මාර්ග ආදිය ඉදි කරන ලදී. මේ සඳහා වූ වියදම රුපියල් බිලියන 6 කි. මෙමගින් මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය, තදාසන්න ප්‍රාදේශිය සභා බල ප්‍රදේශ වන පාත දුම්බර, ගඟවට කෝරළේ, අකුරණ සහ පූජාපිටිය යන ප්‍රදේශවල ජල සැපයුම වැඩි දියුණු විය. මෙම ව්‍යාපෘතිය යටතේ 2006

ඔක්තෝම්බර් මස සිට ජල සැපයීම් ලබා දුන් අතර එමගින් මහනුවර නගරයට පැමිණෙන 100,000 ක් පමණ වූ ජනගහනය ද ඇතුලත්ව 400,000 ක පමණ ජනතාවක් ප්‍රතිලාභ ලබයි.

ව්‍යාපෘතියේ දෙවන අදියරේදී මහනුවර ප්‍රදේශයේ අධික ජල ඉල්ලුම සපුරාලීමට අවශ්‍ය වන්නා වූ සේවා ජලාශ 15 ක් ඉදි කිරීම මෙන්ම, කිලෝ මීටර් 27 ක් දිගින් යුත් ප්‍රධාන සැපයුම් නල මාර්ග හා කිලෝ මීටර් 105 ක් දිගින් යුත් බෙදා හැරීම් නල මාර්ග ඇතිරීම සහ ආදායම් නොලබන ජල නාස්තිය අඩු කිරීමේ වැඩ සටහනක් ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මෙම පියවරෙහි ප්‍රසම්පාදන කාර්යයන් දැනටමත් ආරම්භ කර ඇති අතර ඇස්තමේන්තුගත වියදම රුපියල් බිලියන 4 කි. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු වසර 2011 දී නිම කිරීමට අපේක්ෂිතය. මෙමගින් 350,000 ක පමණ ජනතාවක් ප්‍රතිලාභ ලබනු ඇත.



ජල කුළුණ

මෙම ව්‍යාපෘතියට සමගාමීව අපජල කළමනාකරණ ව්‍යාපෘතියක් ද ක්‍රියාත්මක කෙරේ. නුවර නගර බල ප්‍රදේශය තුළ අධික ජන ගහනයකින් යුක්ත බැවින් කසළ පවිත්‍රාගාරයක් සහ කසළ බැහැරලීමේ පද්ධතියක අවශ්‍යතාවය වඩාත් ඉහළ මට්ටමක පවතී. මෙමගින් පොදු ජනතාවගේ සෞඛ්‍යය හා පානීය ජලයේ ගුණාත්මක බව වැඩි කිරීමෙන් දීර්ඝ කාලීනව සෞඛ්‍යානුකූල හා ගුණාත්මක සංවර්ධනයක් සිදු කළ හැක. කිලෝ මීටර් 100 ක දිගින් යුතු නල මාර්ග පද්ධතියකින් හා දිනකට ඝණ මීටර් 7,000 ක ධාරිතාවයකින් යුතු අප ජල පවිත්‍රාගාරයකින්ද මෙම යොජිත පද්ධතිය සමන්විත වේ. මෙමගින් වර්ග කිලෝ මීටර් 7 ක් පමණ වූ මැද ඇළ ජල පෝෂක ප්‍රදේශය ද, පේරාදෙණි මාර්ගයට යාබදව පිහිටා ඇති ආරෝග්‍යශාලා හා විශ්ව විද්‍යාල වැනි ප්‍රධාන රජයේ ආයතන ද ප්‍රතිලාභ ලබනු ඇත.

ජපන් රජයේ සහයෝගයෙන් රුපියල් බිලියන 14 ක අගයකින් යුත් ව්‍යාපෘතියේ පූර්ව කොන්ත්‍රාත් කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. මහනුවර නගරයේ අප ජලය බැහැරලීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් මහවැලි ගඟෙහි ජලයේ ගුණාත්මක භාවයත්, තදාසන්න ප්‍රදේශවල පාරිසරික තත්වයත් වැඩි දියුණු වනු ඇත. තවද, මෙම අප ජල කළමණාකරණ පද්ධතිය වසර 2012 දී පමණ නිම කිරීමට බලාපොරොත්තු වේ.

## ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය

මහ කොළඹ ප්‍රදේශයේ පානීය ජල සම්පාදන පහසුකම් තවදුරටත් ව්‍යාප්ත කිරීම තුලින් සෞඛ්‍යාරක්ෂිත පානීය ජල සම්පාදනය මෙන්ම සනීපාරක්ෂක පහසුකම් තව දුරටත් වැඩි දියුණු කිරීමට මෙම ව්‍යාපෘතිය යටතේ අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම උදෙසා ජපන් රජය විසින් ඇ. ඩො. මිලියන 90 ක පමණ මූල්‍යාධාර ලබා දී ඇත. ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2007 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර එහි අපේක්ෂිත කාර්යයන් 2015 වසර වන විට නිම කිරීමට නියමිතය.

කොළඹට උතුරින් පිහිටි ප්‍රදේශවල භූගත ජලාශ, ජල පොම්පාගාර සහ නිල නිවාස ඉදි කිරීම මෙන්ම ජලය බෙදාහැරීමේ නල මාර්ග ඇතිරීම මගින් මුතුරාජවෙල හා පමුණුව ප්‍රදේශවල පදිංචි 250,000 ක් පමණ වන ජනතාවගේ පානීය නල ජල පහසුකම් සඳහා වන ඉල්ලීම් සපුරාලීමට බලාපොරොත්තු වේ.

ර්ට අතිරේකව, මැද කොළඹ ප්‍රදේශයේ ජලය බෙදාහැරීමේ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා මාළිගාකන්ද සහ එළිහවුස්හි දැනට පවතින සේවා ජලාශ වෙනුවට නව ජලාශ දෙකක් ද, කාර්යාලීය ගොඩනැගිලි සහ ජල පොම්පාගාර ඉදි කරනු ලබන අතර ජල සැපයීම් හා බෙදාහැරීමේ නල මාර්ග ඇතිරීම මගින් කොට්කාවත්ත හා මුල්ලේරියාව ප්‍රදේශවල ජල සැපයුම් පද්ධතිය ද වඩාත් කාර්යක්ෂම වනු ඇත.

## ද්විතීයික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරකෂක ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකු ආධාර මඟින් මඩකළපුව, හම්බන්තොට, පොළොන්නරුව, මුතුර් සහ අනුරාධපුර යන දිස්ත්‍රික්ක 05 තුල ක්‍රියාත්මක කරන ඉහත ව්‍යාපෘතිය මඟින් එම ප්‍රදේශවල ජීවත් වන 969000 ක් පමණ ජනයාට පානීය ජල පහසුකම් ද 171,500 ක් පමණ ජනයාට සනීපාරකෂක පහසුකම්ද සැලසීමට නියමිතය.



**ජලසැපයුම් යෝජනා ක්‍රම**

2004 වසරේදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන ලද අතර නාගරික ජල සම්පාදන යෝජනා ක්‍රමයන්හි සැලසුම් අවසන් කර ඇත. ප්‍රධාන කොන්ත්‍රාත් 16 න් 07 ක් පිරිනමා ඇති අතර ඉදිකිරීම් කටයුතු කෙරෙමින් පවතී. ග්‍රාමීය ජල යෝජනා ක්‍රමයේ ප්‍රථම අදියර (ප්‍රාදේශීය සභා 08ක්) නිම වීමට ආසන්න අතර දෙවන අදියරද (ප්‍රාදේශීය සභා 07ක්) සේවයේ යෙදවීම ක්‍රියාත්මක වෙමින් පවතී. ආයතනික ප්‍රවර්ධන සංරචකය යටතේ වූ කාර්යයන් ක්‍රියාත්මකව ඇත.

ව්‍යාපෘතියේ 17.7 % ක භෞතික සහ 11.2 % ක මූල්‍යමය වර්ධනයක් මේ වන විට ලඟා කර ගෙන ඇත. පානීය ජල සැපයීම මඟින් දැනටමත් 66,653 කට වැඩි ජන ප්‍රමාණයක් ප්‍රතිලාභ ලබා ඇති අතර 45,127ක ජන ප්‍රමාණයකට වැඩිදියුණු කරන ලද සනීපාරක්ෂක පහසුකම් සලසා ඇත. ආයෝජනයන්හි 75 % නාගරික සංරචකයන් මත වේ. 2008 වසර ප්‍රධාන නාගරික කොන්ත්‍රාත් සඳහා ගොඩනැඟිමේ කාල පරිච්ඡේදය වනු ඇත.

## අම්පාර නාවලපිටිය හා කොග්ගල ජල සම්පාදන යොජනා ක්‍රම වර්ධනය කිරීම



අම්පාර ජල පවිත්‍රාගාරය

අම්පාර නාවලපිටිය හා කොග්ගල ජල සම්පාදන යොජනා ක්‍රම වර්ධනය කිරීම තුළින්, අම්පාර හා නාවලපිටිය නගර සභා සීමාව තුල සහ ආයෝජන මණ්ඩලයේ කොග්ගල අපනයන සැකසීමේ කලාපය ඇතුළු හබරාදුව ප්‍රාදේශිය සභා සීමාවේ කොටසක පානිය ජල පහසුකම් සැලකිය යුතු අන්දමින් වැඩි දියුණු කෙරේ. KFW බැංකුව හරහා ජර්මන් රජය විසින් සහන කොන්දේසි මත දෙනු ලබන ණය මුදලින් සහ ශ්‍රී ලංකා රජය මගින් ව්‍යාපෘති සඳහා මූල්‍ය සම්පාදනය කෙරේ. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 2662 ක් වේ. ව්‍යාපෘතිය සඳහා ජර්මන් රජයේ දායකත්වය යුරෝ මිලියන 14 ක් වන අතර ශ්‍රී ලංකා රජය මගින් රු. මිලියන 845 ක් හා ආයෝජන මණ්ඩලය මගින් රු. මිලියන 141 දායකත්වයක් ලබා දෙයි. ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභීන් සංඛ්‍යාව 87,000 ක් පමණ වේ. 2008 වසරේදි ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂා කෙරේ.

### අම්පාර

අම්පාර ව්‍යාපෘතියට අයත් වන්නේ අම්පාර නාගරික ප්‍රදේශයයි. අපේක්ෂිත සේවා සම්පාදන ජන සංඛ්‍යාව 28,000 කි. මි. මී. 350 ක විෂ්කම්භයෙන් යුත් පිරිසිදු නොකළ ජලය ගෙනයන ප්‍රධාන මාර්ග ඇති කිරීම, එක් දිනක ධාරිතාව ඝණ මීටර 6500 ක් වන පිරිසිදු කිරීමේ පවිත්‍රාගාරයක් ඉදිකිරීම, ඝණ මීටර 1000ක ධාරිතාවයෙන් යුත් භූගත ජලාශයක් ඉදිකිරීම, උඩට මසවා තබන පොම්පාගාර ඉදිකිරීම හා අදාල පොම්ප ස්ථාපිත කිරීම, දැනට පවතින ජල කුළුණු දෙක පුනරුත්ථාපනය කිරීම, පිරිසිදු ජල සම්ප්‍රේෂණ නල ඇති කිරීම, බෙදා හැරීමේ පද්ධතීන් තවත් කිලෝ මීටර් 15.5 කින් ව්‍යාප්ත කිරීම හා ආදායම් ජනිත නොවන ජල සම්පාදන අවම කිරීම සඳහා ජල කාන්දු වැලැක්වීමේ වැඩ සටහන් දියත් කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචකයන් වේ. කොන්ඩවටුවාන වැවෙන් ජලය ලබා ගැනීමට සැලසුම් කර ඇත.

## නාවලපිටිය



නාවලපිටිය ජල කුළුණ

ව්‍යාපෘතියට අයත් වනුයේ නාවලපිටිය නගර සභා සීමාවයි. පවතින ජල පද්ධතියෙන් බෙදා හරින ජලය නගරය සඳහා ප්‍රමාණවත් නොවනසේම ජලයේ තත්වයද විශ්වාසනීය නොවේ. නව ජල සම්පාදන ව්‍යාපෘතිය පූර්ණ පද්ධතිමය වැඩි දියුණු කිරීම තුළින් මෙම ගැටළු වලට සම්පූර්ණ විසඳුම් සොයනු ඇත. එමගින් සේවා සම්පාදිත ජල පාරිභෝගිකයන්ගේ ප්‍රමාණය 22,000 ක් පමණ වෙතැයි ඇස්තමේන්තු කර ඇත. ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචකයන් වන්නේ ජලය ප්‍රවේශවීමේ නළ මාර්ග ඉදිකිරීම දිනකට ඝණ මීටර 4500ක ධාරිතාවයකින් යුත් පවිත්‍රාගාරයක් ස්ථාපිත කිරීම, ඝණ මීටර 1000ක ධාරිතාවයකින් යුත් ජල කුළුණක් හා ඝණ මීටර 1000ක සහ ඝණ මීටර 450 ක ධාරිතාවයකින් යුත් භූගත ජලාශ, පොම්පාගාරයක් ඉදිකිරීම, පිරිසිදු ජල නළ හා සම්ප්‍රේෂණ රැහැන් ඇති කිරීම, කිලෝමීටර 33 ක ධාරිතාවයකින් යුත් බෙදාහැරීමේ ජාලය සහ කාර්යාලය හා නිල නිවාස ඉදිකිරීම.

## කොග්ගල

කොග්ගල අපනයන සැකසීමේ කලපාය ඇතුළුව හබරාදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසක්, හබරාදූව නගරබද කොටසක් කොග්ගල, කතලුව හා අහංගම නගරබද මෙමව්‍යාපෘතියට අයත් වේ. සේවා සම්පදාන ජල පාරිභෝගික සංඛ්‍යාව 37,000 ක් පමණ වෙතැයි ඇස්තමේන්තුගත කර ඇත. දිනකට අවශ්‍ය මුළු ජල ප්‍රමාණය ඝණ මීටර 7800 කි. මහගාල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය යටතේ ඉදිකරන ලද හල්ලොලුවගොඩ භූගත ජලාශයේ සිට පිරිසිදු කරන ලද ජලය සම්ප්‍රේෂණය කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය කි.මී. 9.3 ක ඩී. අයි හා පී. වී. සී. සම්ප්‍රේෂණ ප්‍රධන රැහැන් හා කිලෝ මීටර් 26 ක දිගින් යුත් බෙදාහැරීමේ ජාලයකින් සමන්විතවේ.

## මහනුවරට දකුණින් පිහිටි නගර උදෙසා වන ජල සම්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය, මහ නුවර නගරයෙන් දක්ෂිණ ප්‍රදේශවල වෙසෙන ජනතාවට විශ්වාසදායි මෙන්ම සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය ලබාදීම සඳහා ක්‍රියාත්මක වේ. උඩුනුවර සහ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ, ගඟවට කොරළේ, උඩ පළාත සහ ගඟ ඉහළ ඇතැම් කොට්ඨාශවල වෙසෙන 350,000 ක් පමණ වන ජනතාවගේ වසර 2025 දක්වා වන ජල ඉල්ලුම මේ මගින් සපුරාලනු ඇත. පේරාදෙණිය, පිළිමතලාව, දන්තුරේ, කඩුගන්නාව, මුරුතලාව සහ ගම්පොළ උලපනේ, වෙළම්බොඩ මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභී අනෙකුත් නගර වේ.

යුරෝ මිශ්‍ර ණය මගින් ඩෙන්මාර්ක රජය විසින් ව්‍යාපෘතිය සඳහා මූල්‍ය සම්පාදනය කරනු ලබයි. ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා ඇත. පේරාදෙණිය

කඩුගන්නාව ප්‍රදේශයේ සේවා සම්පාදනයට මහවැලි ගඟ හරහා බැදෙන ඝණ මීටර් 32,000 ක ජල ප්‍රමාණයක් ඇදගනු ලබන අමුණ, හා අමුණට යාබදව මීවතුරෙහි පිහිටි ජල පවිත්‍රාගාරය ද අයත් වේ. පිරිසිදු කළ ජලය සේවා ප්‍රදේශයෙහි අළුතින් ඉදිකෙරුණු ජලාශ 13 ක් හා පවතින ජලාශ 4 ක් මගින් බෙදා හරිනු ලැබේ. කිලෝ මීටර් 40 ක සම්ප්‍රේෂණ ජාලයක් උපයෝගී කොට ගෙන ජලය සම්ප්‍රේෂණය කරනු ලැබේ. ප්‍රතිලාභීන් වෙත ජලය සම්පාදනය කෙරෙනුයේ කිලෝ මීටර් 300 ක දිගින් යුත් බෙදාහැරීමේ ජාලයක් මගිනි.

ගම්පොළ, උළපනේ සහ වෙලම්බොඩ ප්‍රදේශවල සේවා පහසුකම් ජල ප්‍රභවයන් තුනකින් (03) කින් සමන්විත වේ. පාරදැක ප්‍රදේශයේ ජල ප්‍රවේශ ධාරිතාව ඝණ මී 6000 දක්වා වැඩි කිරීම, අටබාගේ ප්‍රදේශයේ නව පවිත්‍රාගාර පහසුකම් ඉදිකිරීම, උලපනේ ඔයෙන් ඝණ මී 8000 ක ජල ප්‍රමාණයක් ඇද පිරිසිදු කිරීම හා ඇල්පිටියෙන් මීටර් 7000 ක් ඇද පිරිසිදු කිරීම ද මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකෙරේ. කිලෝ මීටර් 20 ක දිගින් යුත් ජල සම්ප්‍රේෂණ ජාලක ජල කුළුණු 01 ක නව ජලාශ 03 ක හා පවතින ජලාශ 03 ආශ්‍රයෙන් කිලෝ මීටර් 100 ක නල පද්ධතියක් මගින් පාරිභෝගිකයින් වෙත සේවා සම්පාදනය කෙරේ.

මෙම ව්‍යාපෘතියේ සුවිශේෂ අංගයන් වනුයේ නව තාක්ෂණය මගින් ජලය සම්ප්‍රේෂණය කිරීම සඳහා ඉහළ ඝනත්වයකින් යුත් පොලි එතිලීන් පයිප්ප භාවිතය හා "ස්කාඩා" ක්‍රමය මගින් මූලික වැඩ ස්වයංක්‍රීය කරණයයි, යෝජනා ක්‍රමය ක්‍රියාවට නැංවූ විගස, පාරිභෝගිකයිනට සේවා සම්පාදනය වන පරිදි ජල නළ ඇතිරීම් සමගින්, සේවා සම්බන්ධක 19,000 ක් සැපයීම හා ජලය අපතේ යෑම වැලැක්වීම ව්‍යාපෘතියේ වැදගත් ලක්ෂණ වේ.

2006 වසරේදී ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර 2007 සැප්තැම්බර් වන විට 36% ක භෞතිකමය හා 34% මූල්‍යමය ප්‍රගතියක් වාර්තා කෙරින. 2009 වසරේ ජූනි වන විට ව්‍යාපෘතිය නිමාවට පත් කෙරෙන අතර එමගින් දකුණු නුවර දසදහස් ගණනාවක ජනතාවට විශ්වනීය, ගුණාත්මක භාවයෙන් යුත් පානීය ජල පහසුකම් භුක්ති විඳිය හැක.



## දෙවන ප්‍රජා ජල හා සනීපාරක්ෂක සම්පාදන ව්‍යාපෘතිය

දෙවන ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය මගින් කුරුණෑගල, මහනුවර, මාතලේ, නුවරඑළිය, ත්‍රිකුණාමලය, හා අම්පාර දිස්ත්‍රික්කවල ග්‍රාමීය ජනතාවට පිරිසිදු පානීය ජලය ලබාදීම, සනීපාරක්ෂක පහසුකම් ලබාදීම හා සෞඛ්‍යාරක්ෂක පිළිවෙත් දිරිගැන්වීම මගින් ජීවන තත්ත්වය උසස් කිරීමට කටයුතු කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය පළාත් සභා හා ප්‍රාදේශීය සභා සම්බන්ධ කරගෙන විමධ්‍යගතව ක්‍රියාත්මක කෙරේ. ව්‍යාපෘතිය යටතේ පුද්ගලයින් 860,000 කට පමණ ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් සැපයීමට ඉලක්ක කර ඇත. ලෝක බැංකුව මගින් ප්‍රදානය කරන ලද ඇ. එ. ජ. ඩොලර් මිලියන 40 මගින් මෙම ව්‍යාපෘතිය මූල්‍යයනය කර ඇත.




මේ දක්වා පළමු, දෙවන හා තුන්වන අදියරයන් මගින් ප්‍රජා මූලික සංවිධානවල අධීක්ෂණය යටතේ ග්‍රාම නිළධාරී වසම් 453 කට ජල සම්පාදන පහසුකම් සපයා ඇත. මේ වසර තුළ ත්‍රිකුණාමලයේ ග්‍රාම නිලධාරී වසම් 24 කට සහ අම්පාරේ ග්‍රාම නිළධාරී වසම් 42 කට ජල සම්පාදන පහසුකම් සැපයීමට සැළසුම් කර ඇත.

## මහා ගාල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය – 11 වන අදියර

ගාල්ල මහ නගර සභා සීමාව තුල ජල සම්පාදන පහසුකම් වැඩි දියුණු කිරිම හා අක්මීමන, බෝපේ, පෝද්දල, හික්කඩුව සහ හබරාදුව ප්‍රදේශිය බල ප්‍රදේශ දක්වා ජල සම්පාදන පහසුකම් ව්‍යාප්ත කිරිම ව්‍යාපෘතියේ අරමුණ වේ. මෙම ව්‍යාපෘතිය අදියර දෙකකින් සමන්විතයි.

ව්‍යාපෘතියේ පලමු අදියර 2001 දෙසැම්බර් මස ආරම්භ වී 2005 මාර්තු මස අවසන් විය. මේ සඳහා රුපියල් මිලියන 4,250 ක් වැය වූ අතර එයින් රුපියල් මිලියන 3,350 ක් සහනදායි ණය කොන්දේසි මත කොරියානු රජය විසින් සපයන ලද අතර ඉතිරිය ශ්‍රී ලංකා රජය විසින් දරනු ලැබීය.

ව්‍යාපෘතියේ දෙවන අදියර 2005 දෙසැම්බර් මස ආරම්භ වූ අතර එය 2007 දෙසැම්බර් මස අවසන් කිරිමට නියමිතය. මේ මගින් පළමු අදියර යටතේ සැලසුම් කරන ලද මිටර් 447 ක දිගකින් යුත් ජල නල සවි කිරිමෙන් ඉතිරි වූ මීටර 392 දිගකින් යුත් ජල නල සවි කිරිම මගින් සමස්ත මහ ගාල්ල ප්‍රදේශයට බාධාවකින් තොරව පානිය ජලය සම්පාදනය කිරිමට අපේක්ෂිතය. මෙහි ඇස්තමේන්තු ගත වියදම රුපියල් මිලියන 3,745 ක් වන අතර එයින් රුපියල් මිලියන 2,152 ක් කොරියානු රජය මගින් සහනදායි කොන්දේසි මත ලබා දී ඇත. මෙම ව්‍යාපෘතිය මගින් ගාල්ල මහනගර සභාව තුල ජිවත් වන පුද්ගලයන් 40,000 ක් පමන ප්‍රතිලාභ ලබන අතර ගාල්ල මහ නගර සභා සීමාවට පිටත ජිවත් වන 160,000 ක් පමණ පිරිසකට ප්‍රතිලාභ සැලසේ.




මහා ගාල්ල ජල සම්පාදන ප්‍රදේශය

## අම්පාර දිස්ත්‍රික්කයේ ජල පහසුකම් නොමැති ප්‍රදේශ සඳහා ක්‍රියාත්මක වන ඒකාබද්ධ ජල යෝජනා ක්‍රමයේ තෙවන අදියර

අම්පාර ජල සම්පාදන ව්‍යාපෘතිය ඕස්ට්‍රේලියානු අපනයන ණය පහසුකම් යටතේ අදියර තුනකින් ක්‍රියාත්මක කිරිමට අදහස් කරනු ලැබු අතර මෙම ව්‍යාපෘතියෙහි පලමු අදියර ඇ.ඩො. මිලියන 22 පිරිවැයක් දරමින් 1999 සිට 2001 වර්ෂය දක්වා ක්‍රියාත්මක කරන ලදී. දෙවන අදියර 2002 වසරේදී ආරම්භ කරන ලද අතර ඒ සඳහා වැයවන මුදල ඇ. ඩො.

මිලියන 55 ක් වේ. මෙම අදියර 2007 වර්ෂයේදී අවසන් වන විට නිම කිරීමට නියමිතය. මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වනුයේ අම්පාර වෙරළාසන්න ප්‍රදේශයේ ජීවත් වන 250,000 ක ජනගහනයක් සඳහා පිරිසිදු පානීය ජලය ලබා දීමයි. මේ නිසා ව්‍යාපෘති ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට ජලවාහක රෝගයන් වැළදීමට ඇති අවස්ථා අඩු වීම ජීවිතයන්හි ගුණාත්මක භාවය වර්ධනය වීමක් ද සිදු වේ. මෙම ව්‍යාපෘතිය මගින් ඉරකමම්, අක්කරපත්තු, අඩ්ඩලචෙනායි, ඕළුවිල්, තිත්තවුර්, මරාතමුනෙයි, උහන, දමන දීඝවාපි වරියපතන්චෙනායි, පට්ටියදිපිට්ටි, අලින්නගර, පල්ලිකුඩියුරුප්පු, අසංකාර්න්, සෙමායි, පන්දිරිප්පු, නිලවානි, මුවංගල, තිස්ස, උදයපුර, කුමාරිගම හා කෝමරිය යන ප්‍රදේශයන් ආවරනය වන කිලෝ මීටර් 238 බෙදා හැරීම ජාලයක් මගින් දිනකට පිරිසිදු ජලය ගැලුම් දස ලක්ෂ 12 ක් සැපයීම සඳහා ජල පවිත්‍රාගාර පහසුකම් සපයයි. මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර 2007-2009 අතර කාලය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර එමගින් හිමිදුරාව, කොන්ඩුවටුවන, උහන, ගෝනගොල්ල, බක්කි ඇළ, වදයන්තලාව, නවිතන්වැලි, චාවලකඩේ, පරගහ කැලේ, නාමල් ඔය, ඉඟිනියාගල, හිඟුරන, දමන, මදන, තොට්ටම, වදිනාගල දීඝවාපි හා මුවන්ගල, ඇතුළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 ක් ආවරණය කරනු ලැබේ. පානිය ජලය ලබා දීම තුලින් අම්පාර දිස්ත්‍රික්කයේ උප නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ වල 88200 ක් පමණ ජනතාවගේ සෞඛ්‍ය හා ජීවන තත්වය දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා අවශ්‍ය ඇස්තමේන්තුගත විදේශීය මූල්‍ය මය කොටස ඇමෙරිකානු ඩොලර් මිලියන 92 ක් වන අතර එය ඕස්ට්‍රේලියානු රජය විසින් ඕස්ට්‍රේලියානු අපනයන මූල්‍ය පහසුකම් යටතේ ලබා දෙනු ඇත.



දෙවන අදියර යටතේ ඉදි කරන ලද ජල පවිත්‍රාගාරය – කොන්ඩුවටුවල අම්පාර දිස්ත්‍රික්කය

## මහ ත්‍රිකුණාමලය ජල සම්පාදන ව්‍යාපෘතිය

මහ ත්‍රිකුණාමලය ජල සම්පාදන යෝජනා ක්‍රමය ප්‍රංශ රජය මගින් සහන කොන්දේසි මත පිරිනමනු ලබන යූරෝ මිළියන 10 කින් මූල්‍යනය කෙරේ. (රු. මිලියන 1250) මහවැලි ගඟින් ජලය ලබාගැනීම සඳහා අල්ලායි කන්තලේ පාලම අසල නව පොම්පාගාරයක් ඉදි කෙරෙන අතර කන්තලේ පවිත්‍රාගාරය දක්වා කි.මී 20 ක දිගින් යුත් සැපයුම් මාර්ගයක් ඉදි කිරීමට ද මෙම ව්‍යාපෘතිය යටතේ මුදල් ලබා දෙනු ලැබේ. ජල පවිත්‍රාගාරයේ ධාරිතාව දිනකට ගැළුම් මිලියන 06 දක්වා වැඩි කිරීමටත් කන්තලේ තම්පලාගාමම්, කින්නියා හා සමස්ථ ත්‍රිකුණාමල නගරයට පිරිසිදු කළ ජලය සම්පාදනය කිරීම හා සැපයුම දීර්ග කිරීමෙන් නිලාවෙලි ප්‍රදේශය ආවරණය කිරීමත් ව්‍යාපෘතිය මගින් සිදු කරනු ලැබේ. දැනට සම්පාදනය කරනු ලබන ජල ප්‍රමාණය ව්‍යාපෘතිය මගින් දෙගුණ කෙරේ. ප්‍රධාන සිවිල් වැඩ හා මිලදී ගැනීම් කටයුතු සඳහා වසර අග දී ටෙන්ඩර් කැඳවනු ලැබේ.

## කොළඹ ජලාපවහන පුනරුත්ථාපන ව්‍යාපෘතිය - මූල්‍ය සම්පාදනය ඩැනිඩා ආයතනයෙනි

වසර ගණනාවක සිට පිරිහීමට පත්වෙමින් ගරා වැටුණු තත්වයක පවතින කොළඹ නගරයේ අපවහන පද්ධතිය පුනරුත්ථාපනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. රාජකීය ඩෙන්මාර්ක් රජය විසින් ස්වකීය මිශ්‍ර ණය වැඩ සටහන යටතේ මේ සඳහා යූරෝ මිලියන 22.6 ක පොලී රහිත ණය මුදලක් ලබා දී ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ, 2020 වර්ෂය දක්වා වන ඉල්ලුම් සපුරාලිය හැකි වන පරිදි මාදම්පිටියේ දැනට පවතින පොම්පාගාරය වෙනුවට නව පොම්පාගාරයක් ඉදිකර එහි ධාරිතාව ඝණ මීටර් 2.9 දක්වා වැඩි කෙරේ. ඊට අමතරව නගරයේ උතුරු පෝෂක ප්‍රදේශයේ අපජල ප්‍රමාණයෙන් වැඩි කොටසක් රැස් කරන්නා වූ පොම්පාගාරය වෙත දිවෙන වසර 100 ක් පමණ පැරණි කිලෝ මීටර් 9 ක් වන ප්‍රධාන ජලාපවහන මාර්ගයේ විෂ්කම්භය මිලි මීටර් 450 සිට මිලි මීටර් 1800 දක්වා වැඩි කර පුනරුත්ථාපනය කිරීම සහ දකුණු පෝෂක ප්‍රදේශයේ වැල්ලවත්ත S8 පොම්පාගාරයේ යාන්ත්‍රික හා විදුලි උපකරණ වෙනුවට අළුත් උපකරණ සැපයීම ද මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කෙරේ. ව්‍යාපෘතිය 2005 වර්ෂයේ ආරම්භ වූ අතර මේ වන විට අපවහන නල මාර්ගය හා වැල්ලවත්ත පොම්පාගාරයේ පුනරුත්ථාපන කටයුතු අවසන්කර ඇති අතර මාදම්පිටිය පොම්පාගාරයේ ඉදිකිරීම් කටයුතු අවසන් අදියරේ.



# යටිතල පහසුකම් සංවර්ධනය



## දුම්රිය මාර්ග සංවර්ධනය

## 2.1.5. දුම්රිය මාර්ග සංවර්ධනය

ශ්‍රී ලංකාවේ දුම්රිය මාර්ග ජාලයට කිලෝ මීටර් 1,449 ක් අයත් වේ. දුම්රිය මගින් 5% ක මගී ප්‍රවාහනයට හා 2% ක භාණ්ඩ ප්‍රවාහනයට දායකත්වයක් ලබාදේ. දුම්රිය සේවාව රටතුල විහිදී නොතිබුණද එමගින් වාර්ෂිකව මගීන් මිලියන 64 ක් හා මෙ. ටොන් 1.6 ක භාණ්ඩ ප්‍රවාහනය කෙරේ. එමෙන්ම දුම්රිය මඟින් මගී කිලෝ මීටර් බිලියන 4.4 ක් හා භාණ්ඩ ටොන් කිලෝ මීටර් 135 ක් වාර්ෂිකව ප්‍රවාහනය කෙරේ. දුම්රිය මගින් ප්‍රවාහනය මගීන් මෙන්ම භාණ්ඩ ප්‍රවාහනයටද ආර්ථික අතින් ඉතාමත් වාසිදායක ප්‍රවාහන මාර්ගයක් වශයෙන් සැලකේ. 2010 වසර වනවිට මගී ප්‍රවාහනය 5% සිට 10% දක්වා ද භාණ්ඩ ප්‍රවාහනය 2% සිට 10% දක්වාද වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ඉලක්කය සාක්ෂාත් කරගැනීමෙහිලා විශේෂයෙන් පවතින දුම්රිය මාර්ග පුනරුත්ථාපනය කිරීම, මාර්ග ව්‍යාප්ත කිරීම, සංඥා පද්ධති පුනරුත්ථාපනය කිරීම, බලවේග කට්ටල, දුම්රිය එන්ජිම් හා දුම්රිය මැදිරි ප්‍රසම්පාදනය කිරීම යනාදිය සඳහා ආයෝජනය කිරීමට රජය බලාපොරොත්තුවේ.

දැනට ක්‍රියාත්මක වන ප්‍රධාන මාර්ග හා දුම්රිය සංවර්ධන ව්‍යාපෘති හා විදේශාධාර මඟින් වර්තමානයේදී මුල්‍යනය සඳහා හඳුනාගෙන ඇති ව්‍යාපෘති පහත දැක්වේ.

### ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා දුම්රිය මැදිරි බලවේග කට්ටල 15 ක් සහ මගී දුම්රිය මැදිරි 100 ක් මිලදී ගැනිමේ ව්‍යාපෘතිය.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට බලවේග කට්ටල ඒකක 15 ක් සහ මගී දුම්රිය මැදිරි මැදිරි 100 ක් ලබා ගැනිම සඳහා රෙන්මින්බි යුවාන් (RMBY) මිලියන 510 ක (දළ වශයෙන් ඇ. ඩො. මිලියන 65 ක) සහණදායි ණය මුදලක් ලබා දිම සඳහා මහජන චීන සමුහාණ්ඩුව විසින් එකඟත්වය පළ කර ඇත. මේ සඳහා අවශ්‍ය වන සම්පුර්ණ මුදල චීන රජය විසින් චීනයේ එක්සිම් බැංකුව හරහා ලබා දෙනු ඇත. බලවේග කට්ටල 15 ක් ප්‍රසම්පාදනය කිරිම කොළඹ නගරාසන්න දුම්රිය සේවාවේ සැලකිය යුතු දියුනුවක් ඇති කිරිමට උපකාරිවේ. දැනට පවතින බලවේග කට්ටල 35 සතුටුදායක සේවාවක් සැපයිමෙහිලා කෙසේවත් ප්‍රමානවත් නොවේ. නව ඒකක තුලින් දුම්රිය ධාරිතාව මෙන්ම දුම්රිය මෙහෙයුම් වාර ගනනද වැඩි කෙරෙනු ඇත. මගී දුම්රිය ප්‍රමානවත් සංඛ්‍යාවක් නොතිබීම හේතුවෙන් දුම්රිය මෙහෙයුම් වාර ගනන 520 කට සිමා වී තිබෙන අතර පවතින ඉල්ලුම සපුරා ලීමට එය ප්‍රමානවත් නොවේ. මගී දුම්රිය මැදිරි 100 ක් මිලදි ගැනීම දැනට දුම්රියන්හි පවත්නා ධාරිතා සීමාවන් ඉවත් කිරිමට මෙන්ම පීඩනය අවම කිරිම තුලින් පවතින දුම්රිය සංඛ්‍යාවේ ආයු කාලය දීර්ඝ කිරිමෙහි ලා ඉවහල් වේ. දීර්ඝ ගමනාන්තර සඳහා මෙන්ම නගරාන්තර දුම්රිය සේවාවන් සඳහා ද මෙම නව දුම්රිය මැදිරි ප්‍රධාන වශයෙන් උපයෝගි කර ගනු ඇත. දුම්රිය බලවේග කට්ටල 15 ක් හා දුම්රිය මැදිරි 100 ක් මිලදි ගැනිමෙන් දුම්රිය සේවාවේ සැලකිය යුතු වර්ධනයක් සිදු වේ. එය මහාමාර්ගයේ ගමන් ගන්නා මගීන් දුම්රිය ප්‍රවාහනය වෙත යොමු කිරිමටත් එමගින් මාර්ග තද බදය අඩු කිරිමටත් ඉවහල් වේ. දුම්රිය මැදිරි 25 කින් යුත් පලමු බාණ්ඩය 2007 සැප්තැම්බර් මස 9 වන දින කොළඹට ලගාවු අතර දුම්රිය මැදිරි 25 බැගින්

සමන්විත ඉතිරි කාණ්ඩ තුන ඉදිරි මාස තුන තුල ළඟාවීමට නියමිතය. ප්‍රථම බලවේග කට්ටල තුන 2008 වසරේ ජූලි මස ලැබීමට නියමිත අතර ඉතිරි කට්ටල 12, 2008 දෙසැම්බර් වන විට ලැබෙනු ඇත.




චීනයෙන් ආනයනය කරන ලද දුම්රිය මැදිරි

## දුම්රිය පාලම් ඉදිකිරීම

දුම්රිය පාලම් ඉදිකිරීම සඳහා ඔස්ට්‍රියානු රජය යූරෝ මිලියන 17.3 ක (රු. මිලියන 1742) ණය පහසුකම් ලබා දී ඇත. කළුතර. කැළණිය, සීදුව, ජා ඇළ, පිංවත්ත, පොල්වතුමෝදර හා රඹුක්කන දුම්රිය පාලම් මෙම මූල්‍ය සම්පාදනය යටතේ ඉදි කෙරින. නිල්වලා දුම්රිය පාලම - මාතර - කතරගම දුම්රිය මාර්ගයේ නිල්වලා ගඟ හරහා ඉදිවෙන නව පාලම ඉදිකිරීමට ද මෙම ණය පහසුකම් දිර්ඝ කර ඇත. නිල්වලා පාලම සමඟ බෙන්තොට, උණවටුන, කතළුව හා මීදිගම දුම්රිය පාලම ඉදිකිරීමද දිර්ග කරණ ලද ණය පහසු කමට ඇතුලත් වේ. 2008 ජූනි මස වන විට මෙකී පාලම් ඉදිකිරීම් කටයුතු නිමාවට පත් වනු ඇත. දුම්රිය පාලම් ඉදිකිරීම තුළින් මගීන් ගේ ආරක්ෂාව වැඩි වන



කැළණිය නව දුම්රිය පාලම

අතර පිළිගත් සාමාන්‍ය වේගය පවත්වාගෙන යැමෙන් කාර්යක්ෂමතාවය ද ඉහළ නැංවේ. නිල්වලා පාලම ඉදිකිරීම තුළින් දකුණේ ඈත ප්‍රදේශවල ජනතාවට ද දුම්රිය සේවාව විවෘත වන අතර මෙය මෙරට දුම්රිය සේවයේ සංවර්ධනයෙහිලා සුවිශේෂී සන්ධිස්ථානයක් වේ.

# 2.2

# මානව සම්පත් සංවර්ධනය




## අධ්‍යාපන සහ නිපුණතා සංවර්ධනය

## 2.2.1 අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන අංශය

මානව සම්පත රටක පවතින අනගිතම වත්කම වන අතර එය සංවර්ධනය කිරීමෙන් දීර්ඝ කාලීන ආර්ථික සංවර්ධනය කෙරෙහි සුවිශේෂ දායකත්වයක් ලබා දේ. මානව සම්පත් සංවර්ධනයේ අවසාන පරමාර්ථය වනුයේ රටේ සමස්ථ සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීමෙහිලා තනිතනිවම හෝ සාමුහික වශයෙන් ජනතාව දායක වීම හා සම්බන්ධවීම සහතික වීමයි. එබැවින් මානව සම්පත් සංවර්ධනය හා කළමනාකරණය කිරීමෙහිලා මුලෝපායි, තාර්කාන්විත ප්‍රවේශයක් සැකසීම අවශ්‍ය වි ඇත. සඵලදායි සංවර්ධන සැලසුම් මඟින් මානව සම්පත් සංවර්ධනය කිරීමෙන්, ඵලදායිතාවය වර්ධනය කිරීමට, ප්‍රශස්ත මට්ටමින් එය උපයෝගි කරගැනීම තුලින් සම්පත් වලින් උපරිම ඵල නෙලා ගැනීම, තරගකාරිත්වය ඉහළ නැංවීම, සහ අවසානයේදී රටේ ආර්ථික වර්ධනය තුලින් දරිද්‍රතාවය තුරන් කිරීමට මං පෑදේ.

මෙම අරමුණු ප්‍රධාන වශයෙන් ඉලක්ක කොට අධ්‍යාපන සහ සෞඛ්‍ය වැනි අංශ අවරණය වන පරිදි විදේශාධාර සම්පාදන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක වෙමින් පවති. අධ්‍යාපනික අංශය යටතේ, මානව සම්පත් සංවර්ධනයෙහි සමස්ථ ඉලක්ක සාක්ෂාත් කරගැනීමේ වැදගත් අංශයන් ලෙස පොදු අධ්‍යාපනයේ උප අංශ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය, සහ උසස් අධ්‍යාපනය හඳුනාගෙන ඇත. පවතින සෞඛ්‍ය හා අධ්‍යාපනික තත්වයන් පවත්වාගෙන යාමේහිලා විදේශාධාර ප්‍රදායක දායකත්වය සුවිශේෂ වේ. ප්‍රදායකයින් වෙතින් රජයට ලැබී ඇති ශිෂ්‍යත්ව වැඩසටහන්ද මානව සම්පත් සංවර්ධනයෙහි ලා සුවිශේෂ දායකත්වයක් ලබාදී ඇත.

### අධ්‍යාපන අංශයේ සංවර්ධන කාර්ය රාමුව හා වැඩසටහන

අධ්‍යාපන අංශයේ සංවර්ධන කාර්ය රාමුව හා වැඩසටහන පහත සිව්වැදෑරුම් ඉලක්ක ආවරණය කරගෙන පස් අවුරුදු සැලැස්මක් අනුව ක්‍රියාත්මක කෙරේ. (අ) මූලික හා ද්විතීය අධ්‍යාපනයට පිවිසීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම (ආ) අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වර්ධනය කිරීම (ඇ) ආර්ථිකයේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීම හා සමව සම්පත් බෙදායාම තහවුරු කිරීම සහ (ඈ) යහපාලනය හා සේවා සම්පාදනය සවිමත් කිරීම

මෙම වැඩසටහන (අ) පාසැල් විෂය ධාරාව තුළ ජාත්‍යන්තර ප්‍රවනතා පිළිබිඹු වන ආකාරයෙන් විෂය ධාරාව උත්ශ්‍රේණිගත කිරීම (ආ) පාසැල් විෂය ධාරාව ඉගැන්වීම සඳහා අවශ්‍ය නිපුනතා සමඟින් ගුරුවරුන් බලගැන්වීම. (ඇ) ඉගැන්වීමෙ මට්ටම් විද්‍යානුකුලව ඇගයීමට ලක් කළ හැකි පරිදි විභාග පරීක්ෂණ පද්ධතිය නවීකරණය කිරීම. (ඈ) අයවැය මඟින් අධ්‍යාපනය සඳහා ලබාදෙන ප්‍රාග්ධන මුදල තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන, විද්‍යාගාර වැනි ඉහළ මට්ටමේ ඉගැන්වීම සඳහා අවශ්‍ය වත්කම්, පුස්තකාල සම්පත් මධ්‍යස්ථාන හා ඒ හා අදාල උපකරණ ලබා දීම (ඉ) ප්‍රවර්තන අයවැය මඟින් ඉගැන්වීමේ හා ඉගෙනගැනීමේ ක්‍රියාවලිය සඳහා වෙන්කරන ලද මුදල ඉහළ නැංවීම, පොදු අධ්‍යාපන සම්පත්, ග්‍රාමීය පාසැල්, වතු අංශයේ පාසැල් සහ ගැටුම්කාරී තත්ත්වයෙන් විපතට පත් ප්‍රදේශවල පාසැල් සම්බන්ධයෙන් වාසිදායක වන අයුරින් නැඹුරු කරවීම (ඊ) පළාත් සභා මඟින් අධ්‍යාපනය විමධ්‍යගත කිරීම ශක්තිමත් කිරීම (උ) පාසැල් පාදක

කළමනාකරණය තුලින් පාසැල්-ප්‍රජා සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම (ඌ) අධීක්ෂණය හා ඇගයීම, පර්යේෂණ හා ප්‍රතිපත්ති විශ්ලේෂණය සවිමත් කිරීම වේ.

## ද්විතික අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය - 11 වන අදියර

ආසියානු සංවර්ධන බැංකුවේ මුල්‍යාධාර ක්‍රියාත්මක කරන ලද ද්විතියික අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ මුල් අදියර 2006 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද අතර එහි දෙවන අදියර ඇ. එ. ජ. ඩොලර් මිලියන 36 ක ආධාර යටතේ 2005 වර්ෂයේදී ආරම්භ කරන ලදී. ව්‍යාපෘතියේ කාලසීමාව වන 2005 සිට 2010 දක්වා පහත දක්වා ඇති ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම තුලින් ද්විතියික අධ්‍යාපන ක්‍රමය නවීකරණය කිරීමට අපේක්ෂිතය.



(අ) පාසල් 1200 ක පහසුකම් වැඩි දියුණු කිරීම. (ආ) නව පරිගණක පුහුණු මධ්‍යස්ථාන 351 ක්, විද්‍යාගාර 69 ක් කාර්මික වැඩහල් 34 ක්, බහු මාධ්‍ය මධ්‍යස්ථාන 115 ක් හා පුස්තකාල 30 ක් ඉදිකිරීම. (ඇ) පාසල් 35 ක් සඳහා විදුලිබල පහසුකම් ලබා දීම, පාසල් 136 ක් සඳහා ජල සැපයුම් හා පාසල් 345 ක් සඳහා සනීපාරක්ෂණ පහසුකම් ලබා දීම. (ඈ) කලාප හා පළාත් අධ්‍යාපන කාර්යාල සවිබල ගැන්වීම, සිසුන් 50000 ක් සඳහා උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ලබා දීම සහ ජාතික ඇගයීම් සේවාව විධිමත් හා වැඩි දියුණු කිරීමටද අපේක්ෂිතය. (ඉ) පාසල් විෂය මාලාව නවීකරණය කිරීම හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ධාරිතාවය වර්ධනය කිරීම. (ර) පරිගණක පුහුණු මධ්‍යස්ථාන, විද්‍යාගාර, බහු මාධ්‍ය ඒකක ඉදිකිරීම් කටයුතු හා පාසල් සඳහා විදුලිබල සැපයුම් ලබා දීම මේ වන විට සම්පූර්ණ කර ඇති අතර, අනෙකුත් ක්‍රියාකාරකම් සාර්ථක ලෙස ක්‍රියාත්මක කෙරෙමින් පවති.

## වතුකරයේ පාසල් පුනුරුත්ථාපනය හා අධ්‍යාපනය ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය - RIERP Project

1948 වර්ෂයේ නිදහස ලැබීමෙන් පසුව විටින් විට බලයට පත්වූ, රජයන් ගුණාත්මක හා ප්‍රමාණාත්මක වශයෙන් අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම සඳහා ඉහල ප්‍රමුඛත්වයක් ලබා දී ඇති අතර, ප්‍රධාන වශයෙන් රජයේ සම්පත් තුලින් මෙන්ම විදේශාධාර මගින්ද වතු පාසල් සහ වතු පාසල් සිසුන් සඳහා සම්පාදනය කෙරෙන අරමුදල් වැඩි කරන ලදී. 1986 වර්ෂයේදී වතු පාසල් සංවර්ධනය කිරීම සඳහා සිව් අවුරුදු සාලැස්මකට ශ්‍රී ලංකා සහ ස්වීඩන් රජයන් අතර ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම මැදිහත්වීම වැවිලිකරයේ පාසල් 833 කින් 420 කට ගුණාත්මක වශයෙන් මෙන්ම ප්‍රමාණාත්මක වත් අධ්‍යාපනය තුළ ඉමහත් බලපෑමක් ඇති කළ අතර, වරප්‍රසාද ලැබීමේදී නාගරික හා ග්‍රාමීය පරතරය බොහෝ සේ අඩු කිරීමටද බලපා ඇත.



ගලහා තිරුවාවිලුවර් දෙමළ විදුහලේ නව ගොඩනැගිල්ල




පැසැල් සිසුන් නඩත්තු කටයුතු සඳහා දායක වීම

මෙකී සංවර්ධන ප්‍රයත්නයන්හි ධනාත්මක ප්‍රතිඵල තිරසාර ලෙස පවත්වාගෙන යාමට නොහැකි දුර්වල ආයතනික ධාරිතාව, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ සෑම මට්ටමකම විශේෂයෙන් වැවිලි කරයේ පාසල් පද්ධතිය තුළ පාසල් පහසුකම් නොමැතිවීම, නඩත්තු ප්‍රතිපත්ති හා පිලිවෙත් නොමැතිවීම හේතුවෙන් අධ්‍යාපන අංශයේ පමණක් විසඳිය නොහැකි සීමාකාරක පැනවී ඇත. සමස්තයක් වශයෙන් වැවිලි ප්‍රජාව බල ගැන්වීම සඳහා පුළුල් සමාජ, ආර්ථික හා සංස්කෘතික සංවර්ධන වැඩ සටහන් අවශ්‍යවේ. 1997 වර්ෂයේ වතු පාසැල් 833 න් 420 ක අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අත්‍යාවශ්‍ය පහසුකම් සැපයීම අරමුණු කර ගෙන 2004 වර්ෂයේදී ස්විඩන් රජය වෙතින් පාසල් පහසුකම් පුනරුත්ථාපනය කිරීම සහ සෑම මට්ටමකම අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක භාවය වර්ධනය කිරීම සඳහා සැහැල්ලු කොන්දේසි මත ස්වීඩන ක්‍රෝන මිලියන 45 ක ණය මුදලක් ලබාදෙන ලදී. මෙමගින් වතුකරයේ පාසල් පුනුරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය බල ගැන්විනි. (RIERP)

මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ අධ්‍යාපනයේ මූලික අවධිය සර්වව්‍යාප්තිකරණය කිරීම වතුකරයේ පාසල් සිසුන්ගේ කාර්යසාධනය පෙළඹවීම තුළින් ඉහළ මට්ටමකට ගෙනඒම, සහ වතු ජනතාව අතර ඉහළ මට්ටමේ තෘප්තියක් ඇතිකරවීමය. ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් අතර පාසල් ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය ඉඩම් ලබාදීම, යටිතල පහසුකම් සැපයීම සහ තිරසාරභාවය පවත්වාගෙන යෑම සඳහා පෙළගැස්වීම වේ.

**ව්‍යාපෘතිය මඟින් ආවරණය වන ප්‍රදේශ**

| පළාත | දිස්ත්‍රික්කය | පාසැල් සංඛ්‍යාව |
|---|---|---|
| මධ්‍යම | නුවර එළිය | 159 |
| | මහනුවර | 86 |
| | මාතලේ | 34 |
| සබරගමුව | රත්නපුර | 45 |
| ඌව | බදුල්ල | 44 |
| බස්නාහිර | කළුතර | 41 |
| | කොළඹ | 06 |
| දකුණ | ගාල්ල | 05 |
| **එකතුව** | | **420** |

## දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව විසින් ශ්‍රී ලංකාවේ පශ්චාත් ද්විතීයික අධ්‍යාපනික ව්‍යුහය නවීකරණය සඳහා ඇ. එ. ජ. ඩොලර් මිලියන 50 ක ණය මුදලක් ප්‍රදානය කර ඇත. මේ තුලින් ඉහළ ගුණාත්වයෙන් යුතු හා රැකියා වෙළඳපොල ඉලක්ක කරන ලද ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලා අන්තර් ජාලය ඔස්සේ පිරිනැමීමට අපේක්ෂිතයි.

මෙම ව්‍යාපෘතිය යටතේ අඛණ්ඩ හා තිරසාර දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදයක් සකස් කෙරෙනු ඇති අතර ව්‍යාපෘතිය නිමවීමෙන් පසුවද රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පශ්චාත් ද්විතියික අධ්‍යාපන ආයතනයන්ගේ දායකත්වයෙන් මෙය තවදුරටත් ක්‍රියාත්මක කිරීමට යෝජිතය. ඵලදායක ලෙස දුරස්ථ හා විවෘත අධ්‍යාපන පාඨමාලා සැලසුම් කිරීම සහ පිරිනැමීම සඳහා අතිනවීන තාක්ෂණයෙන් යුක්ත දුරස්ථ පිවිසුම් මධ්‍යස්ථාන 150 ක් රටපුරා ස්ථාපිත කෙරෙනු ඇති අතර එයට අමතරව ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය සවිබල ගැන්වීම සඳහා එහි කාර්ය මණ්ඩලය නූතන අධ්‍යාපනික ක්ෂේත්‍රයන් ඔස්සේ පුහුණු කෙරෙනු ඇත.

මේ වනවිට විවෘත විශ්ව විද්‍යාලයේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන 05 ක් සහ අධ්‍යයන මධස්ථාන 03 ක් ඉදිකර ඇති අතර තවත් මධ්‍යස්ථාන 09 ක් වැඩි දියුණු කෙරෙමින් පවති. වර්ෂයකදී සිසුන් 30,000 ක් සඳහා බාහිර උපාධි පාඨමාලා හැදෑරීම සඳහා දුරස්ථ අධ්‍යාපන ක්‍රමය යටතේ අවස්ථාව සැලසීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.



ජාල පිවිසුම් මධ්‍යස්ථානය (NAC) - මොණරාගල

## ශ්‍රී ලංකාවේ අග්නිදිග විශ්ව විද්‍යාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - පළමු අදියර

අම්පාර දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ අත්‍යාවශ්‍ය අධ්‍යයන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා ප්‍රාදේශීය මෙන්ම ජාතික අවශ්‍යතා පිළිබිඹු කෙරෙන පරිදි පවතින ඉල්ලුමට සරිලන නව උපාධි වැඩ සටහන් හඳුන්වාදීම සහ එමගින් ශ්‍රී ලංකාවේ සමාජයීය හා ආර්ථික සංවර්ධනයෙහිලා සහාය වීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. මෙම ව්‍යාපෘතිය මඟින් ඉස්ලාමීය අධ්‍යයන හා අරාබි භාෂා පීඨය, තොරතුරු තාක්ෂණ පීඨය, ආචාර්ය සහ ශිෂ්‍ය නේවාසිකාගාර, භෝජනාගාරය සහ ශිෂ්‍ය සංගම් මධ්‍යස්ථානය හා සෞඛ්‍ය මධ්‍යස්ථාන සඳහා ගොඩනැගිලි ඉදි කිරීමටත් අවශ්‍ය පහසුකම් සැපයීමට මෙන්ම ක්‍රීඩා කටයුතු සඳහා පහසුකම් හා උපකරණ සැපයීමත් සිදු කෙරේ.

මෙම ව්‍යාපෘතිය සඳහා සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල මගින් කුවේට් ඩිනාර් මිලියන 2 ක (දළ වශයෙන් ඇ. ඩො. මි. 7 ක් හෝ රුපියල් මිලියන 770) ක සහනදායි ණය මුදලක් ලබාදී ඇත.

## උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ අදාලත්වය හා ගුණාත්මක බව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ අදාලත්වය හා එහි ගුණාත්මක බව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය මඟින් (අ) තෘතීයික අධ්‍යාපන පද්ධතිය තුළ ආයතනික හැකියාවන් ගොඩනැගීම සහ (ආ) කාර්ය සාධන වේගවත් කිරීම සඳහා හැකියාවන් පෙන්නුම් කරන ලද තෝරා ගත් උපාධි වැඩසටහන් වල අදාලත්වය හා ගුණාත්මක බව වැඩි දියුණු කිරීම යන කරුණු අරමුණු කොට ගනී. මෙහි පළමු සංරචකය යටතේ උපාය මාර්ග සැළසුම්කරණය සම්බන්ධයෙන් ජාතික ධාරිතාව ශක්තිමත් කිරීම, තත්ත්ව සහතික ක්‍රමයක් ස්ථාපනය කිරීම තෘතීයික අධ්‍යාපන ආයතනවල කළමනාකරණය ශක්තිමත් කිරීම, අධීක්ෂණය හා ඇගයීම වැඩි දියුණු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය රජයට සහාය වෙයි. මෙහි දෙවන සංරචකය යටතේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීමේ අරමුදලක් ස්ථාපිත කොට එමඟින් කාර්ය මණ්ඩල සංවර්ධනය, විද්‍යාගාර හා පන්ති කාමර සඳහා උපකරණ සැපයීම, ඉගැන්වීම් හා පර්යේෂණ කටයුතුවල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රදාන ලබා දීම, භෞතික පහසුකම් පුනරුත්ථාපනය සහ පෙළපොත්, සඟරා සහ පුස්තකාල පොත් ලබා දීම ආදී කටයුතු වලට සහාය දෙනු ලැබේ. පූර්ණ කාලීන උපාධි වැඩසටහන් සම්පාදනය කරනු ලබන ශ්‍රී ලංකාවේ සියළුම විශ්වවිද්‍යාලවලට මෙම ව්‍යාපෘතිය මඟින් සහය ලබා දෙනු ඇත. නවීන විශ්ව ආර්ථික දැනුම පිළිබඳ අභියෝග ජයගැනීම සඳහා උපාධි අධ්‍යාපන ක්‍රම සවිමත් කිරීමේ අරමුණින් ප්‍රතිපත්ති විශ්ලේෂණ හා පර්යේෂණ කටයුතු සිදු කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට සහාය වීම ද මෙම ව්‍යාපෘතියේ තවත් අරමුණකි.




## තාක්ෂණික අධ්‍යාපනය හා පුහුණු කටයුතු ශක්තිමත් කිරීම සඳහා වන ජපන් ශ්‍රී ලංකා තාක්ෂණ විදුහල

ශ්‍රම වෙළඳපළ ඉල්ලුම සපුරාලනු වස් මරදාන කාර්මික විද්‍යාලයේ ශ්‍රම පුහුණු කටයුතු වල ගුණාත්මක භාවය ඉහළ නැංවීමේ අරමුණින් ජපන් රජයේ තාක්ෂණ සහයෝගිතා වැඩසටහන යටතේ ඇ. ඩො. මිලියන 05 ක ප්‍රදානයක් ලබා දී ඇත. ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ (JICA) තාක්ෂණික සහයෝගිත්වයෙන් මරදාන කාර්මික විද්‍යාලයේ යාන්ත්‍රික විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මෙන්ම ලෝහ වැඩ සම්බන්ධ ආදර්ශ පාඨමාලා ස්ථාපිත කිරීම හා පැවැත්වීමට අපේක්ෂා කෙරේ.



ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය මගින් යෝජිත ආදර්ශ පුහුණු පාඨමාලා ස්ථාපනය කිරීමට හා මෙහෙයවීම සඳහා අවශ්‍ය උපකරණ හා පුහුණු කරවීමේ කාර්ය මණ්ඩල ඇතුළු අවශ්‍ය යටිතල පහසුකම් හා රැකියා සඳහා මග පෙන්වීමේ මධ්‍යස්ථානයක්ද ලබා දෙනු ඇත.

එපමණක් නොව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ හා තාක්ෂණික ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහාත් මෙම ව්‍යාපෘතිය මගින් ආධාර ලබාදෙනු ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ලද දැනුම හා පළපුරුද්ද උපයෝගී කරගනිමින් ජාතික වෘත්තීය සුදුසුකම් පිළිබඳ ආදර්ශ පාඨමාලා හඳුන්වා දීමට හා ඒ ඒ පළාත්වල තාක්ෂණික විද්‍යාල ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වේ. මෙම ව්‍යාපෘතිය 2010 ජූනි වන විට සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ.

## කාර්මික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය 2006 වර්ෂයේ ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ නිම කරන ලද නිපුනතා සංවර්ධන ව්‍යාපෘතියේ දෙවන අදියර ලෙස ආරම්භ වූ අතර ආසියානු සංවර්ධන බැංකුව මේ සඳහා ලබා දී ඇති මුදල ඇ. එ. ජ. ඩොලර් මිලියන 21 වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ ලෙස නූතන රැකියා වෙළඳපොල අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ගැලපෙන ඉහල වෘත්තිය නිපුනතාවයන්ගෙන් යුතු මධ්‍යම මට්ටමේ මානව සම්පත් සංවර්ධනය කිරීම දක්වා ඇති අතර ව්‍යාපෘතියේ විශේෂිත ඉලක්ක කණ්ඩායම පාසල් හැරයන තරුණ පිරිස වේ.

කාර්මික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අනුරාධපුරය, මරදාන, කුරුණෑගල, මහනුවර, බදුල්ල සහ රත්නපුර කාර්මික විද්‍යාල, තාක්ෂණික විද්‍යාල ලෙස වැඩි දියුණු කෙරෙනු ඇති අතර ඒ තුලින් නවීන තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලා සහ යෝජිත වෘත්තිය තාක්ෂණික විශ්ව විද්‍යාලයට පිවිසීම සඳහා වූ අ.පො.ස. උසස් පෙල සුදුසුකමට සමාන්තර 'ජාතික වෘත්තීය සුදුසුකම' සහතික පත්‍රය ලබාදෙනු ඇත.

යෝජිත වෘත්තීය තාක්ෂණික විශ්ව විද්‍යාලය මගින් පැවැත්වීමට අපේක්ෂිත තාක්ෂණ විද්‍යාවේදි හා අධ්‍යාපන තාක්ෂණ විද්‍යාවේදි පාඨමාලා සඳහා වසරකට සිසුන් 600 ක් පූර්ණකාලීන පදනමෙන් හා තවත් සිසුන් 600 ක් අර්ධ කාලීන පදනමෙන් බඳවා ගැනීමට යෝජිතය.



කාර්මික වැඩහලක්

## වෘත්තීය අධ්‍යාපනය

වෘත්තීය අධ්‍යාපන වැඩසටහනට පාසැල් නවයක් ඉදි කිරීම අයත් වන අතර ඉන් පාසැල් දෙකක් ප්‍රායෝගික හෝ තාක්ෂණික විෂයික නම්‍ය සංවර්ධනයක් සහිත පරිසර හිතකාමී නිර්මාණ හා පද්ධති වලින් සමන්විත ඒවා වේ.



ඇමෙරිකා එක්සත් ජනපදය සුනාමි සහන හා පුනරුත්ථාපන වැඩ සටහන යටතේ ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) හරහා ඇ. ඩො. මිලියන 18 ක ප්‍රදානක් ලබා දෙයි. සවිමත් රාජ්‍ය පෞද්ගලික හවුල් සබඳතාවයන් ඇති කිරීම, පුහුණු වැඩ සටහන් විශේෂයෙන්ම ඉල්ලුම පෙරදැරිකර ගත් ඉදිකිරීම් ව්‍යාපාර හා සංචාරක ව්‍යාපාරය මෙන්ම ආර්ථිකය යළිගොඩ නැගීමට හා පුනර්ජීවය කිරීමට අත්‍යවශ්‍ය තොරතුරු තාක්ෂණ හා ඉංග්‍රිසි භාෂා නිපුනත්වය ලබා දීමේ අරමුණ වෙත යළි යොමු කිරීම මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ. එමෙන්ම වර්ධනය වෙමින් පවතින ආර්ථිකයේ අවශ්‍යතාවයන්ට සරිලන විෂයධාර සංවර්ධන සහාය වෘත්තීය නිපුනතා ද මෙම විශේෂාංගයට ඇතුළත් වේ. පෞද්ගලික අංශයේ සහභාගිත්වය තුළින් පුහුණු කටයුතු ඉල්ලුමට සරිලන අන්දමින් සිදු කිරීම සහතික වේ. පාසැල් නවයේම ඉදිකිරීම් වැඩ කෙරෙමින් පවතී. ඇතැම් පාසැල් බිම් මට්ටමේ සිට ඉදි කෙරෙන අතර ඇතැම් ඒවායේ පවතින ව්‍යුහය උත්ශ්‍රේණිගත කෙරේ. පරිපාලකයන් මෙන්ම ගුරුවරු පුහුණු කිරීම 2008 ජනවාරි මස සිට ආරම්භ කිරීමට නියමිතය. මෙම ව්‍යාපෘතිය 2008 මැද භාගය වන විට නිම කිරීමට සැළසුම් කර ඇත.

## නියාගම ජාතික වෘත්තිය මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

වෙනස් වන වෙළඳපල තත්වයන්ට සහ සමාජ සංවර්ධන අවශ්‍යතාවන්ට සරිලන පරිදි මානව සම්පත් සංවර්ධනය කිරීමේ අරමුනින් වෘත්තිය පුහුණු පහසුකම් සැපයිම ව්‍යාපෘතියේ අරමුණ වේ. එසේම පවතින රැකියා ඉල්ලුමට සරිලන වෘත්තිය පුහුණු වැඩසටහන් මගින් විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශ වල දුප්පත්කම දුරු කිරීමටත් රැකියා විරහිත තරුණ තරුණියන්ගේ සේවා නියුක්තියට අවශ්‍ය දැණුම සහ ස්වයං සේවා නියුක්තියට අවශ්‍ය දැණුම ලබා දීමත් ව්‍යාපෘතියේ අරමුණ වේ.

ව්‍යාපෘතිය සඳහා කොරියානු රජය විසින් කොරියානු එක්සිම් බැංකුව හරහා ඇමෙරිකානු ඩොලර් මිලියන 8.78 සහනදායි ණය මුදලක් ලබා දී ඇත. මෙම ව්‍යාපෘතිය 2007 ආරම්භ කල අතර එය 2009 දි නිම කිරීමට අපේක්ෂිතය.

# මානව සම්පත් සංවර්ධනය



## සෞඛ්‍යය

## 2.2.2. සෞඛ්‍යය

සෞඛ්‍ය අංශයේ දර්ශනය වනුයේ ජාතියේ ආර්ථික, සාමාජීය, මානසික හා අධ්‍යාත්මික සුභසාධනය සඳහා දායකවන්නා වූ නිරෝගී ජනතාවක් පෝෂනය කිරීමය. අඩු ආදායම් ලාභීන් හා සමාජයේ ඉතාමත් පහසුවෙන් පීඩාවට ලක්වන ජනකොටස් කෙරෙහි විශේෂයෙන් අවධාරණය කරමින්, පරිපූර්ණ ගුණාත්මක භාවයෙන් ඉහල, පිරිවැය ඵලදායි, තිරසාර හා නූතන සෞඛ්‍ය රක්ෂණ සේවයට සැමට ප්‍රවේශ වීම, කෙරෙහි සහතික වීම සෞඛ්‍ය අංශයේ මධ්‍යකාලීන සංවර්ධන වැඩපිළිවෙලෙහි ප්‍රධාන ඉලක්කය වේ.

### සෞඛ්‍ය අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය

සෞඛ්‍ය අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය මඟින් රෝග වැළැක්වීමේ සේවා සඳහා විශේෂ අවධානය යොමු කරමින් දිස්ත්‍රික්, පළාත් හා ජාතික මට්ටමේ සෞඛ්‍යාරක්ෂණ සේවාවන්හි කාර්යක්ෂමතාව හා සමානාත්මතාව වැඩි දියුණු කරනු ඇත. මෙම ව්‍යාපෘතිය සෞඛ්‍ය ආරකෂණ හා පෝෂණ අමාත්‍යාංශය සහ මුදල් කොමිසම විසින් ක්‍රියාත්මක කරනු ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රමිතියක් සහිත සායන ක්‍රියාත්මක කිරීමට හා උසස් තත්තවයෙන් යුත් සායන සේවාවන් ලබා දීමට උපකාරයක් ලෙස රෝහල්වල කාර්යක්ෂමතාව හා තත්තවය උසස් කිරීමට සායනික මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. බෝ නොවන රෝග වලින් ඇති වන තර්ජනය මැඩ පැවැත්වීම සඳහා සමාජයේ විවිධ මට්ටම් වල ජනතාවට සෞඛ්‍ය සම්පන්න පුරුදු පුහුණු කිරීම සඳහා සමාජය දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා කාර්යක්ෂම ප්‍රචාරක වැඩසටහන් සැළසුම් කෙරෙමින් පවතී. මහජන සෞඛ්‍ය සේවා ලබා ගැනීමට දුෂ්කරතා ඇති පිරිස් වෙත එම සේවා ලබා දීම සඳහා ක්ෂේත්‍ර නිළධාරීන් හට පරිගණක, මොටර් රථ හා යතුරු පැදි ආදී භෞතික සම්පත් ලබා දී ඇත. කොළඹ නගර සභාව තුළ හා දකුණු පළාතේ රෝහල් තුනක සෞඛ්‍ය අපද්‍රව්‍ය කළමණාකරණ වැඩසටහන් සඳහා ද මෙම ව්‍යාපෘතිය මඟින් සහයෝගය ලබා දී ඇත.





### කුරුළු උණ සඳහා සූදානම් වීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවට ඇති විය හැකි කුරුළු උණ තර්ජනයට මුහුණදීමේ ඇති වැදගත්කම සළකා කුරුළු උණ සඳහා සූදානම් වීමේ ව්‍යාපෘතියට සෞඛ්‍ය අංශයේ සංවර්ධන ව්‍යාපෘතියෙන් ඇ.එ.ජ.ඩො. මිලියන 3.5 ක් වෙන්

කර ඇත. මෙම ව්‍යාපෘතිය මගින් මහජන සෞඛ්‍ය වැඩසටහන් සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය, ජාතික මහජන සෞඛ්‍ය සුපරීක්ෂාකාර වැඩසටහන් ශක්තිමත් කිරීම හා සෞඛ්‍ය වැඩසටහන්හි ප්‍රතිචාර දැක්වීමේ ධාරිතාවය වැඩිදියුණු කිරීම මගින් කුරුළු උණ මැඩ පැවැත්වීම සඳහා සැළසුම් සකස් කෙරෙනු ඇත. තවදුරටත් කුරුළු උණ තර්ජනයට හොඳින් මුහුණ දීම සඳහා ප්‍රචාරක ක්‍රමෝපායන් හඳුන්වා දෙනු ඇත.

## යාපනය සහ අනුරාධපුර ශික්ෂණ රෝහල් වැඩි දියුණු කිරීම



අනුරාධපුර රෝහලේ යෝජිත නව ගොඩනැගිල්ල

යාපනය සහ අනුරාධපුර ශික්ෂණ රෝහල් සංවර්ධනය කිරීම සඳහා ආධාර ප්‍රදානයන් ලබා දීමට ජපන් රජය විසින් එකඟ වී ඇත.

යාපනය ශික්ෂණ රෝහලේ මධ්‍යම කාර්යයන් වැඩි දියුණු කිරීම සඳහා ඉවහල් වන හදිසි අනතුරු, ස්නායු පද්ධති, හෘද චිකිත්සක සහ මධ්‍යම සේවා හා ජීවානුහරණ ඒකකයන් ඇතුළත් ශල්‍යාගාර සංකීර්ණයක් ස්ථාපිත කිරීමට හැකිවන පරිදි වර්ග මීටර් 6,870 කින් යුත් සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම හා එම ඒකකයන් සඳහා අවශ්‍ය වන වෛද්‍ය උපකරණ සැපයීමට ඉලක්ක කර ඇත. මෙම ව්‍යාපෘතියෙන් උතුරු පළාතේ ජීවත් වන ජනතාවට තෘතීය සහ විශ්වාසවන්ත වෛද්‍ය සේවා පහසුකම් ලබා දීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ සවිස්තරාත්මක සැලසුම් දැනටමත් පිළියෙල කර ඇති අතර ප්‍රදේශයේ ආරක්ෂක තත්වය යහපත් වූ පසු ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂිතය.

අනුරාධපුර ශික්ෂණ රෝහලේ සුවකාරක වෛද්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ඉවහල් වන නාරි සහ ප්‍රසව වෛද්‍ය ශල්‍යාගාර, දැඩි සත්කාර ඒකකයකින් සමන්විත වන ළමා වෛද්‍ය ඒකකයක් සහ අංග සම්පූර්ණ බාහිර රෝගී ප්‍රතිකාර ඒකකයක් ස්ථාපිත කිරීමට හැකිවන පරිදි වර්ග මීටර 8,000 කින් පමණ යුත් සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අපේක්ෂා කෙරේ. මේ සඳහා වූ මූලික සැලසුම් දැනටමත් සකස් කර ඇති අතර සවිස්තරාත්මක සැලසුම් සකස් කිරීම 2008 වසරේ මුල් භාගයේදී සිදු කිරීමට නියමිතය.

## කොරියානු ශ්‍රී ලංකා මිත්‍රත්ව රෝහල ඉදි කිරීම

නාගරික සංවර්ධන අධිකාරිය මාතර නගර පුනරුද වැඩ සටහන සමඟ මාතර මහා නාගරික සැලසුම දැනටමත් නිම කර ඇති අතර ඒ මගින් මාතර මහ රෝහල වෙනත් ප්‍රදේශයක ස්ථානගත කිරීමට සැලසුම් කරන ලදි. දැනට මෙම රෝහල පහසුවෙන් ගංවතුර තත්වයකට ගොදුරු විය හැකි ස්ථානයක පිහිටා ඇති අතර සුනාමි ව්‍යසනයෙන් එයට දැඩිව හානි ඇති විය. එසේම මෙම රෝහල තව දුරටත් ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රමාණවත් භූමි ප්‍රමානයක් එහි නොමැත. මේ නිසා මාතර ප්‍රදේශයේ ජනතාවට සහන සැලසීමේ අරමුනින් මාතර දිස්ත්‍රික්කයේ නවීන

පහසුකම් සහිත අංග සම්පූර්න රෝහලක් ඉදි කිරිමට සැලසුම් කරන ලදි. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය මාතර දිස්ත්‍රික්කයේ ගොඩගම ප්‍රදේශයේ දැනටමත් අක්කර 30 ක භූමි ප්‍රදේශයක් මෙම රෝහල ඉදි කිරිම සදහා ලබා ගෙන ඇත.

රෝහල ඉදිකිරිමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත දල වියදම රුපියල් මිලියන 6100 ක් පමණ වේ. මෙම වියදමෙන් රුපියල් මිලියන 670 ක් කොරියානු රජය ප්‍රදානයක් වශයෙන් ලබා දී ඇත. එම මුදල උපයෝගි කරගෙන ඇදන් 276 ක් සහිත මහල් 3 කින් යුක්ත රෝහල් ගොඩනැගිල්ලක් ඉදි කිරිමට නියමිත අතර ඒ සදහා අවශ්‍ය සියලුම උපකරණ ද මෙම ප්‍රදානය යටතේ ලබා දෙනු ඇත. මෙම රෝහල ඉදි කිරිමේ මූලික කටයුතු දැනටමත් ආරම්භ කර ඇති අතර 2009 වන විට මෙම ව්‍යාපෘතිය නිම කිරිමට අපේක්ෂිතය.

## කොළඹ මහ රෝහලේ නව ස්නායු ප්‍රතිකාර ඒකකයක් ඉදි කිරිමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ කොළඹ මහ රෝහල පරිශ්‍රය තුල නව ඒකක දෙකක් ස්ථාපිත කිරිම තුලින් හිසෙහි සහ සුෂුම්නාවේ ආබාධ සහිත වූ රෝගින්ට වෛද්‍ය ප්‍රතිකාර සේවා සැපයිම හා රුධිර පාරවිලයන පහසුකම් සැලසීමයි. මෙම ආධාර යටතේ ශල්‍යාගාරයක්, දැඩි සත්කාර ඒකකයක්, ඉහල මට්ටමේ ආධාර ඒකකයක්, කශේරුකා හා ස්නායු ශල්‍ය වෛද්‍ය ඒකකයක් හා වාට්ටු ආදියද ඒ හා සම්බන්ධ වෛද්‍ය උපකරණ සැපයිම ද සිදු කෙරේ. ඒ අනුව වගී මීටර 11,000 ක වපසරියකින් යුත් මහල් හතක නව ගොඩනැගිල්ලක් ඉදි කෙරෙනු ඇත. මෙම ව්‍යාපෘතිය සදහා ඇස්තමේන්තු ගත වියදම ඩොලර් මිලියන 15 ක් වන අතර සංවර්ධනය සදහා වු සෞදි අරමුදල මගින් සහනදායි ණය කොන්දේසි යටතේ එය ලබා දී ඇත. මෙම ව්‍යාපෘතිය 2002 වර්ෂයේ ආරම්භ වු අතර එය 2008 වර්ෂයේ මුල් කාර්තුවේ දී නිම කිරිමට අපේක්ෂිතය. මීට අමතරව අපස්මාර රෝහල ස්ථාපිත කිරිමේ ව්‍යාපෘතිය සදහා ඇමෙරිකානු ඩොලර් මිලියන 20 ක ණය ආධාරයක්



**ඉදි කෙරෙමින් පවතින කොළඹ මහ රෝහලේ නව ස්නායු ප්‍රතිකාර ඒකකය**

ලබා ගැනිම සදහා සංවර්ධනය සදහා වූ සෞදි අරමුදලත් සමග දැනටමත් සාකච්ඡා අවසන් කොට ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ අපස්මාර වෛද්‍ය සත්කාර සේවා සම්පාදනය සදහා ඇදන් 242 කින් යුත් රෝහලක්, දැඩි සත්කාර ඒකකයක් හා නේවාසික රෝගි සත්කාරය සදහා අවශ්‍ය සියලුම පහසුකම් සහිත අපස්මාර රෝහලක් ඉදි කිරිමය. මෙම ව්‍යාපෘතිය 2008 වර්ෂයේ මුල් කාර්තුවේ දි ආරම්භ කිරිමට නියමිත අතර එය 2009 වර්ෂයේ නිම කිරිමට අපේක්ෂිතය.

## ජාතික එච්.අයි.වී. ඒඩ්ස් වැළැක්වීමේ ව්‍යාපෘතිය

ලෝක බැංකුව විසින් ජාතික එච්. අයි. වී. ඒඩ්ස් වැළැක්වීමේ ව්‍යාපෘතිය සඳහා ඇ. එ. ජ. ඩොලර් මිලියන 12.6ක ප්‍රදානයක් ලබා දෙන ලදි. මෙම ව්‍යාපෘතිය මඟින් වැඩි අවදානමක් සහිත ජන කොටස් වල සහ සමස්ථ ප්‍රජව තුල ඒඩ්ස් ව්‍යාප්තිය පාලනය කෙරෙනු ඇත. තව ද මේ මඟින් ක්ෂය රෝග පාලන ව්‍යාපෘතිය ශක්තිමත් කිරීමට හා ව්‍යාප්ත කිරීමට සහයෝගය දක්වා ඇත. මේ දක්වා, දේශපාලන නායකත්වය, ප්‍රාදේශීය සභා සාමාජිකයින්, ආගමික නායකයන්, ජනමාධ්‍ය, සාමාජීය නායකයන්, පාසල් ළමුන්, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, ජාතික තරුණ සේවා සභාව, ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යංශය, කම්කරුවන්, ධීවර ජනතාව, ජාතික ළමා සුරැකුම් අධිකාරිය හා යුධ හමුදාව සඳහා දැනුවත් කිරීම් හා ඉගැන්වීමේ වැඩසටහන් විශාල වශයෙන් පවත්වා ඇත.

# මානව සම්පත් සංවර්ධනය

## විදේශ පුහුණු

## 2.2.3. විදේශ පුහුණු

බහුපාර්ශවික හා ද්විපාර්ශවික ප්‍රදායකයින් විසින් මානව සම්පත් සංවර්ධනය සඳහා දෙනු ලබන විදේශ පුහුණු අවස්ථා සම්බන්ධීකරණය කිරීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සතු වගකීමකි. රටේ මානව සම්පත් ධාරිතාව ඉහළ නැංවීමේලා මෙකී පුහුණු අවස්ථා මගින් ඉමහත් ප්‍රතිලාභ ගෙන දෙනු ඇත.

දැනට තාක්ෂණික ආධාර වැඩසටහන යටතේ ශ්‍රී ලංකා රජයට වාර්ෂිකව විදේශ ශිෂ්‍යත්ව 700 ක් පමණ ලැබේ. දීර්ඝ කාලීන හා කෙටි කාලීන දෙවදැරුම් පුහුණු වැඩසටහන් අයත්වෙන අතර ඉන් 7% ක් පමණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා හා විද්‍යාවේදී උපාධි වැඩසටනහන් දක්වා දිවෙන දිගුකාලීන (අට මසක් හෝ ඊට වැඩි කාලසීමාවක) පුහුණු වැඩසටහන් වේ. සංවර්ධන පරිපාලනය, රාජ්‍ය ප්‍රතිපත්ති, කෘෂිකර්මාන්තය, පශු සම්පත්, තොරතුරු තාක්ෂණය, පාලනය, පාරිසරික කටයුතු, වාරිමාර්ග හා මානව සම්පත් සංවර්ධනය මෙහිලා ප්‍රධාන විදේශ පුහුණු ක්ෂේත්‍රයන් වශයෙන් ගැනේ.

ජපන් රජය ප්‍රධාන පුහුණු වැඩසටහන් සම්පාදක වන අතර එමගින් ලැබෙන වැඩසටහන්වල කාලසීමාව සති එකේ සිට හය මස දක්වා වෙනස් වේ. ජපන් රජය මෙම පුහුණු වැඩසටහන්වලින් වැය ප්‍රමාණයක් (JICA) ජපන් ජාත්‍යයන්තර සහයෝගිතා ආයතනය හරහා ලබාදෙන අතර කොරියානු රජය (KOICA) කොරියානු ජාත්‍යයන්තර සහයෝගිතා ආයතනය හරහා සිය පුහුණු වැඩසටහන් ලබාදෙයි.

එමෙන්ම ඉන්දියාව කොළඹ ක්‍රමය, හරහාද ස්වීඩන් රජය හරහාද තායිලන්තය, නෙදර්ලන්තය, සිංගප්පූරුව, මැලේසියාව, චීනය, ඕස්ට්‍රේලියාව, ආසියානු සංවර්ධන බැංකුව, ජර්මනිය හා තාක්ෂණික සහයෝගිතා සඳහා වන පොදු රාජ්‍ය මණ්ඩලීය අරමුදල සහ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනය වැනි නියෝජිත ආයතන මගින් ශ්‍රී ලංකාවට විදේශ පුහුණු අවස්ථා ලබාදෙති. 2007 ජනවාරි 01 සිට සැප්තැම්බර් 30 දක්වා ලැබූ විදේශ පුහුණු අවස්ථා පහත දැක්වෙන වගුවෙන් පෙන්නුම් කෙරේ.

ඊට අමතරව තාක්ෂණික සහයෝගිතා වැඩසටහන යටතේ ජපානය, කොරියාව, කැනඩාව හා එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන මගින් ලැබෙන ස්වේච්ඡා සේවා සම්බන්ධීකරණය කිරීමේ වගකීමද විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත පැවරේ. ප්‍රදායක නියෝජිත ආයතන වෙතින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් මත කරනලද සමීක්ෂණවලට අනුව ස්වේච්ඡා සේවකයින් අනුයුක්ත කරනු ඇත. ස්වේච්ඡා පුහුණු ප්‍රධාන ක්ෂේත්‍රයන් වන්නේ විදේශ භාෂා, ක්‍රීඩා, මෝටර්රථ ශිල්පය, ඉංජිනේරු, වෛද්‍ය විද්‍යා, සමාජ සංවර්ධනය, පරිඝණක හා ඉංජිනේරු යනාදිය වේ.

# 2.3

# කෘෂිකර්මය, කර්මාන්ත, පරිසර සංරක්ෂණය සහ ස්වාභාවික සම්පත් කළමනාකරණය



කෘෂිකාර්මික සංවර්ධනය

## 2.3.1. කෘෂිකර්මාන්තය

ඈත අතීතයේ සිට කෘෂිකර්මාන්තය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජීවනෝපාය වේ. එසේ වුව ද මෙම අංශයේ වර්ධනය පහල මට්ටමක පවතී. දිළිඳු ජනතාවගෙන් සියයට 90 ක් පමණ ග්‍රාමීය කෘෂි ආර්ථික ප්‍රදේශවල පදිංචි වී සිටින බැවින් ශ්‍රී ලංකවේ දිළිඳු බව තුරන් කිරීමෙහි ලා කෘෂිකර්මාන්තයේ ඵලදායිතාවය සීඝ්‍රයෙන් වර්ධනය කිරීම මූලික අවශ්‍යතාවය වේ.

එමනිසා පරිසරය, ජලසම්පත් හා ජෛව විවිධත්වය සුරකිමින් ආහාර නිෂ්පාදනය සිඝ්‍රව වර්ධනය කිරිම සඳහා සංවර්ධන උපායමාර්ගයන්හි ඉහල ප්‍රමුඛතාවයක් දීම අවශ්‍යය. කැබලි කරන ලද ඉඩම් උපයෝගී කර ගැනීම, ප්‍රමාණවත් තරම් ජලය, ණය මුදල්, බීජ, තාක්ෂණික ප්‍රායෝගික දැනුම, තාක්ෂණය, අලෙවිය, ගබඩා පහසුකම් නොමැති වීම සහ දුර්වල ප්‍රවාහන පහසුකම්, දුර්වල වගා පිළිවෙත් කෘෂිකර්මාන්තයේ ඵලදායිතාව හීන කිරීමට ඉවහල් වන සාධක වේ. කෘෂිකර්ම අංශය සංවර්ධනය කිරීමෙහිලා රජය මඟින් ලබා දී ඇති ප්‍රමුඛතා අතරට, වැව්ලිකරුවන්ට පුළුල් වෙළඳ පොළට හා වැඩිදියුණු කළ තාක්ෂණයට පිවිසීම පහසුකරලීම සඳහා ප්‍රතිපත්ති සැකසීම, අවශ්‍ය ආරක්ෂණ පියවර සහිත ස්ථායි වාණිජ ප්‍රතිපත්ති සැකසීම හා ග්‍රාම සංවර්ධනය සඳහා ප්‍රාදේශීය වශයෙන් සමාන යටිතල පහසුකම් ලබා දීම ද ඇතුලත්ය.

ක්‍රියාත්මක වෙමින් පවතින ඇතැම් ප්‍රධාන කෘෂි සංවර්ධන ව්‍යාපෘති හා විදේශාධාර යටතේ ඉදිරි කාලයේ මූල්‍යණය සඳහා හඳුනාගෙන ඇති ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

### වළව වම් ඉවුරු වාරිමාර්ග පද්ධතිය පුළුල් කිරීමේ හා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය දෙවන අදියර



පුනරුත්ථාපනය කළ උඩවළව වේල්ලේ වාන් මග

වලව වම් ඉවුරු ප්‍රදේශයේ ඉඩම් හා ජල සම්පත් කාර්යක්ෂම හා ප්‍රශස්ථ අයුරින් ප්‍රයෝජනයට ගැනීම උදෙසා අවස්ථාව සලසා දීම තුළින් ගොවීන්ගේ ආදායම හා ජීවන තත්වය ඉහළ නැංවීමේ අරමුණින් කෘෂි කර්මාන්තයට අවශ්‍ය යටිතල පහසුකම් සැලසීම, අලෙවිකරණය හා සමාජ සංවර්ධනය මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරනු ලබන අතර ගොවි ජනතාව ආර්ථික භෝග නිෂ්පාදනය කිරීම සඳහා දිරිමත් කිරීම ද සිදු කරනු ලැබේ.

ව්‍යාපෘතියේ මූලික පරමාර්ථය වනුයේ වලව ප්‍රදේශයේ ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ නංවමින්, සුවිශේෂ වශයෙන් දක්ෂිණ ප්‍රදේශය සංවර්ධනය කිරීම තුළින් ජාතික කෘෂි නිෂ්පාදනයට දායක වීමය.

වළව වම් ඉවුරේ අළුතින් සංවර්ධනය කෙරෙන වාරිමාර්ග හා ඒ හා ආශ්‍රිත අනෙකුත් පහසුකම් ඉදිකිරීම් මෙම ව්‍යාපෘතියේ කර්තව්‍යයන් වේ.



ප්‍රධාන ඇළ මාර්ගය තවත් කිලෝ මීටර් 19 කින් දීර්ඝ කිරීම ද, ඒ හා ආශ්‍රිත ද්විතීය හා තෘතීය ඇළ මාර්ග කිලෝ මීටර් 490 දක්වා දීර්ඝ කිරීම හා ජලය සැපයිය හැකි නව ඉඩම් හෙක්ටයාර 5,150 ක් සංවර්ධනය කිරීම පිණිස වැව් 65 ක් ඉදිකිරීම ද මේ යටතේ සිදු කෙරේ.



උඩවලව ජලාශයේ ජල පුනරුත්ථාපනය කිරීමට හා මාර්ග, ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රම, විදුලි බලය සැපයුම හා සෞඛ්‍ය අධ්‍යාපනය, තැපැල්, අලෙවිකරණය හා වෙනත් පරිපාලන කටයුතු උදෙසා ගොඩනැගිලි ඉදිකිරීමට ද මෙම අරමුදල් උපයෝගී කොට ගෙන ඇත. "විනාශයෙන් තොර ව්‍යාප්ත කිරීම" යන තේමාව පාදක කොට ව්‍යාපෘතියට යටත් වන ප්‍රදේශයේ ජෛව විවිධත්වය ආරක්ෂා කරමින් පරිසරය සංරක්ෂණය කිරීම ඉහළ ප්‍රමුඛත්වයෙහිලා සලකමින් සංවර්ධන කටයුතු කරගෙන යනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය යටතේ 5,800 ක් පමණ වන ගොවි පවුල් හා 3,150 පමණ ගොවීන් නොවන පවුල් සංඛ්‍යාවක් දැනටමත් පදිංචි කරගෙන යමින් සිටින අතර ගොවි සංවිධානද ශක්තිමත් කෙරේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම සඳහා ජපන් රජය වෙතින් ඇ. ඩො. මිලියන 80 ක ණය ආධාරයක් ලබා දී ඇති අතර ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2008 වසර අවසානයේදී නිම කෙරේ.

## වැවිලි සංවර්ධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ප්‍රාදේශීය වැවිලි සමාගම් වලට බාහිර සාධක වල උපකාරයක් නොමැතිව දීර්ඝකාලීන තිරසාර පැවැත්ම සඳහා අවශ්‍ය පරිසරයක් නිර්මාණය කිරීමයි. එසේම මෙමගින් වැවිලි ක්ෂේත්‍රයේ නියැලි සිටින කම්කරුවන්ට අවශ්‍ය පහසුකම් ලබාදීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් ඔවුන්ගේ ජීවන තත්වය නගා සිටුවීම මෙන්ම වැවිලි සෙක්ත්‍රයේ දීර්ඝ කාලීන පැවැත්ම තහවුරු කිරීමට ද අපේක්ෂිතය. මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව ඇ.ඩො. මිලියන 30 ක හා අන්තර් සහයෝගීතාව පිළිබඳ ජපාන බැංකුව ඇ. ඩො. මිලියන 15 ක මූල්‍යාධාර සපයයි.


මූලික වැවිලි භෝගවල ඵලදායිතාවය වැඩිකිරීම සඳහා වූ ක්‍රියාකාරකම් වලට සහ භෝග විවිධාංගීකරණය සඳහා ප්‍රාදේශීය වැවිලි සමාගම් වලට

සහනදායි පදනම යටතේ මූල්‍ය පහසුකම් සපයා දීම සඳහා ඇ. ඩො. මිලියන 10 ක් වෙන් කර ඇත.

වතු කම්කරුවන්ගේ නිවෙස්වල වහල නැවත සෙවිලි කිරීම අභ්‍යන්තර වතු පාරවල් පුනරුත්ථාපනය, සමාජ සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම, වතු සහ කර්මාන්ත ශාලා වල විවේකාගාර ඉදිකිරීම, ක්‍රීඩා පිටි ඉදිකිරීම ආදී සාමාජීය හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, ද්විත්ව රෝද ට්‍රැක්ටර්, තේ දළු නෙළීමේ යන්ත්‍ර, කුඩා බැකෝ යන්ත්‍ර වැනි වැවිලි ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය ආම්පන්න ලබාදීම මෙම ව්‍යාපෘතිය තුළින් සිදුකෙරේ.

කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීම, වතු සේවක සහයෝගීතාව ශක්තිමත් කිරීම, ගෘහස්ථ මුදල් පාලනය, මත්පැන් සඳහා ඇබ්බැහි වීම හා ණය හරිතතාවය අඩු කිරීම අරමුණුකොටගෙන සමාජ දැනුවත්කිරීමේ වැඩසටහන් මෙම ව්‍යාපෘතිය යටතේ දැනට සිදුකරනු ලබයි.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය වර්ෂ 2010 දී අවසන්වීමට නියමිතය.







## තිරසාර කෘෂිකර්ම ජල කළමණාකරණ ව්‍යාපෘතිය

වියළි කලාපීය ගොවි පවුල් සඳහා සූර්ය බල සූක්ෂම පද්ධති 10,000 ක් ලබා දීම සඳහා කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය විසින් මුල් ව්‍යාපෘති සැලැස්ම සකස් කල අතර ඇස්තමේන්තුගත වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන 28ක් විය. මෙම ව්‍යාපෘතිය අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක කිරීමට තීරණය කෙරුණි. ඒ අනුව පළමු අදියර සඳහා ඔස්ට්‍රේලියානු රජය ඇමරිකානු ඩොලර් මිලියන 14 ක ණය මුදලක් ලබා දුන් අතර ඒ යටතේ සූර්ය බල ජල සූක්ෂම පද්ධති 5000 ක් ස්ථාපනය කරන ලදි. එය 2005 වසරේ ආරම්භ වූ අතර 2007 වර්ෂයේ නිමාවට පත් විය.

ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ ඉතිරි සූර්ය බල ජල සූක්ෂම පද්ධති 5000 වියළි කලාපීය ගොවි පවුල් සඳහා ලබාදීමට නියමිත අතර ඒ සඳහා ඇස්තමේන්තුගත වියදම ඇ. ඩො. මිලියන 16.1 ක් වේ. අදාල ව්‍යාපෘති සැලැස්ම ඔස්ට්‍රේලියානු මූල්‍ය ආධාර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම තුළින් ආහාර බෝග වගා කිරීමේදී ජලය ලබා ගැනීමේ දුෂ්කරතාවයන්ට මුහුණ දී සිටි වියළි කලාපීය ගොවි ජනතාවට මහත් ප්‍රති ලාභයක් අත්වේ. එසේම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම තුළින් වසරකට වගා වාරයන් 2 සිට 3 දක්වා වැඩි කර ගැනීමට හැකියාව ලැබෙන අතර සම්ප්‍රදායික ක්‍රමය හා සසඳන

විට ජලය පාවිච්චි කිරීමේ කාර්යක්ෂමතාවය 90% ක් පමණ ඉහළ යනු ඇත. ඉන්ධන හා විදුලියෙන් ක්‍රියාත්මක වන යන්ත්‍ර හා සැසඳීමේදී මෙහිදී මෙහෙයුම් පිරිවැයක් නොමැති අතර නඩත්තුවද ඉතා පහසුය.




සූර්‍ය ජල සුක්ෂම පද්ධතියක් සවි කිරීම හා සූර්‍ය ජල සුක්ෂම පද්ධතියක් උපයෝගි කරගෙන වගා කරන ලද වගා බිමක්

## කුඩා වැවිලි කර්මාන්ත ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

මෙම වැඩසටහනේ අරමුණ වන්නේ (අ) කුඩා තේ වතු හිමියන්ගේ හා රබර් වවන්නන්ගේ ඉඩම් වල භුක්තිය තහවුරු කිරීම (ආ) වැඩි දියුනු කල පශ්චාත් අස්වනු මෙහෙයුම්, නිශ්පාදන ගබඩා කිරීමේ ක්‍රියාවලිය හා අලෙවිකරණය තුලින් නිශ්පාදකයාගේ ලාභ ප්‍රගුණ කිරීම (ඇ) ග්‍රාමීය මූල්‍යනය හා ණය පහසුකම් වර්ධනය කිරීම හා ව්‍යාප්ත කිරීම (ඈ) කාන්තාවන්ගේ ජීවනෝපාය ඉහළ නැංවිම තුලින් දිළිදු බව තුරන් කිරීම හා (ඉ) ප්‍රතිලාභින්ගේ ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම හා සාකච්ඡා මගින් සම්මුති වලට එළඹීමේ හැකියාව සවිමත් කිරීමයි. මෙම ව්‍යාපෘතිය මධ්‍යම ප්‍රදේශයේ නුවර, කෑගල්ල සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කයන්හි තේ සංවර්ධන කටයුතු හා මොණරාගල දිස්ත්‍රික්කයේ රබර් සංවර්ධන කටයුතු කිරීම යනුවෙන් කොටස් දෙකකින් සමන්විතය. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන 40 ක් පමණ වන අතර එයින් ඇමෙරිකානු ඩොලර් මිලියන 22.5 ක මුදලක් සහනදායි කොන්දේසි මත කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල විසින් ලබා දී ඇත.

# කෘෂිකර්මය, කර්මාන්ත, පරිසර සංරක්ෂණය සහ ස්වාභාවික සම්පත් කළමනාකරණය




## කර්මාන්ත සංවර්ධනය

## 2.3.2. කර්මාන්ත සංවර්ධනය

### කුඩා සහ සුළු කර්මාන්ත නායකත්ව සහ ව්‍යවසායකයින් නංවාලීමේ ව්‍යාපෘතිය (SMILE) - තුන්වන අදියර

කුඩා හා සුළු පරිමාණ කර්මාන්ත සංවර්ධනය සඳහා ඉවහල් වන ප්‍රාග්ධන අවශ්‍යතා සැපයීම වෙනුවෙන් ජපන් රජය විසින් ඇ. ඩො. මිලියන 85 ක ණය ආධාරයක් (යෙන් මිලියන 619) ලබා දී ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ කර්මාන්ත අළුතින් ආරම්භ කිරීමට හෝ දැනට ඇති ව්‍යවසායයන්හි ධාරිතාවය ඉහළ නැංවීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට රුපියල් මිලියන 10 ක් දක්වා අඩු පොලියක් යටතේ ණය ලබා ගත හැකිය. ජපන් රජය විසින් ලබා දුන් ණය මුදලෙන් මේ වන විට 82% ක ප්‍රමාණයක් උපයෝජනය කර ඇති අතර ඉතිරි



මුදල් 2008 වසර අවසාන වන විට උපයෝජනය කිරීමට හැකි වෙතැයි අපේක්ෂා කෙරේ.

### පරිසර හිතකාමී විසඳුම් අරමුදල් ව්‍යාපෘතිය (E-Friends)



මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇ. ඩො. මිලියන 46 ක පමණ ණය ආධාරයක් (යෙන් මිලියන 5,236) ජපන් රජය විසින් ලබා දී ඇත.

මේ යටතේ කර්මාන්තකරුවන්ට තම නිෂ්පාදන ක්‍රියාවලියේදී පරිසරයට සිදුවන හානි අවම කරගැනීම හා පරිසර දූෂණය වැලැක්වීමේ කාර්යයන්ට අවශ්‍ය වන ආයෝජනයන් සම්පාදනය කර ගැනීම උදෙසා අඩු පොළියට රුපියල් මිලියන 50 දක්වා වූ ණය මුදලක් ලබා ගත හැක.

### ග්‍රාමීය මූල්‍ය අංශය සංවර්ධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව ඇ. ඩො. මිලියන 70 ක ණය මුදලක් ණය ගිවිසුම් 03 ක් හරහා ලබා දී ඇත. මේ හරහා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ශක්තිමත් කිරීමට අපේක්ෂා කරන අතර එය එම ආයතන වල හැකියාවන් වර්ධනය කිරීමෙන් හා පරිගණක ජාලගත කිරීම මගින් සිදුවේ. ග්‍රාමීය මූල්‍ය අංශයේ පවතින ගැටළු නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් වැඩසටහන් ණය මගින් සිදුවේ. ව්‍යාපෘති ණය මගින් ග්‍රාමීය මූල්‍ය ආයතන සවිබල ගැන්වීම හා ඒවායේ ව්‍යාපාරික ව්‍යාප්තිය - විහිදුම සපුරාගැනීම සිදු වේ.

ක්ෂුද්‍ර ව්‍යාපාර සඳහා සහනදායී ණය ලබාදීමෙන් ඒවායේ තත්වය උසස් කිරීමට බලාපොරොත්තු වේ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර 30,000 පමණ හා ප්‍රජා උප ව්‍යාපෘතීන් 850 ක් පමණ මේ වනවිට මුල්‍ය පහසුකම් හරහා සෘජු ප්‍රතිලාභ ලබා ඇත.



# කෘෂිකර්මය, කර්මාන්ත, පරිසර සංරක්ෂණය සහ ස්වාභාවික සම්පත් කළමනාකරණය



## ස්වාභාවික සම්පත් කළමනාකරණය සහ පරිසර සංරක්ෂණය

## 2.3.3 පරිසර සංරක්ෂණය

### වන සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව විසින් සපයන ලද ඇ. එ. ජ. ඩොලර් මිලියන 25 ක ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකාවේ වත්මන් සමස්ත වන ආවරණයේ වටිනාකම වැඩි කිරීමට හා තිරසාර පැවැත්ම, සඳහා නව ප්‍රතිපත්ති හා පාලන රාමුවක්, මහජන හා පෞද්ගලික අංශයේ දායකත්වය සහිතව සහභාගිත්ව කළමනාකරණය මඟින් හඳුන්වා දීමට අපේක්ෂිතය.

ව්‍යාපෘතිය වසර 06 ක ක්‍රියාත්මක කාලසීමාව තුල පහත සඳහන් ඉලක්කයන් සපුරා ගැනීමට හැකි වී ඇත. (අ) කිලෝ මීටර් 15000 ක පමණ වනාන්තර ප්‍රදේශ මැන මායිම් සලකුණු කිරීම, විවිධ මහජන දැනුවත් කිරීම් වැඩ සටහන් සහ උපදේශන සේවා සැසි ක්‍රියාත්මක කිරීම. (ආ) හෙක්ටයාර් 3600 පමණ ප්‍රජා පාදක කෘෂි වන වගා සංවර්ධනය, හෙක්ටයාර් 7300 ක දැව වන කලාප වැඩි දියුණු කිරීම, හෙක්ටයාර් 12600 ක සෝදාපාලු වූ වන වගා ප්‍රතිස්ථාපනය, රක්ෂිත වනාන්තර හා ආරක්ෂිත තීරු කළමනාකරණය සහ ප්‍රතිපෝෂණ වන වගාවක් ඇති කිරීම. (ඇ) නුවර එළිය වන විද්‍යායතනය, දිසා වන නිලධාරි හා අඩවි වන නිලධාරී කාර්යාල හා නිල නිවාස ඉදි කිරීම යන කටයුතු ද මේ වන විට ව්‍යාපෘතිය යටතේ සම්පූර්ණ කර ඇත.



නැවත සිදුකළ වන වගාවක්

### රක්ෂිත ප්‍රදේශ කළමනාකරණ සහ වන ජීවී සංරක්ෂණ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාව සතු වටිනා ස්වාභාවික පරිසර සම්පත සහ වන ජීවී විවිධත්වය මතු පරපුර සඳහා ආරක්ෂා කිරීම ව්‍යාපෘතියේ අරමුණ වන අතර ඒ සඳහා සංරක්ෂිත ප්‍රදේශ කළමනාකරණයෙහි දැනට පවතින ආයතනික දුබලතා වෙත අවධානය යොමු කරමින් සවභාවධර්මය පදනම් කර ගත් සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සහ සංරක්ෂිත ප්‍රදේශයන්හි තිරසාර කළමනාකරණය සහතික කිරීමට අපේක්ෂිතයි.

ව්‍යාපෘතිය මඟින් උඩවලවේ, කවුඩුල්ල, හෝර්ටන්තැන්න, රිටිගල, මින්නේරිය, බුන්දල හා වස්ගමුව යන සංරක්ෂිත ප්‍රදේශයන්හි පහසුකම් වැඩි දියුණු කිරීම තුලින් පාරිසරික සංචාරක ව්‍යාපාරය වර්ධනය කිරීම සඳහා කටයුතු සලසා ඇත.



සංචාරක නිකේතනය - උඩවළව

දැනටමත් ව්‍යාපෘතිය මඟින් රිටිගල, වස්ගමුව, හෝර්ටන්තැන්න සහ ශ්‍රී පාද අඩවි රක්ෂිතය යන ප්‍රදේශවල ජෛව විවිධත්ව සමීක්ෂණ සම්පූර්ණ කර ඇති අතර උඩවලවේ, බුන්දල, සහ මින්නේරිය යන වන උද්‍යානවල සංරක්ෂණ කටයුතු, ව්‍යාපෘතියට ලබා දී ඇති දිගුව තුලදී සම්පූර්ණ කිරීමට

සැලසුම් කර ඇත. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරී පුහුණුව, සංරක්ෂිත ප්‍රදේශයන්ට යාබද ගම් වාසින් දැනුවත් කිරීම් වැඩ සටහන් පැවැත්වීම සහ සවභාවික පරිසර පද්ධති කළමනාකරණ ක්‍රියාකාරකම්ද ක්‍රියාත්මක කෙරෙමින් පවති.

## ජලජ සම්පත් සංවර්ධන සහ ගුණාත්මක වර්ධන ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව විසින් ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇති මුදල ඇ. එ. ජ. ඩොලර් මිලියන 22 ක් වේ. මෙම ව්‍යාපෘතිය වෙළඳපොල අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සහ තිරසාර ලෙස අභ්‍යන්තර මිරිදිය මත්ස්‍ය හා ජලජීවී සංවර්ධනය මඟින් ග්‍රාමීය ප්‍රදේශයන්හි දිළිඳු බව දුරලීමේ හා ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා අවශ්‍ය සම්පත් සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක වේ.



**ජලාශ්‍රිත මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා පර්යේෂණ මධ්‍යස්ථානය -පේරාදෙණිය විශ්ව විද්‍යාලය**

මෙයට අමතරව පැලියගොඩ ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිත මධ්‍යම මාලු වෙළඳපොල සංකීර්ණය සඳහා දැනට අඩු ප්‍රගතියක් පෙන්වා ඇති සුලු ණය යෝජනා ක්‍රමය වෙනුවෙන් වෙන් කර ඇති මුදල යොදා ගැනීමටද ආසියානු සංවර්ධන බැංකුව විසින් එකඟතාවය පළකර ඇත. තවද, කුඩා පරිමාණයේ මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන 25 ක් ඉදිකිරීමට සහ හෙක්ටයාර් 14000 ක වපසරියක කුඩා නොසිදෙන වාරි ජලාශ සහ කාලීන ජලාශ සඳහා මත්ස්‍ය බීජ හඳුන්වා දීමට කටයුතු යොදා ඇත. දඹුල්ල, උඩවලවේ හා ඉඟිනියාගල ජලජීවී සංවර්ධන මධ්‍යස්ථාන 03 ක් පුලුල් කිරීම හා පුනරුත්ථාපන කටයුතු සිදුකෙරෙමින් පවතී.

පෞද්ගලික අංශයේද දායකත්වය ඇතිව අපනයනය සඳහා විසිතුරු ජලජ පැලෑටි සකස් කිරීමේ මධ්‍යස්ථානයක් රම්බඩගල්ල ජලජීවී සංවර්ධන මධ්‍යස්ථානය ආශ්‍රිතව



**අභිජනන මධ්‍යස්ථානය - රජවැව**

පිහිටුවා ඇති අතර, ජලාශ්‍රිත මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා පර්යේෂණ මධ්‍යස්ථානයක් පේරාදණිය විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය පීඨයෙන් ස්ථාපනය කර ඇත.



**පැළෑටි සැකසුම් මධ්‍යස්ථානය - රම්බඩගල්ල**

ජාතික මිරිදිය ධීවර සහ ජලජීවී වගා පුහුණු මධ්‍යස්ථානය කලා වැව ප්‍රදේශයේ ඉදිකෙරෙමින් පවතින අතර ශ්‍රී ලංකා ජාතික ජලජ වගා සංවර්ධන අධිකාරියේ මූලස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරමට අවශ්‍ය මූලික ජලතත්ව සහ පාරිසරික නිරීක්ෂණ විද්‍යාගාරයක් බත්තලුඔය ප්‍රදේශයේ ඉදි කෙරෙනු ඇත.

## වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුව විසින් දිවයිනේ වෙරළ තීරයේ පාරිසරික සංරක්ෂණය හා එහි ජීවත්වන සම්ප්‍රදායික ධීවර ජනතාවගේ දිළිඳු බව පිටු දැක්මේ අරමුණින් ධීවර යටිතල පහසුකම් ඉදිකිරීම, වෙරළ තීරය සංරක්ෂණය හා ස්ථායිකරණය සහ ධීවර සම්පත් කළමනාකරණය හා ගුණාත්මක වර්ධනය යන කටයුතු සඳහා ඇ. එ. ජ. ඩොලර් මිලියන 41 ක ණය මුදලක් ලබා දී ඇත.

තවද සුනාමි ව්‍යසනයෙන් හානියට පත් වෙරළබඩ ප්‍රදේශ වල ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා සංරචක F යටතේ ඇ. එ. ජ. ඩොලර් මිලියන 15 ක් ලබාදී ඇත.

වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය 2007 දෙසැම්බර් මාසයේදී නිම කිරීමට අපේක්ෂිත අතර ව්‍යාපෘතිය යටතේ, (අ) හම්බන්තොට, අම්බලන්ගොඩ හා හලාවත යන ප්‍රදේශයන්හි ධීවර වරායන් 03 ක් ඉදිකිරීම. (ආ) හික්කඩුව සිට හලාවත දක්වා වූ වෙරළ තීරය තුල වෙරළ ඛාදන ආරක්ෂණ ක්‍රියාමාර්ග මඟින් ස්ථායිකරණය කිරීම. (ඇ) දැනටමත් ස්වභාවික පරිසර කලාප සංරක්ෂණය සහ මීගමුව, කලමැටිය, ලුනාව, කොග්ගල, මාවැල්ල යන කලපු ප්‍රදේශ සඳහා සහ මුතුරාජවෙල වගුරුබිම, මාදු ගං මෝය ප්‍රදේශ සහ හික්කඩුව කොරල් පර ප්‍රදේශ සඳහා විශේෂ කළමනාකරණ සැලසුම් හඳුන්වා දී ඇත. මාදු ගඟ, කලමැටිය, කල්පිටිය සහ මීගමුව යන කලපු ආශ්‍රිතව නැරඹුම් - ප්‍රජා මධ්‍යස්ථාන ඉදි කිරීමද මේ වන විට අවසන් කර ඇත.




ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද හම්බන්තොට ධීවර වරාය

## ලුනාව පරිසරය වැඩි දියුණු කිරීම හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය



ලුනාව කළපුවේ මඩ ඉවත් කිරීම හා ප්‍රතිසංස්කරණ කටයුතු

ලුනාව පරිසරය වැඩි දියුණු කිරීමේ හා ප්‍රජාව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම උදෙසා, ජපන් රජය විසින් ඇ. ඩො. මිලියන 60 ක මූල්‍යාධාරයක් ලබා දී ඇත. වැසි පිටාර ජලාපවහන පද්ධතිය වැඩි දියුණු කිරීම තුළින් ලුනාව ප්‍රදේශයට ගං වතුරෙන් ඇතිවන හානි තුරන් කිරීම මෙන්ම ඇළ ඉවුරු පදිංචිකරුවන් වෙනත් ස්ථානයක පදිංචි කරවීම හා එම ප්‍රදේශයේ ඌන සේවා ජන පිරිස්වල ජීවන තත්වය ඉහළ නංවාලීම මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ. එසේම මෙමගින් එකී ප්‍රදේශවල පදිංචි ජනතාව සඳහා පාරිසරිකමය වශයෙන් තිරසාර ජීවන රටාවක් ඇති කෙරේ.

ගං වතුරෙන් ඇතිවන හානි අඩු කිරීම සඳහාත්, හානිකර පාරිසරික තත්වයන් ශුන්‍ය කිරීම සඳහාත්, වැසි පිටාර ජලාපවහන පද්ධති වැඩි දියුණු කිරීම, මාර්ග දෙපස ජලය බැස යන කාණු ඉදි කිරීම, ඇළ ඉවුරු මාර්ග ඉදි කිරීම, හානියට පත්වූ මාර්ග පිළිසකර කිරීම, පර්යන්ත මාර්ගයක් ඉදි කිරීම හා ලුනාව වැවට රේඛීයව උද්‍යාන ඉදිකිරීම ද සිදු කෙරෙමින් පවතී. තවද, විපතට පත් පවුල් 500 ක් පදිංචි කරවීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහිත ඉඩම් කට්ටි හයක් සංවර්ධනය කර ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ ලුනාව ප්‍රදේශයේ කිලෝ මීටර් 6.5 ක දිගින් යුත් ප්‍රධාන ඇළ මාර්ග, කිලෝ මීටර් 8.5 ක දිගින් යුත් ද්විතීය ඇළ මාර්ග හා කිලෝ මීටර් 60 ක කාණු පද්ධතියක් හා කිලෝ මීටර් 04 ක් දිග පර්යන්ත මාර්ග ඉදිකෙරෙන අතර, පාලම් 06 ක් හා බෝක්කු 75 ක් ප්‍රතිසංස්කරණය කෙරේ. ව්‍යාපෘතිය යටතට ගැනෙන ප්‍රදේශයේ ජල සැපයුම, විදුලි බලය හා විදුලි සංදේශ වැනි පොදු සේවා ප්‍රතිස්ථාපනය සඳහා අවශ්‍ය වැඩ කෙරෙමින් පවතී. ජපන් රජය වෙතින් ලබා දෙන මූල්‍යාධාර වලට අමතරව ජපානයේ විදේශ සහයෝගිතා ස්වේච්ඡා සේවකයින් ද ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ප්‍රජා සංවර්ධන කාර්යයන් සඳහා සහභාගී වෙති. ඒකාබද්ධ සන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ සටහන CRMP මගින් ලුනාව වැවේ කැණීම් කිරීම හා ජල සම්පාදනය හා ජලාපවහන මණ්ඩලය මගින් අපජලය බැහැර කිරීමේ ව්‍යාපෘතිය වැනි ලුනාව ප්‍රදේශයේ දැනට කෙරෙමින් පවතින අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති සමග ඒකාබද්ධ හවුල් වැඩ සටහනක් වශයෙන් මනා සම්බන්ධීකරණයකින් යුතුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. 2010 අප්‍රේල් වන විට ව්‍යාපෘතිය නිමකර අවසන් කිරීමට නියමිතය.



ලුනාව ප්‍රධාන ඇළ මාර්ගයේ ඉදි කිරීම් කටයුතු



## එක්සත් ජාතීන්ගේ සාගර නීති ප්‍රඥප්තිය යටතේ ශ්‍රී ලංකාවේ මහාද්වීපික තටාකයේ බාහිර සීමාව නිර්ණය කිරීමේ ව්‍යාපෘතිය.


එක්සත් ජාතීන්ගේ සමුද්‍ර නීතිය යටතේ ශ්‍රී ලංකා රජය ස්වකීය හිමිකම් ඉදිරිපත් කිරීම අරබයා විද්‍යාත්මක දත්ත ලබා ගැනීමට මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. නෝර්විජියානු රජය විසින් දෙනු ලබන ඇ. ඩො. මිලියන 2 ක ප්‍රදානයකින් (රු. මිලියන 195) සහ ඇ. ඩො. මිළියන 5.2 ක (රු. මිලියන 548) සහන ණය පහසුකමකින් මෙම ව්‍යාපෘතිය මූල්‍යනය කෙරේ. විද්‍යාත්මක දත්ත රැස්කිරීම සඳහා වන මුහුදු භූ භෞතික සමීක්ෂණය 2007 ජූලි 29 දින ආරම්භ කරන ලද අතර

2007 ඔක්තෝබර් 5 දින සාර්ථකව නිමාවට පත් කරන ලදී. රටේ නෛතික මහාද්වීපික තාටාකය දෙවුන්දර තුඩුවෙ සිට වඩාත් දකුණු දෙසට කිලෝ මීටර් 1000 කට අධික සීමාවක් දක්වා ව්‍යාප්ත වන බැව් මෙලෙස රැස් කරන ලද දත්ත වලින් අනාවරණය වේ.

ලංකාව මඟින් එක්සත් ජාතීන් වෙත ඉදිරිපත් කෙරෙන හිමිකම් 2009 වසරට පෙර ඉදිරිපත් කළ යුතු අතර සමීක්ෂණය සාර්ථකව නිමාවට පත් කළ බැවින් නියමිත කාලයට දත්ත ඉදිරිපත් කිරීමට හැකිවනු ඇත. දත්ත සැකසීමේ කටයුතු වසර අගවන විට නිමාවට පත්වන අතර, ඉන්දු ශ්‍රී ලංකා මායිමේ සීමාව තීරණය කිරීම සම්බන්ධව ඉන්දියාව සමඟ සාකච්ඡා කිරීම 2005 ජනවාරි මස සිදුකිරීමට නියමිතය. ලබා ගත් දත්ත අනුව දළ වශයෙන් රටේ භූමි ප්‍රමාණය මෙන් 20 ගුණයක් පමණ වන ප්‍රදේශයක් ශ්‍රී ලංකාවේ පාලනයට නතු වන අතර, එම ප්‍රදේශයේ ස්වභාවික වායු (ගෑස්) සහ වායු ජලීය සංයුක්තයන් තිබීමේ වැඩි ශක්‍යතාවයක් ඇතැයි අපේක්ෂා කෙරේ.



භූ භෞතික දත්ත රැස්කිරීමේ නාවික මෙහෙයවීම




ශ්‍රී ලංකාවේ මහද්වීපික තටාකයේ නව බාහිර සීමාව

## වාලච්චේන අපහරණ කානු පද්ධතිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය- මඩකලපුව දිස්ත්‍රික්කය

මඩකලපුව දිස්ත්‍රික්කයේ වාලච්චාන ප්‍රදේශයේ අපහරණය කානු පද්ධතියක් ඉදිකිරීම සඳහා කොරියානු රජය විසින් ඇමෙරිකානු ඩොලර් මිලියන 3.9 ක ප්‍රදානයක් ලබා දී ඇත. මෙම ව්‍යාපෘතියට ප්‍රධාන ඇල මාර්ගය ඉදිකිරීම පවතින කානු පද්ධතිය වැඩි දියුණු කිරීම හා දීර්ඝ කිරීම බෝක්කු ඉදිකිරීම ආදිය ඇතුලත් වේ. ව්‍යාපෘතිය 2007 ආරම්භ වූ අතර එය 2008 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂිතය.

## ස්වභාවික සම්පත් කළමණාකරණ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය මූලික වශයෙන් කුරුනෑගල දිස්ත්‍රික්කයේ උතුරු ප්‍රදේශයේ සහ මාතලේ දිස්ත්‍රික්කයේ ආරම්භ කෙරිනි. මෙය වන සම්පත් දෙපාර්තමේන්තුව සමග එකාබද්ධ ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක වේ. ව්‍යාපෘතිය සඳහා ඕස්ට්‍රේලියානු රජය

ඇමෙරිකානු ඩොලර් මිලියන 9.4 ක ප්‍රදානයක් ලබා දී ඇත. පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන අතර එය 2008 දී නිම කිරීමට අපේක්ෂිතය.
වනාන්තර සහ කෘෂි සම්පත් එකාබද්ධ කිරීම තුලින් සහ භාවිතය දියුණු කිරීම තුලින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ අනෙකුත් අදාල ආයතන වල අතිරේක ක්‍රම වැඩි දියුණු කිරීමත්,ස්වභාවික සම්පත් කලමණාකරණය තුලින් පොදු ජනතාවට උපකාර කිරීමත්, ගෘහ ආශ්‍රිත ජීවන වෘත්තිය වැඩි දියුණු කිරීමටත් ස්වභාවික සම්පත් කළමණාකරන ව්‍යාපෘතිය උපකාරි වේ.

## ආපදා කළමනාකරණය

### කාලගුණ හා ආපදා තොරතුරු ජාලය වැඩි දියුණු කිරීම

ශ්‍රී ලංකාවේ කාලගුණ හා ආපදා තොරතුරු ජාලය වැඩි දියුණු කිරීම සඳහා ජපන් රජය විසින් ජපන් යෙන් මිලියන 807 ක ප්‍රදානයක් (ආසන්න වශයෙන් ඇ. ඩො. මිලියන 7.2 ක්) ලබා දී ඇත. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ අදාල ආයතන අතර විශ්වාසනීය සංනිවේදන ජාලයක් සැකසීම සහ කාලගුණික නිරීක්ෂක පද්ධතිය වැඩි දියුණු කිරීම තුලින් ශ්‍රී ලංකාවෙහි කාලගුණ හා ආපදා තොරතුරු ජාලය ශක්තිමත් කිරීමයි.

නව ව්‍යාපෘතිය යටතේ කාලගුණික මධ්‍යස්ථාන 38 ක් ස්වයංක්‍රීය තත්වයට පත් කිරීම තුලින් ජාතික කාලගුණ තොරතුරු ජාලය හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ස්වයංක්‍රීය කාලගුණ තොරතුරු පද්ධතිය වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරන අතර, මෙම ස්වයංක්‍රීය කාලගුණ තොරතුරු පද්ධතියත් කාලීන චන්ද්‍රිකා සන්නිවේදන ජාලයක් මගින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යාලයට සම්බන්ධ කරනු ඇත. අභ්‍යන්තර ආයතන සම්බන්ධ කරමින් ස්ථාපනය කරනු ලබන සන්නිවේදන ජාලය හරහා කාළගුණ ආශ්‍රිත තොරතුරු හා පුරෝකථන මෙන්ම අනුමාන කල හැකි ආපදා සම්බන්ධ අනතුරු හැඟවීම් අදාල සංවිධාන වෙත නොපමාව දැනුම් දිය හැකිය. ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මූලික සැලසුම් ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයෙහි සහයෝගය ඇතිව දැනටමත් පිළියෙල කර ඇත.

ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශයෙහි අධීක්ෂණය යටතේ ජපන් උපදේශකවරුන් සහ කොන්ත්‍රාත් කරුවන් සමග සමීප සහයෝගීතාවයෙන් යුතුව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ඇත

# 2.4

# යහ පාලනය ප්‍රවර්ධනය කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහ අධීක්ෂණය



## 2.4 යහ පාලනය මෙහෙයුම් කාර්යක්ෂමතාවය ප්‍රවර්ධනය කිරීම සහ පසුවිපරම

රජයේ දස අවුරුදු දැක්ම අනුව ඉදිරි වසර 06 තුල සියයට 08 ක ආර්ථික වර්ධන වේගයක් හා ඉන්පසු සියයට 08 – 10 අතර ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගෙන යාමට අපේක්ෂා කෙරේ. දේශීය සහ විදේශීය අරමුදල් වඩාත් කාර්‍යක්ෂමව යොදා ගැනිම මඟින් සංවර්ධන කටයුතු කිරීම තුලින් අපේක්ෂිත ආර්ථික වර්ධනය ලඟා කර ගැනිම සඳහා රජයේ යහපාලනය මූලික කරුණ වේ. ඵලදායි හා කාර්‍යක්ෂම පාරිභෝගික හිතවාදී දූෂණයෙන් තොර විනිවිදභාවයකින් යුක්ත වගකිවයුතු රාජ්‍ය සේවාවක් පවත්වා ගෙන යාමට රජය බලාපොරොත්තු වේ. රාජ්‍ය ආයතන වල ක්‍රියාපිලිවෙත් වල පවතින ප්‍රමාදයන් සහත ව්‍යුහාත්මක අකාර්‍යක්ෂමතාවය අවම කිරිම සඳහා ජාතික තරඟ කාරිත්වය වැඩිදියුණු කිරීම මඟින් රාජ්‍ය සේවය ප්‍රතිසංස්කරණය කිරීම සහ අනාගත ක්‍රම උපායන්හි පදනම් වී ඇත ඉහත අරමුණු ලඟා කර ගැනිම සඳහා රජය විසින් මූල්‍ය බංකු, කොටස් වෙළඳපොල, බදු මිළදී ගැනීම්, වෙළඳ ආයෝජන ආදී ක්ෂේත්‍ර වල විවිධ ප්‍රතිසංස්කරණ හඳුන්වා දී ඇත .

මූලික ආර්ථික සහ සමාජ යටිතල පහසුකම් හා සේවා සැපයීම තුලින් ප්‍රාදේශීය අසමානතාවය අඩු කිරිම ප්‍රාදේශීය පරිපාලන ක්‍රියාවලිය දියුණු කිරිමට ඉතාමත් වැදගත් සාධකයක් බව දැක්විය හැකිය. මේ හැර ශක්තිමත් හා අපක්ෂපාතී අධිකරණ පද්ධතියක පැවැත්ම යහපාලනයට ඉතා වැදගත් වේ.

මනා රාජ්‍ය පාලනයක් ලඟා කර ගැනිම සඳහා ඉවහල් වන ව්‍යාපෘති සමහරක් පහත දැක් වේ.

### පෞද්ගලික අංශයේ සංවර්ධනය සඳහා මූල්‍ය වෙළඳපොළ වැඩසටහන

මහජන බැංකු ප්‍රතිව්‍යුහගත කිරීම, අදියර අනුව එහි ප්‍රතිප්‍රාග්ධානීකරණය, රක්‍ෂණ කර්මාන්තයේ නියාමනය, රාජ්‍ය බැංකවල ව්‍යාපාර යහපාලනය වැඩිදියුණු කිරීම හා මහජන බැංකුව සහ ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථා නිලධාරීන්ගේ හැකියාව වර්ධනය කිරීම ඇතුළු මූල්‍ය වෙළඳපොළ සවිමත් කිරීම හා එමගින් පෞද්ගලික අංශයේ සංවර්ධනය පහසු කරලීම උදෙසා ආසියානු සංවර්ධන බැංකුව විසින් ඇමරිකානු ඩොලර් මිලියන 65 ක ණය පහසුකම් ඉහත වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දී ඇත.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධානතම අරමුණ වන්නේ අදියර තුනකින් යුත් ප්‍රතිප්‍රාග්ධනීකරණය කිරීම තුළින් මහජන බැංකුව ප්‍රතිව්‍යුහගත කිරීමයි. මෙම ප්‍රාග්ධනීකරණයේ ඉලක්කගත සැළසුම් හා සසඳා බැලූවිට මහජන බැංකුව මූල්‍ය කාර්යය සාධනය සාක්ෂාත් කරගැනීමට ඵලදායී අන්දමින් දායකවී ඇත. මහජන බැංකුව හා ලංකා බැංකුව මඟින් එම බැංකුවලට අදාල ව්‍යාපාර යහපාලන ප්‍රඥප්ති සකස් කර ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ මහජන බැංකුවේ ඉහල හා මධ්‍යම මට්ටමේ නිලධාරීන්ගේ හැකියාව වර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වූ උපාය මාර්ග සකස් කර ඇත. සුරැකුම්පත් හා විනිමය

කොමිෂන් සභාව - කොළඹ කොටස් හුවමාරුව සඳහා වූ බලපත්‍රය අවුරුදු පහකට දීර්ඝ කර ඇත. මෙම වැඩසටහන යටතේ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව තනි තලයකින් යුක්ත ගණුදෙනු පියවීමේ ක්‍රමයක් එනම්, මිලදී ගැනුම් සහ විකුණුම් සඳහා වෙළඳ දිනයේ සිට දින තුනක් ඇතුලත (ටී+3) පියවීමේ ක්‍රමයක් ඇති කිරීම පිණිස හා 2007 ඔක්තෝම්බර් 10 වන දින සිට මෙය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.



මහජන බැංකුවේ කාර්ය මණ්ඩලයේ හැකියාවර්ධන වැඩසටහනක

## මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ වැඩසටහන

රජයේ ආදායම වැඩිකර ගැනීම හා වියදම් වඩාත් කාර්යක්‍ෂම ලෙස කළමනාකරණය කිරීමෙන් රාජ්‍ය සම්පත් සංවර්ධනයට තිරසාර පදනමක් ඇතිකර ගැනීමේ අරමුණින් ආසියානු සංවර්ධන බැංකුව ඇ. ඩො. මිලියන 70 ක ණයක් ලබාදෙන ලදී. මේ යටතේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව, සුරාබදු දෙපාර්තමේන්තුව සහ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය නවීකරණය කෙරේ.

## ඊ- ශ්‍රී ලංකා ව්‍යාපෘතිය

ඊ- ශ්‍රී ලංකා ව්‍යාපෘතිය, ලෝක බැංකුවේ ඇ.ඩො.මි. 53 කින් හා කොරියන් එක්සිම් බැංකුවේ ඇ. ඩො. මි. 15 ක ණය මුදලකින් සහ ජපන් සමාජ සංවර්ධන අරමුදලේ ඇ. ඩො. මි. 1 ක ප්‍රදානයකින් මූල්‍යනය වේ. මෙම ව්‍යාපෘතිය ජනාධිපති කාර්යාලය යටතේ ඇති තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) මඟින් ක්‍රියාත්මක වේ.



මෙම ව්‍යාපෘතියේ ඉලක්ක වනුයේ, (i) පොදු තොරතුරු හා සේවාවන් වලට ප්‍රවේශ වීම හා පරිශීලනය කිරීම ප්‍රවර්ධනය කිරීම, (ii) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපයෝගී කර ගැනීමෙන් ආර්ථික වර්ධනය හා රැකියා නියුක්තිය වැඩි කිරීම, (ii) විශේෂයෙන් දැනුම හා ආශ්‍රිත කර්මාන්ත හා කුඩා හා මධ්‍යම ව්‍යවසායයන් සම්බන්ධයෙන් පෞද්ගලික අංශයේ තරඟකාරීත්වය වැඩි කිරීමයි.

ව්‍යාපෘතිය මඟින් සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරනුයේ, 2008 වසර වන විට නැණසල 600 ක් ආරම්භ කිරීම, රජයේ ආයතන 325 ක් සම්බන්ධ කෙරෙන ලංකා රජයේ තොරතුරු ජාලය ආරම්භ කිරීම, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන සාක්ෂරතාව වැඩි දියුණු කිරීම,

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ක්‍රමෝපායි හා කාර්යක්ෂම ලෙස උපයෝගී කරගැනීම තුළින් වඩාත් පුරවැසි කේන්ද්‍රගත රජයක් පවත්වාගෙන යෑම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්තය හා තොරතුරු තාක්ෂණ හැකියා සංවර්ධනය කිරීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට දේශීය භාෂාවේ සහාය සහතික වීම, රජයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ජාතික තොරතුරු සන්නිවේදන ප්‍රතිපත්තියට හිතකර ආයතනික ප්‍රතිපත්ති හා තොරතුරු හා සන්නිවේදන නියාමන පරිසරයට අනුබලැති ප්‍රතිපත්ති සැකසීම යනාදිය තුළිනි.

මෙම ව්‍යාපෘතිය යටතේ දැනට නැණසල 400 ක් ආරම්භ කිරීම, අඩු වියදමේ ඔරොත්තු දෙන පරිගණකයක් හඳුන්වාදීම, රජයේ ත්‍රෛ භාෂා තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම, ජාතික තොරතුරු හා සන්නිවේදන සාක්ෂරතා මුලපිරීමත්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහනක් හඳුන්වාදීම, දුරස්ථ හා ර ඉගැන්වීමේ මධ්‍යස්ථාන පිහිටුවීම, ශ්‍රී ලංකා පරිගණක හදිසි අවස්ථා ප්‍රතිචාර කණ්ඩායමක් සූදානම් කිරීම සහ 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත සැකසීමත් අවසාන කර ඇත.

## නීති හා අධිකරණ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය

නීති හා අධිකරණ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය මතු දැක්වෙන කාර්යයන්හි ලා සහාය දක්වමින් නීති ප්‍රතිසංස්කරණය සඳහා මුල පිරීමට ඉලක්ක කර ඇත.

(අ) නූතන ව්‍යවස්ථාදායක හා නියාමන කාර්ය රාමුව හා පටිපාටිමය වෙනස්වීම කෙටුම්පත් කිරීම (ආ) නීතිඥවරුන්, විනිසුරුවන් හා උසාවි සේවක පිරිස් වෘත්තිමය වශයෙන් ඉහළ නැංවීම (ඇ) මෙරට වානිජ නීති විෂය ධාරාවේ තත්ත්වය පිරික්සීම (ඈ) නීති පුස්තකාලය වැඩි දියුණු කිරීම (ඉ) නීතියට ඇති ප්‍රවේශය වැඩි දියුණු කිරීම. (ර්) සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීම සහ (උ) අධිකරණ කටයුතු සම්බන්ධ පුහුණුවීම, අධිකරණ පරිපාලනමය ප්‍රතිසංස්කරණ (JSC-අධිකරණ සේවා කොමිසම) ආදර්ශ උසාවි හා සමථ මණ්ඩල තුළින් අධිකරණ සේවා සම්පාදනය වැඩි දියුණු කිරීම.



**යාපනයේ නව උසාවි සංකීර්ණය ඉදිකිරීමට පෙර හා පසු**

නීති හා අධිකරණ ක්ෂේත්‍රයේ සුවිශේෂ ප්‍රතිසංස්කරණ රැසක් ඉටුකිරීමට සහාය දැක්වූ මෙම ව්‍යාපෘතිය මඟින් ගෙවීම හා නිරවුල් කිරීම් පද්ධති පනත, ණය තොරතුරු

කාර්යංශ පනතට සංශෝධන, මුදල් ත්‍රස්තවාදයට මුදල් යෙදවීමේ පනත, සහ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත වැනි මුදල්, බදු හා වාණිජ නීති හා සම්බන්ධ නීති ප්‍රතිසංස්කරණ රැසකට මුල පුරන ලදී. නව සමාගම් පනතක් පාර්ලිමේන්තුවේ සම්මත විය. නීති ජාල වෙබ් අඩවිය, උසාවි ස්වයංක්‍රියකරණය, සමාගම් රෙජිස්ටාර් කාර්යාලය ප්‍රතිව්‍යුහගත කිරීම, අධිකරණ සම්පත් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම, අධිකරණ සේවා කොමිෂන් සභාව ප්‍රතිව්‍යුහගත කිරීම, ආදර්ශ උසාවි වල පරිපාලන ප්‍රතිසංස්කරණය, වාණිජමය ආරවුල් සඳහා විධිමත් බේරුම්කාර පද්ධතියක් විසුද්ධිකරණ විරෝධී පනත, වර්ධනය කිරීම, මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණ මූලාරම්භන අතරින් කිහිපයකි. එපමණක් නොව, පුහුණු වීම් තුළින් අධිකරණ අංශයේ මානව සම්පත් සංවර්ධනය හා දැනුම ඉහළ නැංවීම සඳහා ප්‍රමුඛත්වයක් ලබා දෙන ලදී. මෙකී ප්‍රයත්නයන් යටතේ නීති යටිතල පහසුකම් වැඩි දියුණු කරන ලද අතර, යාපනය හා ත්‍රිකුණාමලයේ නව අධිකරණ සංකීර්ණ 2 ක් ද, දිවයින පුරා විහිදී ඇති උසාවි 28 ක් නීතිමය කටයුතු උදෙසා පැමිණෙන්නන්ට පහසුකම් සැළසීමේ අරමුණින් පිළිසකර කරන ලදී.

## හම්බන්තොට පරිපාලන සංකිර්ණය ඉදිකිරිමේ ව්‍යාපාතිය

සුනාමි රළ පහර හේතුවෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ රජයේ කාර්යාල විශාල ප්‍රමාණයක් විනාශයට පත්වූ අතර එම රජයේ කාර්යාල දැනට පෞද්ගලික නිවාස වල හෝ ආයතන වල පවත්වා ගෙනයනු ලබයි. මෙසේ දැනට නගරයේ තැනින් තැන විසිරි ඇති මධ්‍යම රජයේ සහ පලාත් සභා සහ පලාත් පාලන ආයතන වල කාර්යාල වලට ඉඩකඩ පහසුකම් සැලසිමේ අරමුණින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිව්මහල් පරිපාලන සංකිර්නය ඉදිකරනු ලබයි. මෙම ව්‍යාපෘතිය සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 25 ක් වැයවන අතර එයින් ඩොලර් මිලියන 20 ක් කොරියානු රජය විසින් සහනදායි කොන්දේසි මත ලබා දෙන අතර ඉතිරිය ශ්‍රී ලංකා රජය විසින් දරනු ලබයි. මෙම ව්‍යාපෘතිය 2006 ආරම්භ කල අතර එය 2009 වර්ෂයේ අවසන් කිරිමට නියමිතය.



යෝජිත හම්බන්තොට පරිපාලන සංකිර්ණය

## හම්බන්තොට අන්තර් ජාතික සම්මන්ත්‍රණ ශාලාව ඉදි කිරීමේ ව්‍යාපෘතිය

හම්බන්තොට අන්තර් ජාතික සම්මන්ත්‍රණ ශාලාව කොරියානු ආධාර යටතේ ඉදි කෙරෙමින් පවති. මෙහි ඇස්තමේන්තු ගත සම්පූර්ණ වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන 10.5 ක් වන අතර ඉන් ඇමෙරිකානු ඩොලර් මිලියන 6 ක් කොරියානු රජය මගින් ප්‍රදානයක් වශයෙන් ලබා දේ. එම මුදල මගින් ආසන 1500 ක පහසුකම් සහිත සම්මන්ත්‍රණ ශාලාවක් ඉදි කරනු ලබන අතර රට අවශ්‍ය සියලුම උපකරණ ද ලබා දෙනු ඇත. මීට අමතරව ශ්‍රී ලංකා රජය මගින් ඉතිරි ඇමෙරිකානු ඩොලර් මිලියන 4.5 මෙම ව්‍යාපෘතියට සපයන අතර එය රැස්වීම් ශාලා 3 ක් භෝජනාගාරයක්, මුළු තැන් ගෙයක් සහ අනෙකුත් යටිතල පහසුකම් සඳහා යොදාගනු ඇත. මෙම ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු 2006 වසරේ ආරම්භ කල අතර එය 2009 වසරේ නිම කිරීමට අපේක්ෂිතය.



යෝජිත හම්බන්තොට අන්තර් ජාතික සම්මන්ත්‍රණ ශාලාව

## යහ පාලනය මෙහෙයුම් කාර්යක්ෂමතාවය හා අධීක්ෂණය වැඩි දියුණුකිරීම

යහ පාලනය, දිළිඳුකම තුරන්කරලීම, සාමය හා උතුරු නැගෙනහිර ප්‍රදේශ පුනර්ජීවනය හා බලශක්ති හා පාරිසරික වර්ධනය සඳහා ඇ. ඩො. මිලියන 70 ක් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ 2002 සිට 2007 වසර සඳහා වෙන්කර ඇත. එම මුදලින් 2007 අගෝස්තු 24 දින වනවිට ඇ. ඩො. මිලියන 66 ක් වැයයෝජනය කර ඇත.

දිළිඳුකම අවමකිරීමේ සමාරම්භක කටයුතු ලෙස, ශ්‍රී ලංකාවේ අන්ත දිළිඳු පළාත්වලින් එක් පළාතක දිළිඳුකම අවම කිරීමේ විමධ්‍යගත ක්‍රියාවලියේ ධාරිතාවය වර්ධනය කිරීම මෙන්ම, එම පළාත් වාසීන්ගේ ජීවනෝපාය ඉහළ නැංවීමද උතුරු නැගෙනහිර ආර්ථිකය ශක්තිමත් කිරීමද, ආරම්භ කර ඇත. සහස්‍ර සංවර්ධන ඉලක්ක වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන් වල ප්‍රධාන තේමාවන් වන්නේ, සහස්‍ර සංවර්ධන ඉලක්ක න්‍යාය පත්‍රය සාර්ථකව මෙහෙයවීම හා සම්බන්ධීකරණය කිරීම පිණිස ජාතික ශක්තිය ගොඩ නැගීමයි. එසේ

ගොඩනැගීමේදී සහාය දැක්වීම, සහස්‍ර සංවර්ධන ඉලක්ක ක්‍රියාකරණය හා අධීක්ෂණයද, සහස්‍ර සංවර්ධන ඉලක්ක පාදක සංවර්ධන සැළසුමේ ප්‍රතිපත්ති හා අයවැය සැකසීම හා ක්‍රියාත්මක කිරීමට සහාය දැක්වීම, උතුරු නැගෙනහිර අවතැන්වූ ජන කොටස් සහ ඔවුන්ගේ සත්කාරක ප්‍රජාවන් සඳහා කෘෂිකර්ම හා ධීවර අංශයේ ජීවනෝපායන් ඇතිකිරීමෙන් සහාය ලබාදීම හා සුළුපරිමාන මූල්‍යනය තුළින් ආර්ථික වශයෙන් යථා තත්වයට ගෙනඒම සඳහා මෙම එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ ඇ. ඩො. මිලියන 18ක මූල්‍ය පහසුකම් සපයයි. රජයේ ප්‍රමුඛතාවයක් වන දැඩි ලෙස හානියට පත්වූ දිස්ත්‍රික් වල බිම් බෝම්බ ඉවත් කිරීම සඳහාද එක්සත් ජාතීන්ගේ සංවිධානය අරමුදල් සම්පාදනය කරයි. දැඩි ලෙස හානියට පත්වූ දිස්ත්‍රික් වල නැවත පදිංචි කිරීම සඳහා බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු ගවේෂණය සඳහා යාපනය සහ වව්නියාවේ පිහිටුවා ඇති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කර්යාල මගින් සිදු කරනු ලැබේ.



# 2.5

# සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු



## 2.5. සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු

2004 දෙසැම්බර් 26 දින ශ්‍රී ලංකාවට බලපෑ සුනාමි ව්‍යසනය, 31,000 ක පමණ ජීවිත විනාශ කරමින් දළ වශයෙන් 4,43,000 ක් ජනතාව අවතැන් කරමින් ශ්‍රී ලංකා ඉතිහාසයේ අනපේක්ෂිත ලෙස ඇති වූ ඉමහත් අභාග්‍යයකි. නිවාස වලට මෙන්ම ජනතාවගේ ජීවනෝපායට, පරිසර පද්ධතියට හා වෙරළබඩ යටිතල පහසුකම් පද්ධතියට එමගින් දැඩි ලෙස හානි සිදුවිය. මුහුදුකරයේ විසූ ධීවර ප්‍රජාව, උතුරු නැගෙනහිර පුරා දශක 02 ක් තුළ පවතින අරගලකාරී තත්ත්වයෙන් හානි පැමිණ වුනු ජනපිරිස් වැනි සමාජයේ ඉතා පහසුවෙන් පීඩාවට ලක් විය හැකි ජනකොටස් හා ප්‍රදේශ මෙම ව්‍යසනයෙන් දැඩි ලෙස හානියට පත් වූ බැවින්, සුනාමි ව්‍යසනයෙන් ආර්ථිකයට දැඩි බලපෑමක් ඇති කෙරිනි.

එමගින් ඇති වූ සමස්ථ ආලාභය ඇ. ඩො. බිලියන 1 හෝ දළ දේශීය නිෂ්පාදනයෙන් 4.5% වශයෙන් ඇස්තමේන්තුගත කර ඇත. දැඩි දරිද්‍රතාවයෙන් පීඩාවට පත්ව තිබූ ප්‍රදේශ තව දුරටත් ධරිද්‍රතාවය තිව්‍රවිමේ අවධානමට ලක් කරමින් සිදු වූ ව්‍යසනයෙන් වෙරළබඩ විසූ ධීවරයින්, අනියම් අංශවල නිරතවුවන්, ධීවර මෙන්ම සංචාරක ක්ෂේත්‍රයේ නියැලී සිටි අය සහ කුඩා පරිමාණයේ ගොවීන්ගේ ජීවනෝපාය කෙරෙහි දැඩි ලෙස බලපෑම් ඇති විය. ක්ෂණික සහන සහ පුනරුත්ථාපන සඳහා වෙන්වූ පළමු අදියරේ දී, අවතැන් වූ පවුල් 100,000 ගේ අවශ්‍යතාවයන් මාස 03 - 04 ක් ඒ සඳහා සපුරා ලීම සඳහා කටයුතු කල අතර, ඒ සඳහා දළ වශයෙන් ඇ. ඩො. මිලියන 200 - 250 අවශ්‍ය වේ යැයි ඇස්තමේන්තු කර ඇත. මෙහි 02 වන අදියර වුයේ ප්‍රතිසංස්කරණ හා නැවත ඉදිකිරිමේ ක්‍රියාවලියයි. වර්ෂ 03 - 05 පමණ කාලයක් ගත වන මෙම අදියරට නිවාස සහ නගර සංවර්ධනය, මානව සම්පත් සංවර්ධනය සඳහා යටිතල පහසුකම් දියුණු කිරීම, කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය හා සංචාරක ව්‍යාපාරය සඳහා ආධාර ලබා දීම, මං මාවත්, දුම්රිය මාර්ග, විදුලි සංදේශ, ජල සම්පාදන, වරාය, ධීවර වරාය හා බලශක්ති සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ද අයත් වේ. මෙම දෙවන අදියරය සඳහා මූල්‍ය අවශ්‍යතාව ඇ. ඩො. බිලියන 1.8 වෙතැයි ඇස්තමේන්තුගත කර ඇත.

ඒ ඒ ප්‍රදේශ වල තිරසාර ආර්ථිකයක් ඇතිකිරීම සහතික වීම පිණිස සංවර්ධන පාර්ශවකරුවන්ගේ ආධාර ඉතා වැදගත් බැවින් දෙවන අදියරය සුවිශේෂ අවස්ථාවක් වනු ඇත. වැඩසටහන් එකිනෙකට ගැටීම හෝ එක් වැඩසටහනක් දෙවරක් සිදුකිරීම වළක්වනු පිණිස අරමුදල් ඵලදායි ලෙස උපයෝගී කිරීම සහතික වීම අරඹයා සුනාමි පුනරුත්ථාපන හා ප්‍රසංස්කරණ කටයුතු මනා සම්බන්ධීකරණයෙන් යුතුව පවත්වාගෙන යනු ලැබේ.

ප්‍රදායකයින් ඔවුනොවුන් අතර, ක්‍රියාදාමයන් මැනවින් සම්බන්ධිකරණය කර, අතිරේක මුදල් අවශ්‍ය වන්නා වූ පුනරුත්ථාපන වැඩසටහන් වල හිඩැස් හඳුනාගෙන මෙම කර්තව්‍යයෙහිලා පූර්න සහයෝගය ලබා දි ඇත. සුනාමි පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ යටතේ දැනට කෙරෙමින් පවතින ව්‍යාපෘති පිළිබඳ මින්මතුවට එන කොටස් වල විස්තර කෙරේ.

## සුනාමියෙන් හානියට පත්වූ ප්‍රදේශ ගොඩනැංවීමේ ව්‍යාපෘතිය

සුනාමියෙන් සිදු වූ විනාශකාරී තත්වය අවම කර ගැනීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව ඇ. ඩො. මිලියන 150 ක අධාරයක් ලබාදෙන ලදී. සුනාමිය නිසා හානි වූ ප්‍රදේශ නැවත ගොඩනැංවීමේ හා සුනාමියට ගොදුරු වූ මිනිසුන්ගේ භෞතිය හා මානසික මට්ටම වැඩි දියුණු කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය සැලසුම් කරන ලදී. මේ හරහා සුනාමියෙන් විපතට පත් වූ ජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කිරීමට විවිධ ක්ෂේත්‍ර හරහා උප ව්‍යාපෘතීන් ක්‍රියාත්මක
කෙරේ.




නැවත ඉදිකළ ආයුර්වේද රෝහල - මඩකළපුව

සුනාමියෙන් විපතට පත් ජනතාවගේ නීතිමය හා විනාශ වූ ලියකියවිලි නැවත ලබා ගැනීමේදී ඇති වන ගැටළු නිරාකරණය කර ගැනීමට අවශ්‍ය සහයෝගය මෙම ව්‍යාපෘතියේ සංරචක A මගින් ලබාදේ. මේ යටතේ ඇ. ඩො. මිලියන 2.2 ක් වෙන්කර ඇත. දිස්ත්‍රික් 07 තුල සමථ මණ්ඩල පිහිටුවීම අවසන් කර ඇත.

මෙම ව්‍යාපෘතියේ D සංරචකය හරහා සුනාමියෙන් විනාශයට පත් වූ පානීය ජල සැපයුම් හා සනීපාරක්ෂක යෝජනා ක්‍රමවල ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කෙරේ. මේ සඳහා ඇ. ඩො. මිලියන 10.1 ක් වෙන් කර ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කයේ සුනාමියෙන් විනාශවී ගිය ජල සැපයුම් යෝජනාක්‍රම වල අලුත්වැඩියා කටයුතු අවසන් කර ඇත. මඩකලපුව හා මුතුර් දිස්ත්‍රික්කවල හානිවූ යෝජනාක්‍රම වල අලුත්වැඩියා කටයුතු කෙරෙමින් පවතී.



කලාප අධ්‍යාපන කාර්යාලය - දික්වැල්ල

දකුණු පළාතේ සුනාමියෙන් විනාශයට පත්වූ යටිතල පහසුකම් නැවත ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ඇ.ඩො. මිලියන 20.2 ක් මෙම ව්‍යාපෘතියේ E සංරචකය හරහා ලබාදේ.




වැලිගම බස් නැවතුම්පොළ

සුනාමියෙන් හානියට පත් වූ උතුරු-දකුණු පළාත් වල වෙරළබඩ ප්‍රදේශ වල යටිතල පහසුකම් නැවත ප්‍රතිස්ථාපනය කිරීමට මෙම ව්‍යාපෘතියේ සංරචක H හරහා ඇ. ඩො. මිලියන 18.4 ක් ලබා දී ඇත. මේ සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම් 2005 අප්‍රේල් මස ආරම්භ කල අතර ව්‍යාපෘතියේ කටයුතු 2009 ජුනි 30 අවසන් වීමට නියමිතය. මුළු මුදල රු. මිලියන 1336.62 වේ.

# ශ්‍රී ලංකාවේ සුනාමි ව්‍යසනයෙන් විනාශයට පත් වූ ප්‍රදේශ යථා තත්වයට පත් කිරීමේ හා නංවාලීමේ ව්‍යාපෘතිය (STAART)

සුනාමියෙන් හානිවූ ප්‍රදේශවල ආර්ථික කටයුතු ප්‍රතිෂ්ඨාපනය තුළින් එහි ජනතාවගේ ජීවනෝපාය නගා සිටුවීම හා දේශීය ආර්ථිකය නැවත ගොඩනැංවීමට දායක වීම පිණිස, ජපන් රජය විසින් ඇ. ඩොලර් මිලියන 88 ක පමණ ණය මුදලක් ලබා දී ඇත.

මෙම ණය මුදලෙන් වැඩි කොටසක් සුනාමියෙන් හානියට පත් මාර්ග, විදුලිය, ජලය, වාරි මාර්ග සහ තැපැල් සේවා යන යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය සහ නැවත ඉදිකිරීම සඳහා උපයෝගී කර ගෙන ඇත. කිලෝ මීටර් 183 ක් වූ ජාතික මහා මාර්ග ද, කිලෝ මීටර් 87 ක් පමණ වූ ප්‍රවේශ මාර්ග ද, සුනාමි නිවාස සංකීර්ණවල කිලෝ මීටර් 86 ක් පමණ වූ, අභ්‍යන්තර මාර්ග සහ කිලෝ මීටර් 297 ක් වූ පළාත් සභා මාර්ග ද, මේ යටතේ ප්‍රතිසංස්කරණය හෝ නැවත ඉදිකිරීම් කර ඇත. නිවාස 16,500 කට පමණ විදුලි බල සැපයුම ප්‍රතිස්ථාපනය කර ඇති අතර, සුනාමි නිවාස සංකීර්ණයන්හි පදිංචි කරවූ පවුල් 9,500 කට පමණ නව විදුලි බල සැපයුම් ලබා දී ඇත. තව ද, නිවාස 10,000 කට පමණ නල ජල පහසුකම් සපයා ඇත. වගා බිම් හෙක්ටයාර 1,200,000 පමණ සහ ගොවි පවුල් 75,000 ක පමණ පිරිසකට සෙත සලසමින්, ව්‍යාපෘතිය යටතේ වාරි මාර්ග පද්ධතීන් ප්‍රතිසංස්කරණය කර ඇත. තවද, ලක්ෂ 7 ක පමණ ජනතාවගේ තැපැල් සේවා අවශ්‍යතා යථා තත්වයට පත් කිරීමට අවශ්‍යවන්නා වූ පහසුකම් සහිතව තැපැල් කාර්යාල 13 ක් ප්‍රතිසංස්කරණය කර ඇත.




කින්නියා කලපුව මතින් සම්ප්‍රේශණ ජල නල මාර්ගය



වෙට්ටිකාඩු අමුණ ප්‍රතිසංස්කරණය

ණය මුදලේ ඉතිරි කොටස, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාවට නංවන ලද සුසහන ණය යෝජනා ක්‍රමය යටතේ විපතට පත් සුළු හා මධ්‍ය පරිමාන ව්‍යාපාර ප්‍රතිස්ථාපනය සඳහා අරමුදල් ලබාදීමට උපයෝගී කර ගැනුනි. මෙම වැඩ සටහන 2006 වසරේදී ඉතා සාර්ථකව නිමාවට පත් විය.



නව මාතර තැපැල් කාර්යාලය



මාතර වෙරළ පාර

මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද උප ව්‍යාපෘති බොහොමයක වැඩ කටයුතු දැනට නිමකර ඇති අතර ඉතිරිවී ඇති සෙසු වැඩ කොටස මෙම වසර නිමවීමට ප්‍රථම අවසන් කිරීමට අපේක්ෂිතය.

## සුනාමියෙන් විනාශයට පත් වූ ප්‍රදේශවල සහන, ප්‍රතිසංස්කරණ සහ නැවත ඉදි කිරීම් කටයුතු සඳහා ව්‍යාපෘති නොවන ප්‍රදාන ආධාර

ජපාන රජය විසින් සුනාමි හදිසි සහන කටයුතු සඳහා ඇ. ඩො. මිලියනයක මුදල් ප්‍රදානයක් සහ සුනාමියෙන් හානි වූ ප්‍රදේශවල ප්‍රතිසංස්කරණ හා නැවත ඉදිකිරීමේ කටයුතු සිදුකිරීම සඳහා ඇ. ඩො. මිලියන් 80 ක පමණ ප්‍රදාන ආධාරයක් 2005 වසරේදී ලබා දුන් අතර එම ප්‍රදාන ආධාර උපයෝගී කර ගනිමින් පහත සඳහන් ඉදිකිරීම් සහ මිලදී ගැනීම් කටයුතු සිදු කර ඇත.

- ගාල්ල සහ තංගල්ල ධීවර වරායන් ප්‍රතිසංස්කරණය කිරීම සහ මාළු ප්‍රවාහනයේ දී අවශ්‍ය වන අධි ශීතකරණ සහිත ලොරි රථ 30 ක්, බහාළු ශීතකරණ 12ක්, ශීත ගබඩා සහ එක් තැන් කළ හැකි වැඩ බිම් 11 ක් සහ බහු දින ධීවර යාත්‍රා 2 ක්, ජපාන පුහුණු කිරීම් නෞකාවක් ලබාදීම, සහ ධීවරයින් වෙත සම්ප්‍රදායික මාළු බෝට්ටු 1,500 ක් සහ වෙළඳ බෝට්ටු 340 ක් ලබාදීම
- බස්නාහිර, දකුණු සහ නැගෙනහිර පළාත්වල හානියට පත් පාසල් 13 ක් නැවත ඉදිකිරීම. මෙයින් පාසල් 6 ක ඉදිකිරීම් කටයුතු නිමකර ඇති අතර පාසල් 5 ක ඉදිකිරීම් කටයුතු මෙම වසර ඇතුළත නිම කිරීමට බලාපොරොත්තු වේ. ප්‍රමාණයෙන් විශාල ඉතිරි පාසල් දෙකෙහි ඉදිකිරීම් කටයුතු 2008 වසරේදී නිම කිරීමට අපේක්ෂිතය.
- සියළු පොදු පහසුකම් වලින් සමන්විත වූ නිවාස 430 කින් යුතු ජපන්-ශ්‍රී ලංකා මිත්‍රත්ව ගම්මාන 2 ක් අම්පාර සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල ඉදිකිරීම
- දකුණු වෙරළබඩ ප්‍රදේශයේ අකුරල, ගෙයියාපන, සීනිගම. මාගාල්ල සහ වැලිගම පාලම් ප්‍රතිසංස්කරණය සහ නැගෙනහිර වෙරළ තීරයට වන්නට පිහිටි කෝමාරි, පෙරියකල්ලාර්, කොමයිකල්ලාර් වෙරළබඩ සපත්තු පාලම් ප්‍රතිසංස්කරණය සහ ත්‍රස්තවාදීන් විසින් විනාශයට පත් කළ පනිච්චන්කේනි පාලම වෙනුවෙන් තාවකාලික බේලි පාලමක් ලබාදීම

- රත්ගම. දික්වැල්ල. කොස්ගම. හික්කඩුව. අහංගම සහ කිරින්ද යන පොලිස් ස්ථාන ඉදිකිරීම හා පොලිස් ස්ථාන 79 ක් සඳහා සුනාමි අනතුරු ඇඟවීම් සඳහා ශබ්ද විකාශන යන්ත්‍ර ඇතුළුව ජීවිතාරක්ෂක උපකරණ ලබාදීම
- ගාළු ප්‍රදේශයට ජලය ගෙන යනු ලබන දියමං පාලම ප්‍රතිසංස්කරණය කිරීම සහ මඩකළපුව ප්‍රදේශයේ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ස්ථායිතා පොකුණක් ඉදිකිරීම.


ශ්‍රී සුමංගල විද්‍යාලය


ගාළු ධීවර වරාය


රත්ගම පොලිස් ස්ථානය

- ග්‍රාමීය හා පර්යන්ත රෝහල් 33 ක් සඳහා වෛද්‍ය උපකරණ ලබා දීම හා රෝගීන් පරීක්ෂා කිරීම සඳහා ජංගම පරීක්ෂණාගාර 5 ක් ලබාදීම
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල 64 ක් සඳහා ඩබල් කැබ් රථ ලබාදීම


ඉක්බාල් නගර් මිත්‍රත්ව ගම්මානය

## සුනාමි කඩිනම් ප්‍රතිසංස්කරණය ව්‍යාපෘතිය

පශ්චාත් සුනාමි හදිසි අවශ්‍යතා හා නැවත ප්‍රකෘතිතත්වයට ගෙන ඒමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා 2005 වසර ආරම්භයේදී ලෝක බැංකුව

විසින් ඇ. එ. ජ. ඩොලර් මිලියන 75 ක් ලබා දෙන ලදී. මීට අමතරව, එවකට ලෝක බැංකු ආධාර සහිතව දියත් වූ ව්‍යාපෘති වලින් ඩොලර් මිලියන 75 ක්ද සුනාමි ප්‍රතිසංස්කරණ වැඩසටහන සඳහා වෙන් කරන ලදී. මේ දක්වා පහත සඳහන් කටයුතු අවසාන කර ඇත.

- **ජීවනෝපාය මූල්‍ය දීමනාව** – සුනාමි ව්‍යසනයට ගොදුරු වූ පවුල් 419,000 කට පමණ මසකට රුපියල් 5000/- බැගින් වූ ජීවනෝපාය දීමනාවක් මාස හතරක් තිස්සේ ලබා දීම.
- **නිවාස පහසුකම්** – සුනාමියෙන් නිවාස හානි වූ පවුල් 43,400 කට නැවත නිවාස ඉදිකිරීම සඳහා මූල්‍ය ආධාර ලබා දීම. සම්පූර්ණයෙන් හානි වූ නිවසකට රු. 250,000/- ද අර්ධ වශයෙන් හානි වූ නිවසකට රු. 1000,000/- බැගින් ද ලබා දෙන ලදී.
- **මහාමාර්ග** – කිලෝ මීටර් 120 වූ කළුතර, මාතර අධිවේගී මාර්ගය 2007 ජූනි මස වන විට ප්‍රතිසංස්කරණය කර අවසන් කරන ලදී.
- **ශිෂ්‍යාධාර**– සුනාමියෙන් දෙමාපියන් අහිමි වූ විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් 48 දෙනෙක් සඳහා රු. 5000/- හෝ රු. 2500/- බැගින් ශිෂ්‍යාධාර සපයන ලදී.
- **සෞඛ්‍ය පහසුකම් හා සෞඛ්‍ය අධ්‍යාපන අංශයේ වැඩිදියුණු කිරීම**– රු. මිලියන 200ක් යොදවා සෞඛ්‍ය සැපයීම් අංශයේ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීමට කටයුතු කර ඇති අතර සුනාමියෙන් හානි වූවන් සඳහා හදිසි ඖෂධ සපයන ලදී.

## ලෝක බැංකු සුනාමි හදිසි ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ කළුතර – මාතර ප්‍රධාන මාර්ගය පුනරුත්ථාපනය කිරීම



**මතුපිට ආවරනය දැමීම අම්බලන්ගොඩ උනවටුන මාර්ගය**



**මාර්ගය සලකුනු කිරීම කළුතර අම්බලන්ගොඩ මාර්ගය**

සුනාමි ව්‍යසනයෙන් අලාභ හානි වූ ප්‍රධාන මංමාවත් අතරින් කොළඹ – මාතර මාර්ගයේ කළුතර – මාතර දක්වා වූ කොටස එක් මාර්ගයකි. එය බර මගී වාහන විශාල සංඛ්‍යාවක් සහ මාතර දක්වා තිබෙන ප්‍රධාන නගර වල, අතුරු මාර්ග වලින් පිවිසෙන කෘෂි නිෂ්පාදන, වන වගා ආශ්‍රිත ද්‍රව්‍ය, ඉදි කිරීම් ද්‍රව්‍ය හා නිෂ්පාදන භාණ්ඩ ප්‍රවාහනය කරනු ලබන වාණිජ වාහන සඳහා උපකාරී වන මූලික ක්‍රමවේද මාර්ගයකි. සමස්ත පිරිවැය ඇ.ඩො. මිලියන 35ක් වන මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය සම්පාදනය කරනුයේ ලෝක බැංකුව විසිනි.




*මාර්ගය සලකුනු කිරීම - උනවටුන මාතර මාර්ගය*

එයින් 40% ක් ප්‍රදාන වශයෙන්ද ශේෂය වන 60% ණය මුදලක් වශයෙන්ද ලබා දෙයි. ව්‍යාපෘතියට අදාල වන මාර්ගය දකුණු කළුතර පිහිටි කිලෝ මීටර් 46.5 සලකුනින් ආරම්භ වන අතර මාතර නගරයට යාබද කිලෝ මීටර් 161.5 සලකුන් අවසන් වනු ඇත. කළුතර - මාතර මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු සාර්ථකව අවසන් කර මාර්ග සංවර්ධන අධිකාරියට පවරා ඇත.

## සුනාමි ව්‍යසනයෙන් හානියට පත් ධීවර වරායන් ප්‍රතිසංස්කරණය – ඇ.ඩො මිලියන 9ක(ප්‍රදාන)

සුනාමි ව්‍යසනයෙන් හානියට පත් කුඩාවැල්ල, බේරුවල සහ පානදුර ධීවර වරායන් ප්‍රතිසංස්කරණය සහ අයිස් සෑදීමේ යන්ත්‍රාගාරයක්, ශීතාගාර, ඉන්ධන රැස්කිරීමේ බංකර පහසුකම්, ධීවරයන්ට නේවාසිකාගාර පහසුකම්, බෝට්ටු හා එන්ජින් අළුත්වැඩියා කිරීමේ වැඩපොලක්, බෝට්ටු ගොඩට ගැනීමේ මාර්ගයන් සහ මත්ස්‍ය වෙන්දේසි ශාලාවක් සහිත වෙරළ පහසුකම් සැපයිම සඳහා චීන රජය විසින් ඇ.ඩො මිලියන 9ක ප්‍රදානයක් සපයා ඇත.

මෙම ධීවර වරායන් තුනේ ප්‍රතිසංස්කරණ වැඩ කටයුතු 2006 වර්ෂයේදී ආරම්භ වු අතර පානදුර ධීවර වරායේ ප්‍රතිසංස්කරණ වැඩ කටයුතු බොහෝ දුරට අවසන්ව ඇති අතර, කුඩාවැල්ල හා බේරුවල ධීවර වරායන්හි ප්‍රතිසංස්කරණ වැඩ කටයුතු 2007 වසර අවසාන වන විට නිම කිරීමට අපේක්ෂිතය.



ප්‍රතිසංස්කරණය කරන ලද පානදුර ධීවර වරාය

## ත්‍රිකුණාමලය ඒකාබද්ධ යටිතල පහසුකම් ව්‍යාපෘතිය (TIIP)

ප්‍රංශ රජය මගින් සුනාමි ව්‍යසනයෙන් හානියටපත් ප්‍රදේශ යථා තත්වයට ගෙන ඒම සඳහා ලබා දෙන ආධාර යටතේ ශ්‍රී ලංකා රජයට පිරිනමන ලද යූරෝ මිලියන 64 ක (රු. මිලියන 7680) සහන ණය මුදලකින් මෙම ව්‍යාපෘතිය මූල්‍යනය කෙරේ. උපායමාර්ගිකව සුවිශේෂ තැනක් උසුලන ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘතිය ඒකාබද්ධ ප්‍රවේශයයක් උපයෝගීකරගෙන ඇත. ව්‍යාපෘතියට; මාර්ග හා පාලම් පුනරුත්ථාපනය/ප්‍රතිසංස්කරණය (යූරෝ මිලියන 40.3), ජල සම්පාදන ජාලය වැඩිදියුණු කිරීම (යූරෝ මිලියන 10.3), විදුලි බල සම්පාදනය වැඩිදියුණු කිරීම (යූරෝ මිලියන 2.1) සහ ප්‍රජා සංවර්ධනය (යූරෝ මිලියන 11.3) යන සංරචක අයත් වේ.

ඒ 15 මාර්ගයේ තිරුක්කොන්ඩයිමඩු සිට ත්‍රිකුණාමලය දක්වා කිලෝ මීටර් 135 ක් පුනරුත්ථාපනය කිරීම සහ එම මාර්ගයේ කයන්කර්නි, කිළිවෙඩ්ඩි, ගංගෙයි හා උප්පාරු යන පාලම් ප්‍රතිසංස්කරණය කිරීම අරභයා මෙම ව්‍යාපෘතිය මගින් අරමුදල් සම්පාදනය කෙරේ. තවද කන්තලේ සිට මඩකලපුව - ත්‍රිකුණාමලය මාර්ගය සම්බන්ධ කෙරෙන ප්‍රධාන මාර්ගය වන අල්ල කන්තලේ මාර්ගය පුනරුත්ථාපනය කිරීම සඳහාද අරමුදල් ලබා දෙනු ලැබේ.

ව්‍යාපෘතිය මගින් ජල සම්පාදන ජාලය වැඩි දියුණු කිරීම සඳහා වන අරමුදල් යටතේ කන්තලේ පවිත්‍රාගාරයේ සිට ත්‍රිකුණාමලය දක්වා ප්‍රධාන ජල සම්ප්‍රේෂණ මාර්ගය ඉදි කෙරේ. ඊට අමතරව ඉච්චලනපත්තු සහ පුල්මුඩෙයි ජල සම්පාදන යෝජනා ක්‍රම සඳහාද මුදල් ලබා දෙනු ලැබේ. ත්‍රිකුණාමලය, කින්නියා, මූතූර් හා පුල්මුඩෙයි තිරියාය සම්බන්ධ කෙරෙන ප්‍රධාන විදුලි බල සම්ප්‍රේෂණ මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු මේ වන විට ව්‍යාපෘතිය මගින් අරඹා ඇත. මාර්ග, විදුලි බල හා ජල සම්පාදන ක්ෂෙත්‍රයේ දැවැන්ත පුනරුත්ථාපන වලට පරිපූරකව, දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රජා සංවර්ධනය සඳහා පාසැල් ගොඩනැගිලි, ග්‍රාමීය රෝහල්, සී සහ ඩී පන්තියේ මාර්ග, පොදු වෙළඳපළවල් යනාදිය ද ඉදි කෙරේ.

ව්‍යාපෘතිය මගින් මහා පරිමාණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම තුළින්, දිස්ත්‍රික්කයේ පෞද්ගලික අංශයේ සංවර්ධනයට මෙන්ම එහි නිෂ්පාදන සඳහා වන වෙළඳ පළ පුළුල් වීමට ද මං සැළසෙනු ඇත. ජල සම්පාදනය, විදුලිබලය හා ග්‍රාමීය මට්ටමේ පහසුකම් වැඩි දියුණු කිරීම මගින් දිස්ත්‍රික්කයේ ජන ජීවිතයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීමට අවකාශ සැලසේ. ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචකයන් සඳහා ටෙන්ඩර් දියත් කර ඇති අතර, වසර අවසානයේදී සිවිල් වැඩ ආරම්භ කිරීමට අපේක්ෂිතය.

## සුනාමි ව්‍යසනයෙන් හානියට පත් ප්‍රදේශයන්හි තෘතිය අධ්‍යාපන කටයුතු හා පරිපාලන කටයුතු සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය සඳහා අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවෙට් අරමුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 20 ක් සහනදායි ණය මුදලක් ලබා දි ඇත .සුනාමි ව්‍යසනයෙන් හානියට පත් උතුරු නැගෙනහිර හා දකුණු ප්‍රදේශයන්හි තෘතිය අධ්‍යාපන කටයුතු හා පරිපාලන කටයුතු සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ.

මෙම ව්‍යාපෘතිය මගින් (අ) යාපනය, ගාල්ල, ලබුදුව, අම්පාර සහ ත්‍රිකුණාමලය යන ප්‍රදේශයන්හි පිහිටි උසස් තාක්ෂණ ආයතනවල ඉදිකිරිම් කටයුතු සහ ඒවාට අවශ්‍ය උපකරණ සැපයීම (ආ) යාපනය විශ්ව විද්‍යාලයේ හා රුහුනු විශ්ව විද්‍යාලයට අයත් ගාලු සරසවියේ පිහිටි වෛද්‍ය පීඨවල ශිෂ්‍ය නේවාසික පහසුකම් සැපයිම (ඇ) මිලුවිල්හි පිහිටි අග්නිදිග විශ්ව විද්‍යාලයේ හා මඩකලපුව නැගෙනහිර විශ්ව විද්‍යාලයේ පිහිටි තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන වල ඉදි කිරිම් කටයුතු සහ ඒවාට අවශ්‍ය උපකරණ සැපයීමත් හා සුනාමි ව්‍යසනයෙන් හානියට පත් දිස්ත්‍රික්ක 13 ට අයත් කොට්ඨාශ 57 ක පිහිටි ප්‍රාදේශිය පරිපාලන කාර්යාලයන්හි ඉදි කිරිම් කටයුතු හා ඒවාට අවශ්‍ය උපකරණ සපයාදීමත් සිදු කරනු ලැබේ.



ඉදිකරමින් පවතින දේශන ශාලා ගොඩනැගිල්ල අම්පාර උසස් තාක්ෂණ ආයතනය

## සුනාමියෙන් අලාභ හානි වූ නැගෙනහිර ප්‍රදේශයේ පාලම් 4 ක් ඉදිකිරීම

B - 424 ත්‍රිකුණාමලය - පුල්මුඩෙයි මාර්ගයේ සුනාමියෙන් හානියටපත් වූ ඉරක්කණ්ඩි, පුදුවකට්ටු යාන්මය සහ මඩ්ඩිමාවඩ්ඩි පාලම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ස්පාඤ්ඤ රජය මගින් ඉතාමත් සහනදායි කොන්දේසි මත යූරෝ මිලියන 21 (රු. මිලියන 2847) ක ණය මුදලක් ලබා දී ඇත.

පාලම් 4 සිවිල් වැඩ දැනටමත් ආරම්භ කර ඇති අතර, 2008 වසරේදී නිමාවට පත් කිරීමට අපේක්ෂිතය. ව්‍යාපෘතිය සම්පූර්ණ වූ විට ජනතාවගේ ප්‍රවාහන පහසුකම් හා ප්‍රවාහන හැකියාව ද වැඩි දියුණු කෙරෙ.



## ධීවර වරාය උත්ශ්‍රේණිගත කිරීම

ඇමෙරිකා එක්සත් ජනපද රජය ස්වකීය සුනාමි සහන හා පුනරුත්ථාපන වැඩසටහන යටතේ ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ එක්සත් ජනපද නියෝජ්‍යායතනය (USAID) මගින් මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රදාන ලබා දෙනු ඇත. දකුණු පළාතේ හික්කඩුව, මිරිස්ස හා පුරාණ වැල්ල (දෙවුන්දර) ධීවර කර්මාන්තයට ආධාර පිණිස පහසුකම් අළුත්වැඩියා කිරීම හා වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියට අයත් වේ. ව්‍යාපෘතියෙහි වෙරළ කළමනාකරණ සංරක්ෂකය යටතේ මත්ස්‍යයයින් ඇල්ලූ පසු සකස්

කිරීමේ ක්‍රියාවලියට මෙන්ම වරාය සේවා වැඩි දියුණු කිරීමට සහ පිරිවැය නැවත ලබා ගැනීම සඳහා තාක්ෂණික ආධාර සැපයේ. මෙම වරායන් තුන සඳහා නිර්මාණය කරන ලද ප්‍රධාන සැලැස්ම මගින් ඉංජිනේරුමය නිර්මාණයට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. දියකඩන අළුත්වැඩියා කිරීම, හාරා පස් ගොඩ දැමීම, නාවික ආධාරක සැපයීම සහ ධීවර ප්‍රජාව සඳහා අවශ්‍ය ජල සම්පාදනය හා සනීපාරක්ෂක පහසුකම් මෙම ඉදිකිරීම් වලට ඇතුලත් වේ. වරායේ භෞතිකමය යටිතල පහසුකම් ඉදිකිරීම් නිමකර ඇති අතර හාරා ගොඩ දැමීම (dredging) කෙරෙමින් පවතින අතර 2008 වසරේ මැද භාගය වන විට ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට නියතය.



වරාය හාරා පස් ගොඩ දැමීම

**පශ්චාත් සුනාමි ණය මාලාව – යුරෝපීය ආයෝජන බැංකුව**

සුනාමියෙන් හානියට පත් පෞද්ගලික ව්‍යවසායන් ප්‍රතිසංස්කරණය සහ නැවත ඉදි කිරීම සඳහා යුරෝපීය ආයෝජන බැංකුව යූරෝ මිලියන 70ක සහන ණය මාලාවක් ලබා දී ඇත. සුනාමි විපතින් ඍජු ලෙස හෝ වක්‍රාකාරයෙන් හානියට පත් ව්‍යාපාර වලට අයත් ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර, යන්ත්‍රෝපකරණ සහ උපකරණ වැනි ප්‍රාග්ධන වත්කම් සඳහා මූල්‍යකරණ පහසුකම් සැලසීමට මෙම ණය මුදල යොදවනු ලබයි. මෙයින් යූරෝ මිලියන 20 ක් සුනාමි ව්‍යසනය මගින් ඍජු ලෙස හානියට පත් ව්‍යාපාර සඳහා වන අතර එය ශ්‍රී ලංකා මහ බැංකුව මගින් දැනට ක්‍රියාත්මක කරනු ලබන "සුසහන" ණය සහන යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභීන් හට ලබාදෙයි. ඉතිරි යූරෝ මිලියන 50 සුනාමි ව්‍යසනය මගින් ඍජු ලෙස හෝ වක්‍රාකාරයෙන් හානියට පත් ව්‍යවසායන් සඳහා බැංකු පද්ධතිය හරහා ලබාදෙයි. ඩී. එෆ්. සී. සී. බැංකුව මෙම ණය මුදලේ පරිපාලක ඒකකය වශයෙන් කටයුතු කරනු ලබයි.

ඔක්තෝබර් වන විට මෙම ණය මාලාවෙන් 20% ක ප්‍රමාණයක් වැයයෝජනය කර ඇත. සුනාමි ව්‍යසනය මගින් ඍජු ලෙස හානියට පත් හෝටල්, ආපන ශාලා, තොග හා සිල්ලර වෙළඳාම, රෝහලක් සහ නිෂ්පාදන කටයුතු වල නිරත ව්‍යවසායන් මේ වන විට ප්‍රතිලාභ ගබා ඇත. එමෙන්ම දෙවන වර්ගය යටතේ හෝටල සහ නිෂ්පාදන කටයුතු වල නිරත ව්‍යවසායන් මෙම ණය මාලාව යටතේ ණය ලබා ගෙන ඇත.

# 2.6

# වෙනත් අංශ

## විද්‍යා, තාක්ෂණික, පර්යේෂණ සහ සංවර්ධනය

## 2.6.1 විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ හා සංවර්ධනය

විද්‍යාව හා තාක්ෂණය, මානව සමාජයේ ආර්ථික සංවර්ධනය හා සුභසාධනයෙහි ලා සුවිශේෂී කාර්යයක් උසුලන ජාතික සංවර්ධනයෙහි වැදගත්ම සංරචකයක් වශයෙන් රජය හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා වැය කෙරෙන දළ දේශීය වියදම, දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 0.2 වශයෙන් ඇස්තමේන්තු ගතකර ඇති අතර ඉන්දියාවට හා ඇතැම් නැගෙනහිර රටවලට පිටුපසින් සිටී. එමෙන්ම විද්‍යා හා තාක්ෂණ අංශයේ වර්ධනය සාපේක්ෂව එය අඩු මට්ටමක පවතින අතර, එය පසුගිය දස වසර තුල එම තත්ත්වයේ වෙනසක් සිදුවී නොමැත.

2017 වසර වනවිට දැනුම හා විද්‍යාව පාදක කරගත් නව සංවර්ධිත රටක තත්ත්වයට ලඟා වීමේ අවශ්‍යතාවය, ශ්‍රී ලංකාවේ "ඉදිරි දැක්ම" තුලින් හඳුනාගෙන ඇත. වර්ධනය කරන ලද පරිගණක සාක්ෂරතාවය හා විද්‍යා පිළිබඳ අධ්‍යයනය තුලින් දිළිඳුකම පිටු දැකීමත්, විද්‍යා හා තාක්ෂන දියුණුවේ ප්‍රතිලාභ ඵලදායී ලෙස බිම් මට්ටමේ සමාජ කොටස් දක්වා ගෙන යාමේ අවශ්‍යතාවත් එමඟින් හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල වල පර්යේෂන ධාරිතාව ඉහල නංවාලීම සඳහා ස්වීඩන් රජය විසින් ඇ.ඩො. මිලියන 13 ක ප්‍රමාණයක් ලබා දීමට එකඟතාවය පලකරන ලදී. ව්‍යාපාතිය යටතේ දෙනු බලන ආධාර උපයෝගී කර ගනිමින් පර්යේෂණ කළමනාකරණය සඳහා ව්‍යුහ සකස් කිරීම, ශ්‍රී ලංකාව හා ස්වීඩනය තුල විශ්ව විද්‍යාල අතර සහයෝගීතාවය වර්ධනය කිරීම හා පර්යේෂණ සහයෝගීතා තුල පුහුණ වීම් ලබා දීම මඟින් ශ්‍රී ජයවර්ධනපුර, පේරාදෙණිය, රුහුණ, යාපනය සහ ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ ධාරිතාව ඉහල නැංවීම පහසු කෙරේ.

# වෙනත් අංශ



## කලා සංස්කෘතික, ආගමික සහ සංචාරක

## 2.6.2. කලා, සංස්කෘතික, ආගමික සහ සංචාරක

ඓතිහාසික උරුම භූමිභාග සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීමේ සහ ඓතිහාසික උරුම භූමිභාගයන් ප්‍රචලිත කිරීමේ රජයේ පරමාර්ථය වන්නේ සංස්කෘතික උරුම අත්දැකීම් පිළිබඳ දැනුවත් කිරීම, ප්‍රවර්ධනය කිරීම හා ශ්‍රී ලංකාව දකුණු ආසියාකරයේ ඉදිරියෙන් පෙරටුවට යන්නෙකු මෙන්ම විවේක සුවය ගත කිරීමේ ගමනාන්තයක් බවට පත් කිරීමය.

සංචාරක ව්‍යාපාරය විදේශ විනිමය ඉපයීම්, රැකියා අවස්ථාවන් ජනනය කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය, ප්‍රදේශීය සංවර්ධනය සහ ග්‍රාමීය දරිද්‍රතාවය පිටුදැක්ම සඳහා විවිධ ප්‍රතිලාභ ලැබෙන සිඝ්‍රයෙන් නැගී එන එලදායි අංශයක් ලෙස සළකා සියළුම රජයන් විසින් ඒ සඳහා ඉහල ප්‍රමුඛතාවය ලබා දී ඇත.

ජපාන රජය, චීන රජය මෙන්ම නෙදර්ලන්ත රජය සීගිරියේ නව පුරාවිද්‍යා කෞතුකාගාරයක් ඉදිකිරීමට ද, කොළඹ ජාතික කලාගාරයක් ඉදිකිරීමට ද, දකුණු පළාතේ සංස්කෘතික උරුම භූමිභාග සංරක්ෂණය කිරීමට ද තාක්ෂණ හා මූල්‍යාධාර සපයමින් ශ්‍රී ලංකවේ සංස්කෘතික උරුමය වැඩිදියුණු කිරීමට නොමසුරු සහයෝගය ලබා දී ඇත.

## සංචාරක ක්ෂේත්‍රයේ පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ සංවර්ධනය උදෙසා ජපන් රජය විසින් ඇ. ඩො. මිලියන 23 ක (යෙන් මිලියන 2,604) ණය ආධාරයක් ලබා දී ඇත.

විදේශීය සංචාරකයින්ව ප්‍රවර්ධනය කිරීම මගින් විදේශ විනිමය ඉපයීම් ඉහළ නැංවීම හා රැකියා අවස්ථා බිහි කිරීම සඳහා කොළඹ, මහනුවර, මීගමුව, සීගිරිය, අනුරාධපුර සහ නුවරඑළිය යන ප්‍රදේශවල සංචාරක කටයුතු සඳහා අවැසි යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට මෙමගින් බලාපොරොත්තු වේ. තවද ශ්‍රී ලංකාව සංචාරකයින්ගේ ආකර්ෂණීය ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා අලෙවිකරණ හා ප්‍රවර්ධන කටයුතු ජපානය තුළ ක්‍රියාත්මක කිරීම ද මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂිතය.

ව්‍යාපෘතිය යටතේ අනුරාධපුර නගරයේ මහමෙවුනා උයන වටරවුම් මාර්ගය ප්‍රතිසංස්කරණය හා මල්වතු ඔය පෙදෙස අලංකරණය කිරීම ද, සීගිරිය පුරාවිද්‍යා වැඩබිම වැඩි දියුණු කිරීම හා ඉනාමලුව - සීගිරිය පාර සහ කිලෝ මීටර 7 කණුව - මහනාගපුර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම ද, මීගමුව නගරයේ හැමිල්ටන් ඇල ප්‍රතිසංස්කරණය, නගර අලංකරණය හා මීගමුව කුට්ටිදූව ධීවර අලෙවි මධ්‍යස්ථානය (ලෙල්ලම) සංවර්ධනය කිරීම ද, නුවරඑළිය ග්‍රෙගරි වැව හා විකටෝරියා උද්‍යානය වැඩි දියුණු කිරීම ද, කොළඹ හෝටල් පාසල සඳහා උපකරණ සැපයීම මෙන්ම නුවර හෝටල් පාසල සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා අවශ්‍ය උපකරණ සැපයීම ද බලාපොරොත්තු වේ.

ව්‍යාපෘතියේ මූලික වැඩ කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇති අතර ප්‍රධාන ඉදිකිරීම් කටයුතු 2008 වසරේදී ඉටු කිරීමට බලාපොරොත්තු වේ.

## සීගිරිය නව පුරා විද්‍යා උරුම කෞතුකාගාරය ප්‍රවර්ධනය කිරීම

සංස්කෘතික උරුම අත්දැකීම් පිළිබඳ දැනුවත් කිරීම සඳහා ඵලදායි අධ්‍යාපන මෙවලක් වශයෙන් ක්‍රියා කිරීම හා පර්යේෂණ කාර්යයන් ඉටුකිරීම සඳහා ඉඩකඩ සපයාදීම පිණිස, ලෝක උරුමයක් වශයෙන් ප්‍රකාශිත සීගිරියේ නව පුරා විද්‍යා උරුම කෞතුකාගාරයක් ඉදිකිරීම සඳහා ජපන් රජයේ 2KR මූල්‍යයන යෝජනා ක්‍රමය (කෙනඩි දෙවන වටය) යටතේ ඇ. ඩො. මිලියන 2 ක පමණ ප්‍රදානයක් ලබා දී ඇත. මෙම කෞතුකාගාරයේ ඉදිකිරීම් කටයුතු ලාංකීය ඉදිකිරීම් සමාගමකින් සිදු කරනු ලබන අතර, එහි ඉදිකිරීමේ කටයුතු 2008 මාර්තු මස අවසන් වන විට නිම කිරීමට බලාපොරොත්තු වේ.

මෙයට අමතරව, ලෝක උරුමයක් ලෙස ප්‍රකාශිත සීගිරියේ ඉදි කරනු ලබන නව පුරා විද්‍යා උරුම කෞතුකාගාරයට අවැසි අත්‍යවශ්‍ය ප්‍රදර්ශන උපකරණ සැපයීම සඳහා ඇ. ඩො. මිලියන 1.4 ක ආධාර ප්‍රදානයක් ජපන් සංස්කෘතික ප්‍රදාන ආධාර වැඩ සටහන යටතේ ලබා දී ඇත.



මේ යටතේ ස්ථාපනය කරනු ලබන නවීන ප්‍රති නිර්මාණ හා ප්‍රදර්ශන උපකරණ ආශ්‍රයෙන් කෞතුකාගාරය නැරඹීමට පැමිණෙන නරඹන්නන්ට තොරතුරු සැපයීම මෙන්ම හතරවන ශත වර්ෂය තරම් පැරණි වූ සීගිරි සිහිවටනයන්හි වල අද්විතීය පුරා විද්‍යාත්මක හා සංස්කෘතික වැදගත්කම පිළිබඳ අර්ථකථනයක් ලබා දීම පහසුවනු ඇත. තවද, දීර්ඝ කාලයක සිට පුරා විද්‍යා වැඩ බිමේ සිදු කරන ලද කැනීම් වලදී මතු වූ පුරා විද්‍යාත්මක සිහිවටන හා දත්තයන් ප්‍රදර්ශයනය කිරීමටද, මෙමගින් අවස්ථාව උදා වේ. ජපන් රජයේ ආධාර ඇතිව දැනට ඉදිවෙන සීගිරිය පුරා විද්‍යා උරුම කෞතුකාගාරයේ වැඩ කටයුතු වලට අනුකූල වන පරිදි කෞතුකාගාරයේ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා මෙම ප්‍රදාන ආධාරය ලබා දී ඇත.

සීගිරිය උරුමය සංකීර්ණයේ වැදගත්කම ගැන සලකා, එකී සංකීර්ණයට පිවිසුම් මාර්ගය, සීගිරි බිතු සිතුවම් ආලින්දය හා එහි පිවිසුම් මාර්ගය සහ නැරඹුම් වේදිකාව මෙන්ම, සීගිරි ගල මුදුන දක්වා දිවෙන යකඩ පිය ගැටපෙළ වැඩි දියුණු කිරීමට ද, අමුත්තන් සඳහා පහසුකම් හා ආරක්ෂණ පහසුකම් ඉදි කිරීමට ද, සංකීර්ණයේ බිම් දසුන් සැකසීමට ද, සංචාරක සම්පත් ප්‍රවර්ධන ව්‍යාපෘතිය යටතේ ජපන් රජය වෙතින් දැනටමත් මූල්‍යාධාර ලබා දී ඇත.

සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ජපන් ප්‍රතිපාර්ශවීය උපදේශකවරුන් සමග සමීප සහයෝගීතාවයෙන් යුතුව මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ඇත.

## ජාතික රංග කලායතන ව්‍යාපෘතිය

ආසන 1200කින් යුත් සියළුම පහසුකම් වලින් සමන්විත නවීන මාදිලියේ රංග කලායතනයක් ඉදිකිරීම ව්‍යාපෘතියේ පරමාර්ථය වේ. මීට අමතරව ශිල්පීන් සඳහා විවේකාගාරයක්, භෝජනාගාරයක් සහ වාහන

නැවැත්වීමේ පහසුකම් සහිත මෙම ව්‍යාපෘතිය නොමැඩිස් පිටියේ ස්ථාපනය කිරීමට නියමිතය. ව්‍යාපෘතියේ මුළු බිම් ප්‍රමාණය වර්ග මීටර් 14000 ක් පමණ වේ. මෙම ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා චීන රජය විසින් ඇමරිකානු ඩොලර් මිලියන 10 ක පොලී රහිත ණයක් සහ ඇ. ඩො. මිලියන 7 ක ප්‍රදානයක් ලබාදී ඇත. ශ්‍රී ලංකා රජයේ එකඟත්වය ඇතිව චීනයේ ගෘහ නිර්මාණ සැලසුම් ආයතනය (Beijing Institute of Architectural Design) විසින් ව්‍යාපෘතියේ ඉදිකිරීම් සැලැස්ම නිම කර 2007 අගෝස්තු මස චීන වෙළඳ අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. ඒ අනුව චීන වෙළඳ අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතිය ඉදිකිරීමට සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමට අවශ්‍ය කටයුතු දැනටමත් කරමින් පවතින අතර ඉදි කිරීම් කටයුතු 2007 වසර අවසන් වීමට ප්‍රථම ආරම්භ කිරීමට නියමිතය.

## ශ්‍රී ලංකා නෙදර්ලන්ත සංස්කෘතික සහයෝගිතා වැඩසටහන

ශ්‍රී ලංකා නෙදර්ලන්ත සංස්කෘතික සහයෝගීතා වැඩසටහන නෙදර්ලන්ත රජයෙන් ලැබී ඇති රුපියල් මිළියන 702 ක විදේශ ආධාර මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ. දකුණු පළාතේ ඓතිහාසික වටිනාකමකින් යුක්ත ස්ථාන සංරක්ෂණය හා සංවර්ධනය කර අනාගත පරපුර සඳහා දයාද කිරීම වැඩ සටහනෙහි අරමුණ වේ. 2006 වර්ෂයේ අරම්භ කරන ලද මෙම වැඩසටහන යටතේ ව්‍යාපෘති 18 ක් ක්‍රියාත්මක වන අතර ලන්දේසී පාලන සමයේ ඉදිකරන ලද පැරණි ගාලු ගබඩාව සංරක්ෂණය සහ අමුත්තන් සඳහා තොරතුරු මධ්‍යස්ථානයක් ඉදිකිරීම, ගාල්ල පැරණි කොටු පවුර සංරක්ෂණය, ගාලු කොටුවේ පැරණි යටි කාණු පද්ධතිය නැවත ස්ථාපිත කිරීම, ගාලු කොටුවේ පැරණි පෞද්ගලික නිවාස සංරක්ෂණය, ගාල්ලේ ඇවොන්ඩස්ටර් ගැලරිය ඇතුළු කෞතුකාගාර සංකීර්ණයේ ඉතිරි කොටස් ඉදිකිරීම, මාතර තාරකා කොටුව සංරක්ෂණය කිරීම, මාතර ලන්දේසි පල්ලිය සංරක්ෂණය කිරීම, පැරණි ඌරු බොක්ක වේල්ල සංවර්ධනය කිරීම සහ කටුවන ලන්දේසි කොටුව සංරක්ෂණය ඒ අතරින් ප්‍රධාන වේ. තවද, කතරගම කෞතුකාගාරයක් හා තොරතුරු මධ්‍යස්ථානයක් ඉදි කිරීම හා මධ්‍යම සංස්කෘතික අරමුදලට මූල්‍යාධාර ලබා දීම ද සිදුකෙරේ. ව්‍යාපෘතියේ සංරක්ෂණ කටයුතු කොටසක් මෙම වර්ෂයේ අවසාන වන විට සම්පූර්ණ කෙරෙන අතර සියළුම සංරක්ෂණ හා ඉදිකිරීම් කටයුතු 2009 වර්ෂයේදී අවසන්වීමට නියමිතය.





## සාමයේ ප්‍රති ලාභ ඇති කිරීම සඳහා වූ ව්‍යාපෘතිය – ලෝක ආහාර වැඩ සටහන

යුද්ධයෙන් සහ සුනාමි ව්‍යසනයෙන් හානියට පත් වූ ප්‍රදේශ වල අවතැන් වූ ජනතාවගේ ආහාර සුරක්ෂිත භාවය වර්ධනය කිරීම සඳහා රජය දරන ප්‍රයත්නය උර දීමක් වශයෙන් මෙම ව්‍යාපෘතිය 2005 දි ආරම්භ කල අතර 2007 දි නිම කිරීමට අපේක්ෂිතය. මෙම ව්‍යාපෘතිය සඳහා ලෝක ආහාර වැඩ සටහන ඇමෙරිකානු ඩොලර් මිලියන 45 ක් වැය කිරීමට අපේක්ෂිතය. මේමගින් අම්පාර, මඩකලපුව, ගාල්ල, හම්බන්තොට, යාපනය, කිලිනොච්චි, මන්නාරම, මාතර, මුලතිවු,ත්‍රිකුණාමලය, අනුරාධපුර, මොනරාගල, පුත්තලම සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක වල ජිවත් වන 1,109,000 ජනතාවට මෙම ගින් සෙත සැලසේ. එසේම ලෝක ආහාර වැඩ සටහන මෙම ව්‍යාපෘතිය 2008 දක්වා දිර්ඝ කිරීමටද අපේක්ෂිතය.



අවතැන් වූ ජනතාව සඳහා ලෝක ආහාර බෙදා දිම

## යුනිසෙෆ් ශ්‍රී ලංකා ඒකාබද්ධ වැඩ සටහන 2007

2000 - 2006 යුනිසෙෆ් ශ්‍රී ලංකා ඒකාබද්ධ වැඩ සටහන 2006 වසරේදී අවසන් වූ අතර නව වැඩ සටහන 2008 - 2012 යුනිසෙෆ් ශ්‍රී ලංකා ඒකාබද්ධ වැඩ සටහන වශයෙන් 2008 වසරේ දි ආරම්භ කිරීමට නියමිතය. එම වැඩසටහනින් ආවරනය නොවූ 2007 වසර සඳහා යුනිසෙෆ් ශ්‍රී ලංකා ඒකාබද්ධ වැඩ සටහන 2007 වසරේදී ක්‍රියාත්මක වේ. මෙම වැඩ සටහන යටතේ ප්‍රධාන උප වැඩ සටහන් හතරක් ක්‍රියාත්මක වේ. එනම් පූර්ව ළමා සංවර්ධනය, ළමා සුරැකිම වැඩ සටහන, ළමා අධ්‍යාපන වැඩ සටහන, ජලය සනීපාරක්ෂිත සේවා වැඩ සටහන වේ. මේ සඳහා යුනිසෙෆ් ආයතනය ඇමෙරිකානු ඩොලර් මිලියන 11.8 ක මුදලක් වැය කිරීමට අපේක්ෂිතය. මෙම වැඩ සටහන අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය, ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශ, ජාතිය ගොඩ නැගිමේ හා වතු යටි තල පහසුකම් අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වේ.




යුනිසෙෆ් අධ්‍යාපන වැඩසටහන